# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2013



කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் வணிக அமைச்சு

Ministry of Industry & Commerce

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2013

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

# මහින්ද චින්තන ඉදිරි දැක්ම



*වාණිජ සේවාවන් සපයන ජාත්‍යන්තර බැංකු ගනුදෙනු සිදුකරන ජාත්‍යන්තර ආයෝජන සිදුකරන ආසියවේ ප්‍රබලතම වාණිජ මධ්‍යස්ථානය බවට ශ්‍රී ලංකාව පත්කිරීම මාගේ අරමුණයි.*

*(මහින්ද චින්තන : 14 පිටුව)*

# නායකත්වය සහ මගපෙන්වීම



**ගරු. රිෂාඩ් බදියුදීන්**
**අමාත්‍ය**
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය



**ගරු. ලක්ෂ්මන් වසන්ත පෙරේරා**
**නියෝජ්‍ය අමාත්‍ය**
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය



**අනුර සිරිවර්ධන**
**ලේකම්**
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

# පෙරවදන

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2013 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2002 සැප්තැම්බර් 12 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ මුල් කොටසින් අමාත්‍යාංශයේ කර්මාන්ත අංශය යටතේ ඇති ආයතන සහ අංශ වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල කාර්යසාධනය පිළිබඳව විස්තර කර ඇත. අමාත්‍යාංශයේ, වාණිජ අංශය යටතේ ඇති ආයතන වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල කාර්ය සාධනය මෙම වාර්තාවේ දෙවෙනි කොටසින් දක්වා ඇත.

අමාත්‍යාංශයේ පොදු තොරතුරු සහ 2013 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය අවසන් වශයෙන් සවිස්තරාත්මකව දක්වා ඇත.

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

## දැක්ම

*“සවිමත් වාණිජමය පරිසරයක් තුළින් ජාත්‍යන්තර තරගකාරී දේශීය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැගීම”*

## මෙහෙවර

*“ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන්නාවූද, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහි කරන්නාවූ, සවිමත් වාණිජ අංශයකින් සමන්විතවූද, ධරණීය හා තරගකාරීත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි අභිවෘද්ධිය සඳහා හිතකාමී වන පරිසරයක් නිර්මාණය කිරීම”*

## මූලික අභිමතාර්ථයන්

- *දැනුම මත පදනම් වූ නිෂ්පාදන කර්මාන්ත අංශයක් බිහිකිරීම*
- *අගය එකතු කළ අපනයනයන් සංවර්ධනය හා ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම ඉහල නැංවීම*
- *හිතකර වාණිජමය පරිසරයක් ඇති කිරීම*

# අමාත්‍යාංශයේ විෂයපථය

2010.11.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට පවරා ඇති විෂයපථය පහත පරිදි වේ.

1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කර්මාන්ත හා වාණිජ විෂයන්ට හා සමගාමීව දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
2. අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමඟ එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙය වීම.
3. අමාත්‍යාංශ විෂයපථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරිම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරිම.
5. බුද්ධිමය දේපල පිළිබඳව ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි (WIPO) ප්‍රකාශන අයිතිය
6. අපනයන සංවර්ධන හා උපදේශන සේවා
7. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා
8. විදේශයන්හි ශ්‍රී ලංකා වෙළඳ කටයුතු නියෝජනය
9. තරඟකාරීත්ව පිළිවෙත
10. කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ ආයතන

## කර්මාන්ත අංශය

කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

කර්මාන්ත සංවර්ධන අංශය

සංවර්ධන අංශ I

සංවර්ධන අංශ II

සංවර්ධන අංශ III

කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහ කළමනාකරණ තොරතුරු අංශය

ඵලදායිතා වර්ධන අංශය

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

පේෂකර්මාන්ත සංවර්ධන අංශය

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

## වාණිජ අංශය

වාණිජ දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| **කර්මාන්ත අංශය** | |
| කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය | 01 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 03 |
| සංවර්ධන අංශ I | 06 |
| සංවර්ධන අංශ II | 07 |
| සංවර්ධන අංශ III | 09 |
| කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහ කළමනාකරණ තොරතුරු අංශය | 11 |
| ඵලදායීතා සංවර්ධන අංශය | 13 |
| රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 15 |
| සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය | 18 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 21 |
| මාන්තායි සෝල්ට් ලිමිටඩ් | 23 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 25 |
| පේෂකර්මාන්ත සංවර්ධන අංශය | 33 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 37 |
| ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 39 |
| **වාණිජ අංශය** | |
| වාණිජ දෙපාර්තමේන්තුව | 42 |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 55 |
| ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | 58 |
| අපනයන සංවර්ධන මණ්ඩලය | 62 |
| **අමාත්‍යාංශයේ පොදු තොරතුරු** | **81** |
| **මූල්‍ය ප්‍රගතිය** | **87** |

# කර්මාන්ත අංශය

# කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

## හැඳින්වීම

රටක කර්මාන්ත අංශයෙහි ස්ථාවරභාවය හා සංවර්ධනය කෙරෙහි එහි සාර්ව ආර්ථික පරිසරය සෘජු බලපෑමක් දක්වයි. එබැවින් දේශීය කර්මාන්තයන් හි වර්ධනයට උපකාරී වන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම මඟින් රටක දිගුකාලීන අරමුණු ලඟා කර ගැනීම සඳහා රජය විසින් දූරදර්ශී හා කාලීන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කල යුතු වේ.

එහිදී, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය, කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන පරිදි වෙළෙඳ හා තීරු බදු සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට දායක වේ.

## ජාත්‍යන්තර වෙළෙඳාම හා ආශ්‍රිත කටයුතු

නිදහස් වෙළෙඳ ගිවිසුම් තුලින් අපනයන උත්පාදන කර්මාන්ත සඳහා අපනයන අවස්ථා ලබා ගැනීමට දායක වීම හැරුණුකොට, දේශීය කර්මාන්තයන් හි සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා පියවර ගැනීම ද කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය වාණිජ දෙපාර්තමේන්තුව හා එක්ව සිදුකරනු ලැබේ.

## තීරු බදු ආශ්‍රිත කටයුතු

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කවුන්සිලය හා ශ්‍රී ලංකා රේගුව ආදියෙහි අදාල නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය තුලින් දේශීය කර්මාන්තකරුවන්ගේ තීරුබදු ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා මෙම අංශය සිය දායකත්වය දක්වයි.

## 2013 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

- මුදල් අමාත්‍යාංශය මඟින් කර්මාන්තකරුවන්ගේ විවිධ තීරුබදු ආශ්‍රිත ගැටළු විසඳීමට පසුගිය වසර තුල දී මෙම අංශය විසින් කටයුතු කර ඇත. ඉහත ගැටළු සම්බන්ධයෙන් මෙම අංශය මඟින් සිදු කල ඉල්ලීම් සැලකිල්ලට ගෙන දේශීය කර්මාන්තකරුවන් දිරිමත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා භාණ්ඩ රැසක සෙස් බදු හා අපනයන බදු වැඩි කිරීම හා වෙනස් කිරීම සිදුකරන ලදී.
- දේශීයව අගය එකතු කරන ලද වාහන සඳහා 2008 දී මුල් වරට නිෂ්පාදන බදු සහනය ලබාදීමෙන් පසු මේ වන විට වාහන නිෂ්පාදන සමාගම් 07ක් ඒ සඳහා අවතීරණ වී ඇත. 2008 වසරේ සිට මේ දක්වා වාහන මාදිලි 17 කට අයත් වාහන 6000 කට වඩා මෙම සමාගම් 07 මඟින් 30% කට ඉහල දේශීයව එකතු කල අගයක් සහිතව එකලස් කර ඇත.
- දේශීය කර්මාන්ත ප්‍රතිපත්තිය පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සහ ඔවුන් මුහුණ දෙන ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා 'දේශීය කර්මාන්ත සංවර්ධනය උදෙසා වන රාජ්‍ය උපාය මාර්ගය' මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පි.බි.ජයසුන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් හා දේශීය කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ වාණිජ මණ්ඩල සාමාජිකයන් ඇතුළු සියයකට ආසන්න

පිරිසකගේ සහභාගීත්වයෙන් ජූලි මස 16 වැනිදා අමාත්‍යාංශයේ දී පැවැත්විනි.

- 30% කට වඩා දේශීය එකතුකල අගයක් සහිත දේශීයව එකලස් කල/නිෂ්පාදිත මෝටර් වාහන සහ HS ශීර්ෂපාඨ 84 සහ 85 යටතේ එන විදුලි උපකරණ, කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශයන් මත නිෂ්පාදන භාණ්ඩ බදු ගෙවීමෙන් නිදහස් වේ.
- කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශයේ මාර්ගෝපදේශකත්වය යටතේ, දේශීයව නිෂ්පාදිත උපාංග භාවිතා කරමින් මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයෙහි මේ වන විට නියුතුව සිටින නිෂ්පාදන ව්‍යාපාර හැරුණුකොට පසුගිය වසර තුල සමාගම් දෙකක් මීට අළුතින් ප්‍රවේශ වී තිබේ.
- මෙම අනුග්‍රහය යටතේ, මෙරට විදුලි උපකරණ නිෂ්පාදන ආයතනයක් විසින් දේශීයව එකතු කල අගයක් සහිතව නිෂ්පාදනය කරන ලද රෙදි සෝදන යන්ත්‍ර මාදිලියක් සඳහා ද නිෂ්පාදන බදු සහනය 2013 වසර තුල දී ලබාදෙන ලදී.
- 30% කට වැඩි දේශීය එකතුකල අගයක් සහිතව රෙදි සෝදන යන්ත්‍ර, අධි ශීතකරණ සහ බෝතල් ශීතකිරීමේ යන්ත්‍ර නිපදවනු ලබන සමාගම් දෙකක් සඳහා ද මේ වන විට මෙම නිෂ්පාදන බදු සහනය ලබා දී ඇත.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංහය හා ඒ යටතේ ක්‍රියාත්මක වන සියළුම ආයතන විසින් මහජනතාව වෙත ලබා දෙන විවිධ සේවා ඇතුලත් අත්පොතක් මෙම අංශය විසින් සකස්කරන ලද අතර, 2013 නොවැම්බර් මස පැවති පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පැවති "Reflection Of Sri Lanka" ප්‍රදර්ශනයෙහිදී එය එළි දක්වන ලදී.
- "2014 අයවැය" පිළිබඳව කර්මාන්තකරුවන් හා අපනයනකරුවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා දේශීය කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ වාණිජ මණ්ඩල සමාජිකයන් ඇතුළු දෙසීයකට ආසන්න පිරිසකගේ සාහභාගීත්වයෙන් දෙසැම්බර් මස 17 වනදා පැවැත්විනි.

# කර්මාන්ත සංවර්ධන අංශය

## හැඳින්වීම

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් සීමා වී ඇති කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීමටත් එමගින් ජාතික ආදායමට කර්මාන්ත අංශයෙන් වන දායකත්වය ඉහළ නැංවීමටත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන අංශය දායක වෙයි.මෙම කර්තව්‍යයේදී ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජන දිරිගැන්වීම,අවශ්‍ය වන යටිතල පහසුකම් සලසා දීම සහ තාක්ෂණික පහසුකම් හා උපදේශන සේවා ලබාදීම මෙම අංශයේ වගකීම වේ.

## ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු පිහිටුවීම

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පණත යටතේ සෑම පළාතක් සඳහාම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු ස්ථාපිත කර ඇත.මෙම කමිටුවේ කාර්යභාරය ලෙස පළාත් තුල කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන සැලසුම් සහ ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම,ඒ සඳහා අවශ්‍යවන පහසුකම් සැලසීම සහ කර්මාන්ත සම්බන්ධ ආයෝජන තීරණයන් ක්‍රියාත්මක කිරීමට ආයෝජකයන්ට සහය වීම හැඳින්විය හැක.

එම කමිටුවේ සභාපති ලෙස අදාල පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාගේ එකඟත්වය සහිතව කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා විසින් පුද්ගලික අංශය නියෝජනය කරන ව්‍යාපාරිකයෙකු පත් කරනු ලබන අතර පළාත නියෝජනය කරන කර්මාන්තකරුවන් සහ රාජ්‍ය නිළධාරීන් 15ක් මෙම කමිටුවට ඇතුළත් වේ.මෙම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ කර්යභාරය ඉටු කිරීම පිණිස පළාත් මට්ටමින් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන 09ක් ආරම්භ කර ඇති අතර ප්‍රාදේශය කර්මාන්ත සේවා කමිටුවේ ලේකම් ලෙස ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබයි.එම තනතුරේ කාර්යට සහය වීම සඳහා අදාල කාර්ය මණ්ඩලයක්ද පත් කර ඇත.

## ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන

කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉඩම් ලබා ගැනීමට ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වෙත ඉදිරිපත් වන නව ව්‍යාපෘති යෝජනා ඇගයීම 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පණත යටතේ පිහිටුවා ඇති ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු මඟින් සිදු කරනු ලබයි. මෙමඟින් ප්‍රාදේශීය මට්ටමින් නව ආයෝජකයින් තෝරා ගැනීමට අවස්ථාව උදාවේ.කමිටුව මඟින් නිර්දේශ කරනු ලබන ව්‍යාපෘති තවදුරටත් ඇගයීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන කමිටුව වෙත යොමු කරනු ලබයි.මෙම කමිටුව මඟින් ව්‍යාපෘති අනුමත කිරීමේදී නිෂ්පාදන ක්‍රියාවලිය, අගය එකතු කිරීමේ ප්‍රතිශතය,පාරිසරික බලපෑම, මූල්‍ය ශක්‍යතාවය සහ රැකියා උත්පාදනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

මීට අමතරව මෙම ව්‍යාපෘති යෝජනා අතුරෙන් පාරිසරික වශයෙන් සංවේදී ව්‍යාපෘති යෝජනා පිළිබඳව තාක්ෂණික කාර්මික ආයතනය වැනි තාක්ෂණික ආයතන වෙතින් නිර්දේශ ලබා තාක්ෂණික වශයෙන් වැඩි දියුණු කිරීම් සිදුකර පරිසරයට අවම හානියක් සිදු වන අයුරින් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් මඟ පෙන්වීමට කටයුතු කරනු ලබයි.ඇගයීම් කමිටු අනුමැතිය ලද ව්‍යාපෘති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මඟින් සංවර්ධනය කරන ලද කර්මාන්තපුරවලින් වසර 35ක් සඳහා වූ බදු පදනම යටතේ ඉඩම් කොටස් වෙන්කර දෙනු ලබයි.

## 2013 දෙසම්බර් 31 දිනට ප්‍රගතිය

**2013 වර්ෂයේ නව ව්‍යාපෘති සඳහා කර්මාන්තපුර වලින් ඉඩම් කොටස් අයදුම් කරමින් ආයෝජකයන් විසින් අයදුම්පත් 56ක් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඒ අතුරින් නිර්දේශ වූ ව්‍යාපෘති 39 ක් අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඒ අතුරින් ව්‍යාපෘති 36ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා ඉඩම් කොටස් වෙන් කර දී ඇත. 2013 වර්ෂය තුළදී නව කර්මාන්ත 17ක් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇති අතර බිහි වී ඇති නව රැකියා අවස්ථා ප්‍රමාණය 3104කි.**

- **ඇඹිලිපිටිය කර්මාන්තපුරය**

ඇඹිලිපිටිය තාප බලාගාරයට යාබදව පිහිටි අක්කර 25ක ඉඩමක් සියළු යටිතල පහසුකම් සහිතව ඇඹිලිපිටිය කර්මාන්තපුරය ලෙස සංවර්ධනය කර ඇත. ආයෝජකයකයන් දෙදෙනෙකු සඳහා දැනටමත් ඉඩම් කොටස් වෙන් කර දී ඇති අතර වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත. තවද අපනයනය සඳහා දිසිදි පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයක් මෙම කර්මාන්තපුරයේ ඉදි කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත.

- **මතුගම කර්මාන්තපුරය ( අදියර I සහ II )**

මතුගම කර්මාන්තපුරය - අදියර I හි සංවර්ධන කටයුතු නිමකර ඇති අතර මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සඳහා ඉඩම් වෙන් කර ඇත. ඇස්බැස්ටොස් සෙවිලි තහඩු නිෂ්පාදන කර්මාන්තයක් දැනටමත් තම වාණිජ නිෂ්පාදන කටයුතුවල නිරත වෙමින් පවතින අතර තවත් කර්මාන්තශාලා 02ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. අදියර I හි සංවර්ධන කටයුතු අවසන් වීමත් සමගම මතුගම කර්මාන්තපුරය අදියර II හි සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී.

- **ත්‍රිකුණාමලය කර්මාන්තපුරය**

‘නැගෙනහිර නවෝදය’ වැඩ සටහනට සමගාමීව ත්‍රිකුණාමලය කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ආරම්භ කරමින් අදියර - I හි අක්කර 25ක සංවර්ධන කටයුතු නිමකල අතර ඒ සඳහා කර්මාන්ත ආයතන 09ක් තෝරා ගෙන ඇත. සේවකයන් 850ක් පමණ සේවයේ යොදවමින් කර්මාන්ත ආයතන 5ක් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇති අතර සෙසු ආයෝජකයන් කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල නිරත වෙමින් සිටී.

අදියර II හි සංවර්ධන කටයුතු දැනට සිදු කරමින් පවතින අතර එම භූමියේ සංවර්ධන කටයුතුවලින් 70%ක් නිම කර ඇත.

- **මන්නාරම කර්මාන්තපුරය**


‘උතුරු වසන්තය’ වැඩසටහනට සමගාමීව සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරනු ලැබූ පළමු කර්මාන්තපුරය ලෙස මන්නාරම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු මන්නාරම දූපතෙහි අක්කර 25ක ඉඩමක ආරම්භ කරන ලදී. ආයෝජන මණ්ඩලය මගින් අනුමත නවීන තාක්ෂණයෙන් යුතු ඇඟළුම් කර්මාන්තශාලා 02ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. සේවකයන් 450 ක් පමණ සේවයේ යොදවමින් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත.

- **මඩකලපුව කර්මාන්තපුරය**

මඩකලපුව මන්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් තිරායිමඩු ග්‍රාමයේ පිහිටි රජයට අයත් අක්කර 24ක භූමි ප්‍රමාණයක කර්මාන්තපුරය ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතුවලට අදාල ඇස්තමේන්තු සකස් කර ඇති අතර, ඉදිකිරීම් කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය වෙත ලබා දී ඇත.

# Regional Industrial Estates
# Ministry of Industry and Commerce



# සංවර්ධන අංශ - I

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව ඇති කර්මාන්ත අතුරින් ආර්ථිකයට වඩාත් වාසිදායක වන කර්මාන්ත අංශ හඳුනාගෙන එම අංශ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අමාත්‍යාංශය තුල සංවර්ධන අංශ තුනක් පිහිටුවා ඇත.

මේ අතරින්, සංවර්ධන අංශ - 01 කර්මාන්ත අංශ 5 කින් සමන්විත වේ.ඒවා නම්

- අගය එකතු කල තේ කර්මාන්ත අංශය
- අගය එකතු කල කොහු කර්මාන්ත අංශය
- සැකසූ ආහාර කර්මාන්ත අංශය
- ඇසුරුම් ද්‍රව්‍ය කර්මාන්ත අංශය
- කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **අගය එකතු කල තේ කර්මාන්ත අංශය**

තේ වල අගය එකතු කිරීම ප්‍රධාන වශයෙන් සිදු වන්නේ ඇසුරුම්කරණය සහ රසකාරක, විවිධ ශාකසාර හා පළතුරු කොටස් එකතු කිරීම තුලිනි. කර්මාන්තය සඳහා අවශ්‍ය මෙම ද්‍රව්‍යය, යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණය බදු රහිත පදනම යටතේ ආනයනය කිරීමට පහසුකම් සැලසීම මඟින් මෙම කර්මාන්තය දිරි ගන්වනු ලැබේ. මෙම වර්ෂයේදී නව තේ කර්මාන්ත 10ක් සඳහා මෙම පහසුකම ලබා දී ඇත.

- **ආහාර අංශය සැකසූ ආහාර අංශය**

වාර්ෂිකව පවත්වන සැකසූ ආහාර සහ සැකසූ ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය මෙවර 12 වන වරට ඉතා සාර්ථකව 2013 අගෝස්තු මස දී පවත්වන ලදී. ඒ සඳහා ඉන්දියාව, පාකිස්තානය, චීනය, ඇමරිකා එක්සත් ජනපදය සහ තායිලන්තය වැනි විදේශීය රටවල සහභාගී වූ අතර ප්‍රධාන පෙලේ දේශීය කර්මාන්ත 340 ක් ද සහභාගී විය.

- අගය එකතු කර අපනයනය කිරීම සඳහා ලබාදෙන තීරුබදු සහන ක්‍රමය (TIEP) යටතේ සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්ත 116 ක අගය එකතු කල නිෂ්පාදනයන්ගේ අපනයන ධෛර්යමත් කිරීමට පහසුකම් සපයන ලදි.
- ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ ජාත්‍යන්තර සහතික ලබාදීම සඳහා කර්මාන්ත 15ක් යොමුකරන ලදි. මෙම වැඩසටහනේ අරමුණ වනුයේ, SLS,GMP,HACCP සහ ISO 22,000 වැනි ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීමට සැකසූ ආහාර කර්මාන්ත ක්ෂේත්‍රය යොමු කිරීමයි.
- සැකසූ ආහාර අංශයේ කර්මාන්තකරුවන් දැනුවත්කිරීමේ විශේෂ වැඩමුළු ගණනාවක් සංවිධානය කරන ලදි. මෙහිදී ආහාර වල සෞඛ්‍ය ආරක්ෂිත භාවය, ආහාර විවිධාංගීකරණය සහ නව පරපුරේ ආහාර, යොවුන් පෝෂණය සහ ආහාර පුරුදුවල වෙනස්වීම් හා ආහාර වෙළඳ පොලෙහි ගෝලීය ප්‍රවණතා පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කරන ලදී.

## ඇසුරුම් කර්මාන්තය

ඇසුරුම් කර්මාන්තයේ තාක්ෂණ ක්‍රමවේදයන් වර්ධනය කිරීම හා නව තාක්ෂණය හඳුන්වා දීම සඳහා එම ක්ෂෙත්‍රයේ කර්මාන්තයන්හි තාක්ෂණ ශිල්පීන් 15 දෙනෙකු සඳහා ඉන්දියානු ඇසුරුම් ආයතනයේ විශේෂ තාක්ෂණ පාඨමාලාවක් පවත්වන ලදී.

# සංවර්ධන අංශ - II

## හැඳින්වීම

පවත්නා කර්මාන්ත ශක්තිමත් කිරීම හා නව ආයෝජන අවස්ථා බිහිකිරීම මඟින් වෙළෙඳපොල තරඟකාරීත්වයට මුහුණ දියහැකි උසස් තත්ත්වයෙන් යුත් භාණ්ඩ නිපදවීම සඳහා පහසුකම් සැපයීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

**අංශය යටතේ පවත්නා කර්මාන්ත**

- අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදන කර්මාන්ත
- රබර් අශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- යන්ත්‍රෝපකරණ හා මූලික ලෝහ නිෂ්පාදන කර්මාන්ත
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත
- වාහන එකලස් කිරීම හා ප්‍රවාහන උපකරණ නිෂ්පාදන කර්මාන්ත
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- දෘෂ්ටි හා ඡායාරූප නිෂ්පාදන කර්මාන්ත

## අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදන කර්මාන්තය

රු.මි. 85 ක මුදලක් වියදම් කර මොරටුව විශ්ව විද්‍යාලයේ පිහිටුවන ලද අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානයේ සේවා පහසුකම් ලබාදීම ආරම්භ කර ඇත. ඒ අනුව විශ්ව විද්‍යාල සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුවක් තාක්ෂණ ශිල්පීන් සඳහා අර්ධ කාලීන පාඨමාලාවන් පැවැත්විනි. නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය සේවා සැපයීම සිදු කරන ලද අතර මේ වසර තුල උපයන ලද සමස්ත ආදායම හා සේවාවන් පහත දැක්වේ.

| | මෝස්තර නිර්මාණය / නිෂ්පාදනය සහ උපදේශක සේවා | | |
|---|---|---|---|
| | රැකියා | සේවා දායකයා | ආදායම (රු.මි.) |
| **2011** | 60 | 24 | 2,888,272 |
| **2012** | 95 | 30 | 2,551,904 |
| **2013** | 96 | 34 | 2,078,150 |
| **එකතුව** | **251** | **88** | **7,518,326** |

මූලාශ්‍රය: සංවර්ධන අංශ 2

**අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදන අංශය යටතේ පැවැත්වූ අර්ධ කාලීන පාඨමාලා**

| | අර්ධ කාල පුහුණු පාඨමාලා | | |
|---|---|---|---|
| | පාඨමාලා | සහභාගීවූවන් | ආදායම (රු.මි.) |
| **2011** | 03 | 51 | 1,751,080 |
| **2012** | 04 | 56 | 1,335,790 |
| **2013** | 04 | 51 | 1,651,890 |
| **එකතුව** | **11** | **158** | **4,738,760** |

## රබර් අශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය

රබර් අශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය නගා සිටුවීම සඳහා පිහිටුවන ලද උපදේශක කමිටුවේ යෝජනාවක් අනුව මෙම අංශයේ තාක්ෂණ ශිල්පීන්ගේ හිඟයට විසඳුමක් වශයෙන් ශ්‍රී ලංකා ප්ලාස්ටික් හා රබර් ආයතනය සමඟ ඒකාබද්ධව පුහුණු පාඨමාලාවක් ආරම්භ කෙරිනි.මෙම පාඨමාලාව දින 15 ක සති අන්ත පාඨමාලාවක් වශයෙන් පවත්වාගෙන යනු ලබයි. එහිදී Testing of Raw Materials, Compounding and mixing, Down Steam Processing, Calendaring Extrusion and Moulding, Testing Methods වැනි අංශ පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික ලබාදෙයි. මේ සඳහා 15 දෙනෙකුගේ කණ්ඩායමක් සහභාගි වී සිටින අතර 2014 මැයි මස වන විට පාඨමාලාව

අවසන් වේ. මෙහි පාඨමාලා ගාස්තුවෙන් 50% ක් අමාත්‍යාංශය දැරූ අතර ඉතිරිය සහභාගිවන ආයතන විසින් දරණ ලදි.

**රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය**

රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නිවැරදි දත්ත හා තොරතුරු නොමැති වීම එම ක්ෂේත්‍රය සම්බන්ධව සැළසුම් සකස් කිරීමේදී බරපතල ගැටළුවක් වී ඇත. මෙයට විසඳුමක් වශයෙන් බස්නාහිර පළාතේ කර්මාන්ත ආයතන 75 ක් සමීක්ෂණයක් මගින් ලබා ගන්නා ලද දත්ත පදනම් කර ගනිමින් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරන ලදි. මෙය දිවයින පුරාම ආවරණය වන පරිදි සිදු කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වන අතර ඒ සඳහා අමාත්‍යාංශයට අයත්ව දිවයිනේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවයේ නියුක්තව සිටින සංවර්ධන සහකාරවරුන්ගේ සේවය ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

**දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය - උණ බම්බු සකස් කිරීමේ කර්මාන්තය**

දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශයේ දැනට නියුක්තව සිටින කර්මාන්තකරුවන් සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමේ වැඩ සටහනක් 2013 වසර තුල සිදු කරන්න යෙදින. එහි දී දැව භාවිතය, නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම, මෝස්තර නිර්මාණය, නිමාව හා උපකරණ භාවිතය පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සිදු විය. මේ සඳහා ඌව පළාතින් තෝරාගන්නා තාක්ෂණික ශිල්පීන් 12 දෙනෙක් සඳහා මොරටුව ජාතික ආධුනිකයින් අභ්‍යාස ආයතනයෙදී නේවාසික පුහුණු පාඨමාලාවක් පැවැත් වූ අතර ඒ සඳහා රු. 329,000/= ක් අමත්‍යාංශය විසින් දරණු ලැබිය.

# සංවර්ධන අංශ - III

## හැඳින්වීම

ජාත්‍යන්තර වෙළෙඳපොල තරගකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය කිරීම මෙම අංශයේ අරමුණ වේ.

### අංශය යටතේ පවත්නා කර්මාන්ත

- පාවහන් කර්මාන්තය
- සම් භාණ්ඩ කර්මාන්තය
- පිඟන් භාණ්ඩ කර්මාන්තය
- විද්‍යුත් හා විදුලි උපකරණ කර්මාන්තය
- ඖෂධ හා සුවඳ විලවුන් කර්මාන්තය
- තීන්ත හා මුද්‍රණ කටයුතු කර්මාන්තය

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### සම්භාණ්ඩ අංශය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව අමාත්‍යාංශය විසින්, රසායනාගාර උපකරණ හා පුහුණුකිරීම් සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදීගන්නා ලදී.

### 5 වැනි පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2013

පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2013 පෙබරවාරි මාසයේදී අපනයන සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව 5 වැනි වරට අමාත්‍යාංශය විසින් පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය ජාත්‍යාන්තර මට්ටමේ විශ්වාසයක් කර්මාන්තයට ලබාදුන්,ජාත්‍යාන්තර මට්ටමේ අති විශේෂ ප්‍රදර්ශනයකි. මෙම ප්‍රදර්ශනය දේශීය කර්මාන්තකරුවන්ට විදේශීය වෙළෙඳපොලට පිවිසීම සඳහා වන නව තාක්ෂණය හා මෝස්තර පිළිබඳ දැනුවත්වීමට ඉවහල් වන අතර 2007 වසරේ සිට වාර්ෂිකව ක්‍රියාත්මක වේ. මේ සඳහා මෙම වසරෙහි රු. මිලියන 3.5 ක මුදලක් වියදම් කර ඇත.

### පාවහන් නිෂ්පාදනය හා මෝස්තර නිර්මාණ වැඩසටහන

2013 දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව නැගෙනහිර පලාතේ සුළු හා මධ්‍ය පරිමාණ පාවහන් නිෂ්පාදකයින් 15 දෙනක් සඳහා පාවහන් නිෂ්පාදනය හා මෝස්තර නිර්මාණය පිළිබඳ වැඩසටහනක් කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව අමාත්‍යාංශය විසින් පවත්වන ලදී.

### සම් හා සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත පුරය මන්නාරම.

සම් නිෂ්පාදන කර්මාන්ත අංශය සංවර්ධනය කිරීමේ පිහිටුවීමේ වැඩසටහන යටතේ මන්නාරම දිස්ත්‍රික්කයේ මරිච්චිකට්ටි ප්‍රදේශයේ විශේෂිත වූ කර්මාන්ත උද්‍යානයක් (විශේෂිත සම් ආශ්‍රිත නිෂ්පාදන සංකීර්ණය) පිහිටු වීමට අක්කර 75 ක ඉඩමක් අමාත්‍යාංශය විසින් හඳුනා ගෙන මේ සම්බන්ධයෙන් මිනුම් කටයුතු නිමකර ඇති අතර පාරිසරික බලපෑම් වාර්තාව සකස් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. මේ සඳහා රු. මිලියන 3 ක මුදලක් මේ වන විට වියදම් කර ඇත.

- **පිගන් භාණ්ඩ අංශය**

### පිගන් භාණ්ඩ කර්මාන්තය සඳහා මැටි/බෝල මැටි සහ වෙනත් ඛනිජ නිධි හඳුනාගැනීම.

කර්මාන්තය මුහුණ දී ඇති අමුද්‍රව්‍ය ගැටළු වලට පිළියමක් ලෙස මැටි/බෝල මැටි සහ අනෙකුත් ඛනිජ නිධි හඳුනා ගැනීමේ භූ විද්‍යාත්මක සමීක්ෂණ පැවැත්වීම සඳහා භූ විද්‍යා හා පතල් කාර්යාංශයට රු. මිලියන 8 ක මුදලක් අමාත්‍යාංශය විසින් ලබා දී ඇත. මේ යටතේ භූ විද්‍යා හා පතල් කාර්යාංශය මගින් ගම්පහ සහ පුත්තලම දිස්ත්‍රික්ක වල ස්ථාන 197 ක් සමීක්ෂණයට භාජනය කර ඉන් වාණිජමය වශයෙන්

විභවතාවයක් ඇති ඛනිජ නිධි 27 ක් හඳුනාගෙන ඇත. මීට අමතරව අමාත්‍යාංශය මගින් පිගන් භාණ්ඩ අංශය සඳහා වන උපදේශක මණ්ඩල හරහා හඳුනාගත් නිධි පිළිබඳව අදාල කර්මාන්තකරුවන් දැනුවත් කර ඇත. තවද ඌව හා මධ්‍යම පලාත් සඳහා ද සමීක්ෂණයක් සිදු කිරීම පිණිස අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

- **විදුලි හා විද්‍යුත් භාණ්ඩ අංශය**

**විදුලි හා විද්‍යුත් භාණ්ඩ කර්මාන්තය සඳහා තාක්ෂණික පහසුකම් සැපයීම**

විදුලි හා විද්‍යුත් භාණ්ඩ කර්මාන්ත අංශයේ නියැලි සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් හා නව නිපයුම්කරුවන් සඳහා තාක්ෂනික පහසුකම් සපයන මධ්‍යස්ථානයක් අමාත්‍යාංශයේ අරමුදල් යොදවාගෙන මොරටුව විශ්ව විද්‍යාලය තුල පිහිටුවා ඇත. මේ යටතේ දැනටමත් නැගී එන කර්මාන්තකරුවන් 10 ක් සඳහා පුහුණුව ඇතුලත්ව තාක්ෂණික සහාය ලබාදී ඇත.

- **ඖෂධ හා සුවඳ විලවුන් කර්මාන්තය**

**ඖෂධ කර්මාන්තය**

මෙම අමාත්‍යාංශයේ මූල්‍ය සහයෝගයෙන් කොළඹ විශ්ව විද්‍යාලය තුල පිහිටුවන ලද ශ්‍රී ලංකා ඖෂධ පර්යේෂණායතනය පුළුල් කිරීම සඳහා අමතර උපකරණ ලබා ගැනීමට අවශ්‍ය රු. මිලියන 7 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර ඇත.

# කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහ කළමනාකරණ තොරතුරු අංශය

## හැඳින්වීම

### කර්මාන්ත ලියාපදිංචි කිරීම

1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනතට අනුකූලව ලියාපදිංචි වීමට ඉල්ලුම් කරනු ලබන සියළු කර්මාන්ත සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් අදාල ප්‍රාදේශීය කාර්යාලයේ වලකිව යුතු නිලධාරියෙකු/නිලධාරිනියක විසින් විසින් කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව සකස් කරනු ලබන සවිස්තරාත්මක පරීක්ෂණ වාර්තාවක් (නිර්දේෂ සහිතව) පදනම් කොට ගෙනය.

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති කර්මාන්ත ආයතන (2013වසරේදී)**

| | උප අංශය | ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන | 08 |
| 2. | රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 04 |
| 3. | දැව සහ දැව නිෂ්පාදන | 02 |
| 4. | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | 08 |
| 5. | රසායනික, ඛණිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 12 |
| 6. | ලෝහ නොවන නිෂ්පාදන | 09 |
| 7. | මූලික ලෝහ නිෂ්පාදන | 01 |
| 8. | සැකසූ ලෝහ නිෂ්පාදන | 19 |
| 9. | අනෙකුත් | 02 |
| | **එකතුව** | **60** |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචිය ආශ්‍රිත දත්ත සමුදාය*

කර්මාන්ත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලූම්පතෙහි අඩංගු දත්ත පාදක කොටගෙන මෙම දත්ත සමුදාය ගොඩනගා ඇති අතර එය නිරතුරුව යාවත්කාලීන කරනු ලබයි. එහි කර්මාන්තශාලාවේ පිහිටීම, අයිතිය, නිෂ්පාදන භාණ්ඩ, ඒවායේ නිෂ්පාදන ප්‍රමාණය හා වටිනාකම, ස්ථාවර වත්කම්වල වටිනාකම හා සේවක සංඛ්‍යාව යනාදී තොරතුරු අඩංගුව ඇත.

- පසුගිය කාල පරිච්ඡේදය හා සැසඳීමේදී කර්මාන්ත ලියාපදිංචියේ 3.1% ක වර්ධනයක් පෙන්නුම් කරයි.
- පසුගිය කාල පරිච්ඡේදය හා සැසඳීමේදී කර්මාන්ත ලියාපදිංචියේ වැඩිම වර්ධනයක් (6%)පෙන්නුම් කරනුයේ ලෝහ නොවන නිෂ්පාදන අංශය යටතේ ය.

මුළු ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව හා සැසඳීමේදි වැඩිම දායකත්වයක් වන 22.9% ක් පෙන්නුම් කරනුයේ රසායනික, ඛණිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අංශය මඟිනි.

**කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ප්‍රාදේශීය ව්‍යාප්තිය 2013**

| උප අංශය | ආයතන සංඛ්‍යාව |
|---|---|
| **කොළඹ** | 1293 |
| **ගම්පහ** | 360 |
| **කළුතර** | 108 |
| **ගාල්ල** | 37 |
| **පුත්තලම** | 40 |
| **නුවර** | 82 |

| | |
|---|---|
| කුරුණෑගල | 37 |
| මාතර | 40 |
| හම්බන්තොට | 15 |
| නුවරඑළිය | 6 |
| රත්නපුර | 12 |
| අනුරාධපුරය | 10 |
| බදුල්ල | 7 |
| කෑගල්ල | 16 |
| මාතලේ | 15 |
| මොණරාගල | 02 |
| පොලොන්නරුව | 04 |
| අම්පාර | 06 |
| ත්‍රිකුණාමලය | 03 |
| මඩකළපුව | 02 |
| වව්නියාව | 1 |
| යාපනය | 3 |
| මන්නාරම | 1 |
| **එකතුව** | **2100** |

*මූලාශ්‍රය: කර්මාන්ත හා ඵලදායීතා වර්ධන අංශය*

අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් විමසන ලදුව මෙම අවස්ථාමත විවිධ පොත්පත් සඟරා, කාලින ප්‍රකාශන හා වාර්තා යනාදිය පුස්තකාලය සඳහා මිලදී ගැනීමට පසුගිය කාලය තුල කටයුතු සලසන ලදි. පුස්තකාලය භාවිතාකරන අයගේ පහසුව සඳහා එහි අභ්‍යන්තර පිහිටීමද ක්‍රමවත්ව සකසන ලදී.

**වෙබ් අඩවිය අශ්‍රිත සංවර්ධන කටයුතු**

වෙබ් අඩවිය නිර්මාණය කරමින් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වැඩිදියුණු කළ අතර මෙමඟින් කර්මාන්ත ලියාපදිංචි කිරිමේ ඉල්ලුම්පත් හා ඊට අදාල තොරතුරු ලබාගැනිමේ හකියාව පවතී.

මීට අමතරව අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කරන ලද කර්මාන්ත වල දත්ත පද්ධතියක් නඩත්තු කිරිම සිදුවේ. මේ දත්ත සමුදාය තුළින් තෝරාගත් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සංඛ්‍යා ලේඛන වාර්තා සකස් කිරිම කළ හැකි වේ.

ආකර්ශනිය ආකාරයෙන් නිර්මිත මෙම වෙබ් අඩවිය තොරතුරු ලබා ගැනිමට අවශ්‍ය පාර්ශව වලට හිතකාමී හා පහසුවෙන් ප්‍රවිශ්ය විය හැක්කකි.

# ඵලදායීතා සංවර්ධන අංශය

## හැඳින්වීම

ගෝලීය තරඟකාරිත්වයට මුහුණ දිය හැකි අයුරු ශ්‍රී ලාංකික කාර්මික නිෂ්පාදනවල ගුණාත්මක භාවය හා ප්‍රමිතීන් ශක්තිමත් කර, කාර්මික නිෂ්පාදන අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය පරිසරය සකස් කිරීමට උවමනා පහසුකම් සැලසීම, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ඵලදායිතා සංවර්ධන අංශයේ මූලික අභිප්‍රාය වේ.

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### කාර්මික අංශයේ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ වැඩසටහන

- මෙහෙයුම් කමිටුව ස්ථාපිත කිරීම.
- තෝරාගත් කර්මාන්ත ආයතන 27 ක මූලික බලශක්ති පරිභෝජන දත්ත හා තොරතුරු රැස්කර විශ්ලේශණය කිරීම.
- තෝරාගත් කර්මාන්ත ආයතන 15 ක කළමනාකරුවන් 30 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ බල ශක්ති සංවර්ධන වැඩසටහන සඳහා සහභාගිවන ආයතන 15 ක් සමඟ අවබෝධතා ගිවිසුම් සකස් කිරීම හා අත්සන් කිරීම.
- බලශක්ති උපදේශකයන් තෝරාගත් කර්මාන්ත ආයතන 15 ක මූලික බලශක්ති විගණන නිරික්ෂණ නිම කිරීම.
- උපදේශකයන් තෝරා ගත් කර්මාන්ත 15 සඳහා මූලික බලශක්ති විගණන වාර්තා හා යෝජනා සකස් කිරීම.
- උපදේශකයන් තෝරා ගත් කර්මාන්ත 15 සඳහා විශ්ලේශනාත්මක බලශක්ති විගණන යෝජනා ක්‍රියාත්මක කිරීම.
- උපදේශකයන් තෝරා ගත් කර්මාන්ත 13 සඳහා විශ්ලේශනාත්මක බලශක්ති විගණන වාර්තා සකස් කිරීම.

### කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන

ශ්‍රී ලංකාවේ කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරිම හා කාර්මික අපද්‍රව්‍ය හුවමාරුව තුලින් අතුරු නිෂ්පාදන වැඩි දියුණු කිරීම (බස්නාහිර, වයඹ ,දකුණු හා මධ්‍යම පළාත් වල ක්‍රියාත්මක වේ. ) මේ යටතේ සිදුවේ. පළාත් පාලන ආයතන , මහ නගර සභා , නගර සභා, ප්‍රාදේශිය සභා, වාණිජ මණ්ඩල හා නිෂ්පාදකයින්ගේ සංවිධාන අතර සම්බන්ධතා ගොඩ නැගීම හා කාර්මික නිෂ්පාදන ආයතන සම්බන්ධීකරණය කිරීම තුලින් දත්ත හා තොරතුරු ජාලයක් ගොඩ නැගීම ව්‍යාපෘතිය තුළින් තවදුරටත් බලාපොරොත්තු වේ.

- දංකොටුව කර්මාන්තපුරයට අදාළව සිදු කෙරෙන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානයේ හා මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික සහාය මත ආරම්භ විය.
- මූලික සමීක්ෂණය සිදුකර ඊට අදාළ වාර්තාව ඉදිරිපත් කිරීම.
- තෝරාගත් නිෂ්පාදන කර්මාන්ත 5න් 3ක් සඳහා අදාළ යොජනා ඉදිරිපත් කිරීම.

### කොන්ක්‍රීට් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන

- කොන්ක්‍රීට් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන බස්නාහිර , වයඹ, දකුණු හා මධ්‍යම පළාත් වල ක්‍රියාත්මක වේ.
- කොන්ක්‍රීට් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් හි නියුතු නිෂ්පාදකයන් 40 දෙනෙකුගෙන් පමණ මූලික දත්ත හා තොරතුරු රැස් කිරීම.
- කොන්ක්‍රීට් හා සිමෙන්ති නිපැයුම් කර්මාන්ත අංශය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් සකස් කර ඇති ප්‍රමිතින් හඳුනා ගැනීම.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය , රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ ඉදිකිරීම් පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනය වැනි ආයතන සම්බන්ධීකරණය කිරීමෙන් කොන්ක්‍රීට් සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අංශය වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් සැකසීම

# රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

## හැඳින්වීම

රසායනික අවි සම්මුතිය (ර. අ. ස.) යනු රසායනික අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය, හුවමාරු කිරීම තොග රැස්කිරීම හා භාවිතය තහනම් කිරීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුමකි. සමූහ ඝාතක අවි ගණයට අයත් සියළු රසායනික අවි තහනම් කිරීම සඳහා මෙම සම්මුතිය 1993 වසරේදී සම්මත කරගන්නා ලදී. තවද සම්මුතිය නිසි ලෙස ක්‍රියාත්මක වේදැයි තහවුරුකර ගැනීම උදෙසා යාන්ත්‍රණයක් සහිතවීම හේතුකොට ගෙන මෙම සම්මුතිය අනෙක් සම්මුතින්ගෙන් වෙනස්වේ.

2007 අංක 58 දරන රසායනික අවි සම්මුති පනත, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් 2008 අගෝස්තු 15 දින ශ්‍රී ලංකාව තුල බලාත්මක කරන ලදී.

රසායනික අවි සම්මුතිය යටතේ ක්‍රියාත්මක කල යුතු වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට හා රසායනික අවි තහනම් කිරීමේ ජාත්‍යන්තර සංවිධානය හා අනෙකුත් සාමාජික රාජ්‍යයන් සමග සාධනීය සම්බන්ධතාවයක් පවත්වා ගැනීම උදෙසාත් රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාශංය යටතේ ස්ථාපිත කර ඇති ආයතනයකි.

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **කර්මාන්ත ලියාපදිංචි කිරීම සහ නිර්දේශ නිකුත් කිරීම**

  ජාතික අධිකාරිය විසින් මෙම වසරේ නව කර්මාන්තකරුවන් / ආනයනකරන්නන් 06 දෙනෙකු ලියාපදිංචිකර ඇති අතර කර්මාන්තකරුවන් / ආනයනයකරන්නන් **21**ගේ ලියාපදිංචිය යාවත්කාලීනකර ඇත. තවද ලැයිස්තුගත රසායනික ද්‍රව්‍යයන් ආනයනය කිරීම සඳහා මෙම වසරේ නිර්දේශ **61**ක් නිකුත්කර ඇත. මෙම නිර්දේශ නිකුත්කර ඇත්තේ ආනයනයකරන්නන්ගේ ඉල්ලීම මත රසායනික අවි සම්මුති පනතට යටත්වය.

- **රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත වාර්ෂික වාර්තා යැවීම**

  රසායනික අවි සම්මුතියේ හයවන වගන්තියට අනුකූලව 2013 වර්ෂය සඳහා රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත යැවිය යුතු වාර්ෂික වාර්තා යවා ඇති අතර ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක වැඩපිළිවෙල පිළිබඳව වාර්තාද යවා ඇත.

- **කළුතර කර්මාන්තපුරය සඳහා රසායනික අනතුරු කළමණාකරනය සඳහා සැලැස්මක් පිළියෙල කිරීම**

  ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීමට සහායවීම සඳහාත් තිරසාර කර්මාන්ත සංවර්ධනයක් ලඟාකරගැනීම සඳහාත් ජාතික අධිකාරිය කළුතර කර්මාන්තපුරයේ පිහිටි උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය පරිහරණය කරන ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර ඇත. මෙම සමීක්ෂණය 2012 ජූලි මස ආරම්භකර කර්මාන්තපුරයේ පිහිටි කර්මාන්ත 23ක් සමීක්ෂණය කර ඇත.

  මෙම සමීක්ෂණයේදී උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය පරිහරණය, සෞඛ්‍ය හා ආරක්ෂණය සම්බන්ධයෙන් ලබාගත් නිරීක්ෂණ පදනම් කරගෙන දෙන ලද නිර්දේශ සහිත වාර්තා 2013 ජනවාරි 23 කර්මාන්තරුවන් අතර අමාත්‍යාංශිය ශ්‍රවණාගාරයේදී බෙදාදෙන ලදී.

- **ගිනි ආරක්ෂාව හා සුරක්ෂිතතාවය පිළිබඳ වැඩසටහන**

  රසායනික අනතුරු කළමනාකරණය සඳහා සැලැස්මක් පිළියෙල කිරීමේ දෙවැනි පියවර ලෙස, ජාතික අධිකාරිය විසින් ගිනි ආරක්ෂාව හා සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණු වැඩමුළුවක් කලුතර

කර්මාන්තපුරයේ කර්මාන්තකරුවන් සඳහා එම පරිශ්‍රයේ දී පවත්වන ලදී.

- **සේවා ස්ථානයන්හි උපද්‍රව කළමනාකරණය**

සේවා ස්ථානයන්හි සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා ජාතික අධිකාරිය 2013 සැප්තැම්බර් 06 වන දින කළුතර කර්මාන්තපුරයේ වැඩමුළුවක් පවත්වන ලදී. මෙහිදී ප්‍රතිකාර සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක්ද කර්මාන්තශාලා වලින් තෝරාගත් පිරිසකට ලබා දෙන ලදී.

- **ISO ප්‍රමිතීන් පිළිබඳ සම්මන්ත්‍රණය**

ජාතික අධිකාරිය, කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ **(IHRA)** සහයෝගය ඇතිව **ISO** ප්‍රමිතීන් පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. තිරසාර කර්මාන්ත සංවර්ධනයක් සඳහා **ISO** ප්‍රමිතීන් පිළිබඳ මූලික දැනුමක් ලබාදීම, එම ප්‍රමිතීන් ලබාගැනීමෙන් ව්‍යාපාර සඳහා වන ප්‍රතිලාභ, මෙම ප්‍රමිතීන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රචලිත කිරීම සඳහා ඒ පිළිබඳ අවශ්‍යතාවයන් හා මගපෙන්වීම මෙම වැඩමුළුවේ අරමුණ විය. මෙම සම්මන්ත්‍රනය සඳහා කර්මාන්ත 12කින් 25 දෙනෙකු සහභාගි විය.

- **රසායනික අවි සම්මුතිය සහ රසායනික ද්‍රව්‍ය නිසා ඇතිවන හදිසි අවස්ථා කළමනාකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

කළුතර පොලිස් අභ්‍යාස ආයතනයේ ඉල්ලීමක් මත, ජාතික අධිකාරිය විසින් රසායනික අවි සම්මුතිය සහ රසායනික ද්‍රව්‍ය නිසා ඇතිවන හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2013 මාර්තු 25-28 දිනයන්හි කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා පොලිස් නිලධාරින් 250ක් පමණ සහභාගි විය.

- **තිරසාර කර්මාන්ත සංවර්ධනයක් සඳහා උපද්‍රව රසායනික ද්‍රව්‍ය කළමනාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

ජාතික අධිකාරිය, **IHRA** සමග සහයෝගයෙන් තිරසාර කර්මාන්ත සංවර්ධනයක් සඳහා උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා කර්මාන්ත 23කින් 51 දෙනෙකු සහභාගි විය.

- **සේවා ස්ථානයන්හි උපද්‍රව කළමනාකරණය පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන**

සේවා ස්ථානයන්හි උපද්‍රව කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් වැල්ලවත්තේ පිහිටි ගිනි නිවීමේ හා ගලවා ගැනීමේ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේදී පැවැත්විනි. මෙය ජාතික අධිකාරිය, **IHRA** සමග සහයෝගයෙන් සංවිධානය කරන ලදී.

- **ආහාර හා සම්බන්ධවූ රසායනික ආරක්ෂාව පිළිබඳ වැඩසටහන**

ජාතික අධිකාරිය **IHRA** සමග සහයෝගිත්වයෙන් ආහාර සම්බන්ධවූ රසායනික ආරක්ෂාව පිළිබඳ වැඩසටහනක් පවත්වන ලදී. එම වැඩසටහනේ අරමුණ වූයේ ආහාර වල හා ආකලන වල රසායනික ද්‍රව්‍ය මිශ්‍රවීම, ආහාර වල සෞඛ්‍ය ආරක්ෂාව සහ ස්වස්ථාව, ආහාර කර්මාන්තයේ ක්ෂුද්‍ර ජීවින්ගේ අහිතකර බලපෑම, ශ්‍රී ලංකාව තුල ආහාර හා පරිභෝජනය සම්බන්ධ වූ රෙගුලාසි සහ ආහාර කර්මාන්තයේ දී රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව භාවිතය පිළිබඳ දැනුමක් ලබාදීමය. මෙම වැඩසටහන සඳහා ආහාර නිෂ්පාදකයන් සහ ඒවාට සම්බන්ධ ආයතන 35කින් 51 දෙනෙකු සහභාගි විය.

- **පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව - රසායනික හදිසි හනතුරු සඳහා සූදානම් වීම**

පොදු රාජ්‍ය මණ්ඩල මෙහෙයුම් මහ ලේකම් කාර්යාලය මගින් කරන ලද ඉල්ලීමට අනුව රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය මගින්, එම සමුළුවේ ප්‍රධාන උත්සව පැවැත්වෙන ස්ථාන හා අනෙකුත් ස්ථාන පරික්ෂා කිරීමට හා රසායනික හදිසි අනතුරු සඳහා සූදානම්වීමට හා ඒවා කළමනාකරණයට අදාලව

හම්බන්තොට, ගාල්ල, මීගමුව, ජාඇල, බත්තරමුල්ල හා කොළඹ ආශ්‍රිත ස්ථාන පරීක්ෂා කරන ලදී.

- **විදේශිය පුහුණු**

  ශ්‍රී ලංකා රේගුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ජල සම්පාදන මණ්ඩලය යන ආයතනවල නිලධාරින් සඳහා අදාල ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දක්ෂතා හා හැකියා වැඩි දියුණු කරගැනීමට ජාත්‍යන්තර පුහුණුවීම් ලබාදෙන ලදී. මෙම පුහුණු වැඩසටහන් රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය, මැලේසියාව, ස්විට්සර්ලන්තය සහ පින්ලන්තය යන රාජ්‍යයන්ගේ සහාය ඇතිව සංවිධානය කර තිබුනි.

- **හොටෙල් ක්ෂේත්‍රයේ ආහාර ආශ්‍රිත රසායනික ආරක්ෂාව පිළිබඳ වැඩසටහන**

  රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය, **IHRA** සමග ඒකාබද්ධව ඔක්තෝබර් මස 31 දින පවත්වන ලදී. මේ සඳහා හොටල් ක්ෂේත්‍රයේ නියුතුවූවන් 25 දෙනෙකු පමණ සහභාගි විය.

- **ශ්‍රී ලංකාවතුල ලැයිස්තුගත රසායනික ද්‍රව්‍යයන් භාවිතා කරන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන**

  ලැයිස්තුගත රසායනික ද්‍රව්‍යයන් භාවිතාකරන්නන් බොහෝ ප්‍රමාණයක් තවමත් ජාතික අධිකාරිය සමග ලියාපදිංචි නොවී තිබීම හේතුකොට ගෙන ඔවුන්ව දැනුවත් කිරීම සඳහාත් ලියාපදිංචි කිරීම සඳහාත් දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශයේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදි.

- **උපද්‍රවකාරී ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන**

  හෝල්සිම් ආයතනයේ උපද්‍රවකාරි ද්‍රව්‍ය ප්‍රවාහන කටයුතු වල නියුතු වන පුද්ගලයන් සඳහා උපද්‍රවකාරී ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2013 දෙසැම්බර් මස 21 දින කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේදී පවත්වන ලදී.

# සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය

## හැඳින්වීම

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සියලුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වඩාත් ශක්‍ය හා තිරසාර රාජ්‍ය ආයතන බවට පත් කිරීමට අවශ්‍ය සහය ලබා දේ. එකී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අංශය මගින් මෙම රාජ්‍ය ආයතනවල ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම තුළින් ආදායම් උපරිම කිරීම සහ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම් හඳුන්වා දීම තුළින් ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ කටයුතු හඳුන්වා දීම ආරම්භ කර ඇත. ඊට අතිරේකව මෙම ව්‍යවස්ථාපිත ආයතනවල දෛනික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමද මෙම අංශය මගින් සිදු කරයි.

**සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යාපාර ආයතන නම්,**

- මාන්තායි ලුණු සමාගම
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය
- ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
- ලංකා ලේලන්ඩ් සමාගම සහ
- ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම වේ.

### • මාන්තායි ලුණු සමාගම

මාන්තායි ලුණු සමාගම පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් වන අතර, ලුණු නිෂ්පාදනයේ හා විකිණීමේ කටයුතුවල නිරතව සිටියි. වර්තමානයේ මන්නාරම හා යාපනයේ වෙම්මනි ලුණු ලේවායන් ආයතනය සතුව පවත්නා අතර, මන්නාරම් ලේවාය මගින් සාමාන්‍ය ලුණු, අඹරන ලද ලුණු හා අයඩින් මිශ්‍ර ලුණු නිෂ්පාදනය කරනු ලබයි. භූගෝලීය හේතුමත නිෂ්පාදන කටයුතු අසාර්ථික වීම නිසා දැනට වෙම්මණි ලේවායෙහි නිෂ්පාදන කටයුතු නවත්වා ඇත. වර්ෂ 2012 දී රුපියල් මිලියන 25 ක පිරිවැයක් දරා මන්නාරම ලුණු ලේවායේ දැනට පවත්නා ලුණු හෙක්ටයාර 110 ට අමතරව අතිරේක ලුණු හෙක්ටයාර 53 ක් වැඩි දියුණු කරන ලද අතර, එමඟින් මෙට්‍රික් ටොන් 4000 ක් වූ සාමාන්‍ය වාර්ෂික ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5000 - 6000 ක් දක්වා වැඩි කරගැනීමට හැකි වී ඇත. ආයතනය විසින් "රජ ලුණු" වෙළඳ නාමය යටතේ කිලෝ ග්‍රෑම් 1 ලුණු පැකට් නිෂ්පාදනය කර බෙදා හරින අතර, මසකට පැකට් 50,000 ක් අලෙවි කිරීමට හැකි වී ඇත. ආයතනය විසින් රුපියල් මිලියන 35 ක පිරිවැයක් දරා අයඩීනුකෘත ලුණු සකස්කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සහ යන්ත්‍රානුසාරයෙන් ලුණු සේදීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමට සැලසුම් කර ඇත. 2013 වර්ෂය තුලදී ලුණු මෙට්‍රික් ටොන් 3,863 ක් නිපදවා ඇති අතර ලුණු මෙට්‍රික් ටොන් 3,771 ක් විකිණීමෙන් රුපියල් මිලියන 42.7 ක ආදායම ක් උපයා ඇත.

### • කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය පූර්ණ වශයෙන් රජය සතු සීමිත සමාගමකි. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විශාලතම මිනිරන් කැණීම් ආයතනය වන අතර, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කහටගහ මිනිරන් පතලේ අඩි 2000 ක් පමණ ගැඹුරට කැණීම් කටයුතු සිදුකරගෙන යනු ලබයි. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය මිනිරන් කැණීම් කටයුතු සඳහා හැකියාව හා ශක්තිය ඇති එකම රාජ්‍ය ආයතනයද වේ. 2013 වර්ෂය තුලදී මිනිරන් මෙට්‍රික් ටොන් 661.26 ක් නිෂ්පාදනය කර ඇති අතර, මෙට්‍රික් ටොන් 750 ක් අපනයනය කර ඇත. 2013 වර්ෂය සඳහා මිනිරන් අලෙවියෙන් ලද ආදායම රුපියල් මිලියනයක් වන අතර, ශුද්ධ ලාභය

රුපියල් මිලියන ක් උපයා ඇත. ඉහත කටයුතු වලට අමතරව නව කැණීම් කටයුතු සඳහා බිම් ප්‍රදේශ හඳුනාගැනීම, අගය එකතුකල නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීම 2013 වර්ෂයේදී සිදුවූ විශාල ප්‍රගතියක් ලෙස දැකිවිය හැකිය.

- **ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය මඟින් පේෂකර්මාන්ත හා ඇඟළුම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා පුද්ගලයින් පුහුණු කිරීමද, පර්යේෂණ සහ උපදේශන කාර්යයන් වැනි සේවාවන් ඉටු කිරීමද සිදුකරනු ලබයි. 2013 වර්ෂය තුලදී පුහුණු පාඨමාලා 120 ක් පුහුණුවන්නන් 2,253 කගේ සහභාගිත්වයෙන් පවත්වා ඇති අතර පරීක්ෂණ 60,567 ක් සිදුකර ඇත. 2013 වසර සඳහා උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 146.39 ක් වන අතර රුපියල් මිලියන 20.04ක ශුද්ධ ලාභයක් උපයා ඇත.

- **ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වැඩි දියුණු කරලීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ අති ප්‍රබල වැදගත්කම වටහාගෙන, 2006 අංක 17 දරණ පනත යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇති අතර, එමගින් විශේෂයෙන්ම රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ වැඩි අවධානයක් සහිතව ව්‍යවසාය සංවර්ධනයට පහසුකම් සැලසීම, උනන්දු කරලීම, ප්‍රවර්ධනය කිරීම හා අනුබල දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අතර, දිස්ත්‍රික් ව්‍යවසාය සංසද පිහිටුවීම, ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන සහ පර්ෂද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමෙන් ව්‍යවසාය සංවර්ධනයට දායකවී ඇත.

- **ලංකා ලේලන්ඩ් සමාගම**

ලංකා ලේලන්ඩ් සමාගම 100% ක් පූර්ණ රජය සතු සමාගමක් වන අතර, 2008 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ලංකා ලේලන්ඩ් සමාගම විසින් රජය සතු ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ කොටස් 42% කළමනාකරණය කිරීම සිදුකරනු ලබයි.

- **ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම**

මිළ කල සමාගමක් වන ලංකා අශෝක් ලේලන්ඩ් සීමිත සමාගම, ශ්‍රී ලංකා රජය සමඟ පවත්නා බද්ධ ව්‍යාපාරයක් ලෙස 1982 දී ශ්‍රී ලංකාව තුල පිහිටුවා ඇති අතර, 100% ක් ශ්‍රී ලංකා රජය සතු ලංකා ලේලන්ඩ් සමාගම නියෝජනය කරන 42% ක කොටස් ප්‍රාග්ධනයක්ද ඉන්දියාවේ අශෝක් ලේලන්ඩ් සමාගමට 28% ක කොටස් ප්‍රාග්ධනයක්ද ඉතිරි 30% ක කොටස් මහජනයා සතුව පවත්නා සමාගමකි. සමාගම විසින් "අශෝක් ලේලන්ඩ්" නාමය යටතේ වාණිජමය වාහන එකලස් කරන අතර, සම්පූර්ණයෙන් නිම කල අශෝක් ලේලන්ඩ් බස් රථ, ට්‍රක් රථ හා ට්‍රක් රථ සඳහා අවශ්‍ය බඳ කොටස් , අමතර කොටස්, ජෙනරේටර සහ උපාංග ආනයනය සහ අලෙවි කිරිම සිදු කරනු ලබයි. මීට අමතරව, අශෝක් ලේලන්ඩ් භාණ්ඩ හා මගී ප්‍රවාහන වාහන අළුත්වැඩියා කිරීමද සිදු කරනු ලබයි.

**කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 111 - චක්‍රීය අරමුදල (SMILE III – Revolving Fund)**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ව්‍යාපෘති කලමනාකරණ ඒකකය හරහා 2012 මැයි 01 වන දින සිට SMILE III - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී.

මෙම ණයයෝජනා ක්‍රමය මඟින් අඩු පොළියක් යටතේ නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ තිබෙන ව්‍යාපාරයක ඵලදායීතාව හෝ මෙහෙයුම් මට්ටම වැඩි දියුණු කරගැනීමට හෝ ඒවායේ නිෂ්පාදන වල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීමට ණය සපයනු ලබයි. තවද, කුඩා හා සුළු පරිමාණ ව්‍යවසායන්වල සංවිධානාත්මක හැකියාව හා නිෂ්පාදන සංවර්ධනය වැඩි දියුණු කිරීම ද මෙමඟින් ආවරණය කරනු ලබයි. සාමාන්‍ය ණයයෝජනා ක්‍රමය යටතේ 9% පොලී අනුපාතයක් සහ තාක්ෂණික ණය යෝජනාක්‍රමය යටතේ 5% පොලී

අනුපාතයක් අයකරනු ලබන අතර පිළිවෙලින් රුපියල් මිලියන 5 ක උපරිම ණය මුදලක් සහ රුපියල් මිලියන 2.5 ක උපරිම ණය මුදලක් මෙම ණයයෝජනා ක්‍රම දෙක යටතේ පිරිනමනු ලබයි. සාමාන්‍ය ණයයෝජනා ක්‍රමය සඳහා ණය ආපසු ගෙවීම් කාලය වසර 10 ක් වන අතර තාක්ෂණික ණය යෝජනාක්‍රමය සඳහා වසර 07 ක් වේ. මීට අමතරව ණය යෝජනාක්‍රම දෙක සඳහා වසර 02 ක සහන කාලයක්ද හිමිවේ.

මෙම ව්‍යාපෘතිය මගින් සහභාගීත්ව ණය දෙන ආයතන 09 ක් හරහා (ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව,ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව හා ඩී එෆ් සී සී බැංකුව) උප ණය ලබා දීම සිදු කරනු ලබන අතර 2013 ජුලි මස සිට ණය නිදහස් කිරීම ආරම්භ කර ඇත.

2013 ජුලි මස සිට 2013 දෙසැම්බර් 31 වන දින දක්වා රුපියල් මිලියන 3200 කට ආසන්න වටිනාකමින් යුතු ණය ඉල්ලුම්පත් 992 ක් ලැබී ඇති අතර, ඉන් ණය අයදුම්පත් 524 ක් සුදුසුකම්ලත් ව්‍යාපෘතීන් ලෙස සලකා ඇත. සුදුසුකම්ලත් උප ව්‍යාපෘතීන් 124 ක් සඳහා රුපියල් මිලියන 343.828 වටිනාකමකින් යුතු ප්‍රතිමූල්‍ය අයදුම්පත් මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇති අතර, ඒ සඳහා මුදල් වෙන්කොට අනුමැතිය ලබා දී ඇත. 2013 දෙසැම්බර් මස 31 වන දිනට මෙම ණයයෝජනා ක්‍රමයේ ප්‍රගතිය පහත පරිදි වේ.

| සහභාගීත්ව ණය දෙන ආයතනයේ නම | අයදුම්පත් සංඛ්‍යාව | | | ප්‍රති මූල්‍ය | | ප්‍රතිපූරණ | |
|---|---|---|---|---|---|---|---|
| | ලැබුනු | සුදුසුකම්ලත් උප ව්‍යාපෘතීන් | සුදුසුකම් නොලත් උප ව්‍යාපෘතීන් | අනුමත කරන ලද උප ව්‍යාපෘතීන් සංඛ්‍යාව | වටිනාකම රු. මි. | මහ බැංකුව වෙත යවන ලද උප ව්‍යාපෘතීන් සංඛ්‍යාව | වටිනාකම රු. මි. |
| හැටන් නැෂනල් බැංකුව | 246 | 131 | 115 | 35 | 98.68 | 25 | **66.5** |
| ජාතික සංවර්ධන බැංකුව | 51 | 34 | 17 | 14 | 46.72 | 05 | **14.4** |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 54 | 33 | 21 | 06 | 7.81704 | 04 | **5.76** |
| ඩී එෆ් සී සී බැංකුව | 286 | 131 | 155 | 21 | 58.6 | 13 | **36.1** |
| සම්පත් බැංකුව | 167 | 64 | 103 | 17 | 46.58 | 04 | **13.84** |
| සෙලාන් බැංකුව | 66 | 57 | 9 | 18 | 54.76 | 13 | **37.95** |
| ලංකා බැංකුව | 77 | 44 | 33 | 02 | 5.6 | - | **-** |
| මහජන බැංකුව | 23 | 15 | 8 | 07 | 10.831 | 01 | **2.4** |
| කොමර්ෂල් බැංකුව | 22 | 15 | 7 | 04 | 14.24 | 02 | **8.0** |
| **එකතුව** | **992** | **524** | **468** | **124** | **343.828** | **67** | **184.95** |

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

## හැඳින්වීම

"කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්" ආයතනය මඟින් කළමණාකරණය කරනු ලබන කහටගහ මිනිරන් පතල් පිහිටා ඇත්තේ වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි දොඩන්ගස්ලන්ද මදුරාගොඩ ගම්මානයෙහි ය. තවද එය, කොළඹ සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 90 ක් පමණ දුරින් පිහිටා තිබේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන්නා වූද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන්ම රජය සතු සීමිත වගකීම් සහිත සමාගමක්ද වන එහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාය. මූලික ප්‍රතිපත්තිමය තීරණ ගැනීම රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයේ ආයතනික ප්‍රතිපත්ති මත විධායක සභාපතිවරයා ප්‍රධාන කොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු කෙරේ.

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **නිෂ්පාදනය**

2013 වර්ෂය තුල මුළු මිනිරන් (කණින ලද මිනිරන්) නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 959.47 කි. 2007 වර්ෂයේ දී පතල් කටයුතු නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව 2013/12/31 දක්වා මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,310.02 කි.

පසුගිය අවුරුදු 10 සමඟ සසඳා බැලීමේදී, ඒක පුද්ගල මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 0.138 සිට 1.37 දක්වා වැඩි වී තිබේ.

- **ඵලදායිතාවය**

පසුගිය වසරෙහි එක් මිනිස් වැඩමුරයකට කිලෝ ග්‍රෑම් 50.18 ක් වූ ඵලදායිතාවයට සාපේක්ෂව මෙම වර්ෂයේ පවතින සාමාන්‍ය ඵලදායිතාවය කිලෝ ග්‍රෑම් 55 කි.

- **විකුණුම්**

ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇස්බරි සමාගම, එක්සත් රාජධානියේ ග්‍රැෆේක්සේල් සමාගම සහ ජපානයේ එස්. කේටෝ සමාගම යන නිරන්තර සම්ප්‍රදායික ගැණුම්කරුවන් සමඟ මෙම කාලය තුල මිනිරන් අපනයනය වෙළෙඳපොල ක්‍රියාත්මක විය.

2000 වර්ෂයට පසු, ග්‍රැෆෙක්සෙල් සමාගම සමඟ ගණුදෙනු කරමින්, වර්ෂ 2011 දී යුරෝපීය වෙළෙඳපොල වෙත ප්‍රවේශ වී ඇති අතර එක්සත් රාජධානියේ වෙළෙඳපොල වෙත ඉහළ තත්වයේ මිනිරන් අපනයනය කෙරිණි.

ඒ අනුව, 2013 වර්ෂය තුල, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම මෙට්‍රික් ටොන් 749.5 ක් අපනයනය කර තිබේ. පතල නැවත ආරම්භ කිරීමෙන් පසු, 2007 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දක්වා මුළු අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4066 කි. 2013 වසරේදී පසුගිය වර්ෂ හා සසඳන කල මිනිරන් මෙට්‍රික් ටොන් 206.2 ක විකුණුම් ඉහළ යාමක් වාර්තා වී ඇත.

- **අරමුදල්**

2013 වර්ෂයේ දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුල, මුළු ආදායම රුපියල් මිලියන 142.2 කි. පතල් නැවත විවෘත කිරීමෙන් පසු, 2007 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාලය තුල, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම රුපියල් මිලියන 619 ක් උපයාගෙන තිබේ.

පතල් සම්බන්ධයෙන් මෙහෙයුම් වියදම්, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම විසින් දරනු ලබන අතර භාණ්ඩාගාරය මඟින් අරමුදල් සපයනු නොලැබේ.

2013 දෙසැම්බර් 31 අවසානය වන විට, බැංකු සහ මුදල් ශේෂය රුපියල් මිලියන 20.4 ක් විය.

පාරිතෝෂිත මුදල් ගෙවීම් අරමුදල සඳහා රුපියල් මිලියන 5 ක් ආයෝජනය කර ඇත.

- **තොග**

2013 දෙසැම්බර් මාසයේ අවසානය වන විට, පවත්නා වත්මන් මිනිරන් තොග ප්‍රමාණය මෙට්‍රික් ටොන් 877.881 ක් වන අතර එහි ආසන්න වෙළෙඳපොල අගය රුපියල් මිලියන 194 කි.

- **සේවක සංඛ්‍යාව**

පුහුණු පතල් කරුවන් හා වෙනත් අදාල තාක්ෂණික කාර්ය මණ්ඩලය ඇතුළුව සම්පූර්ණ සේවක සංඛ්‍යාව 119 කි. එක් කැණීම් ඉංජිනේරුවකු සහ ජ්‍යේෂ්ඨ තාක්ෂණික නිලධාරියෙකු පිළිවෙලින් ලංකා පොස්පේට් ආයතනයෙන් සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයෙන් බාහිර වශයෙන් ලබාගෙන ඇත. සුදුසුකම් සහිත වරලත් ඉංජිනේරුවරයෙකු වර්ෂය තුල අර්ධ කාලීන පදනම මත පත් කරන ලදී.

# මාන්තායි ලුණු සමාගම

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධව ඉතා දිර්ඝ ඉතිහාසයක් සහිත මන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය සාමාන්‍ය ලුණු ,අඹරන ලද ලුණු හා අයඩින් මිශ්‍ර ලුණු සහා කර්මාන්ත සඳහා ලුණු යන විවිධ වර්ග වල ලුණු නිෂ්පාදන මෙරට නිපදවයි.

| වසර | | පරිපාලන ආයතනයේ නම |
|---|---|---|
| සිට | දක්වා | |
| 1938 | 1965 | ලුණු දෙපාර්තමේන්තුව |
| 1966 | 1990 | ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව |
| 1991 | 1996 | ලංකා ලුණු සමාගම |
| 1997 | 2001 සැප්තැම්බර් | ප්‍රාදේශීයය ලේකම් කාර්යාලය-මන්නාරම |
| 2001 ඔක්තොම්බර් | මේ දක්වා | මාන්තයි ලුණු සමාගම |

## මන්නාරම ලුණු ලේවාය

2010 වසර වන විට මන්නාරම ලේවායේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමෙහි අරමුණෙන් අක්කර 240 ක් වූ ලේවායේ අක්කර 110 දක්වා නිෂ්පාදන බිම් ප්‍රමාණය සංවර්ධනය කර ඇත. 2011 වසරේ අක්කර 5ක නිෂ්පාදන බිම් වශයෙන් සංවර්ධනය කර ඇත. දැනට අක්කර 163 ක බිම් ප්‍රමාණයක ලුණු නිෂ්පාදන කටයුතු සිදුවේ. වසරකට මෙට්‍රික් ටොන් 4000 ක ලුණු නිෂ්පාදනයක් දළ වශයෙන් සිදුවේ. සංවර්ධන කටයුතුවලට පෙර ලංකාවේ මුළු ලුණු නිෂ්පාදනයෙන් 2 .6% ක් වූ මන්නාරම ලේවායේ නිෂ්පාදනය 2012 වසරරේදී 5% දක්වා වර්ධනය වී ඇත. 2012/13 වසර අවසන් වන විට මෙට්‍රික් ටොන් 4,527 ක ලුණු නිෂ්පාදනය කර ඇත. 2013/14 මුදල් වර්ෂයේ දෙසැම්බර් මස අවසාන විටදී මෙට්‍රික් ටොන් 3,819 ක නිෂ්පාදනයක් කර ඇත.

## වෙම්මනි ලේවාය

වෙම්මනි ලේවායේ මුළු බිම් ප්‍රමාණය වන අක්කර 200 ක් අක්කර 80 ප්‍රමාණයක ලුණු නිෂ්පාදනය සිදුවේ. පවතින සම්පත් උපයෝගී කරගෙන නිෂ්පාදනය සිදුවිය. නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගි වන සියලුම සේවකයින්ගේ උපරිම ශ්‍රමය හා කැපවීම මත පසුගිය වසර ගණනාවක නිෂ්පාදනය සිදුවිය. නමුත් පවත්නා සම්පත් තුළින් අපේක්ෂිත නිෂ්පාදනය කරා ළඟාවීය නොහැකිය. මෙම හේතුව මත ලේවාය පසුගිය වසර ගණනාවකම පාඩු සහිතව පවත්වාගෙන යන ලදි. එබවින් 2012/13 වසරේ දී මෙම නිෂ්පාදන ක්‍රියාවලිය නවතාලීමටත් වෙනත් ව්‍යාපෘතියක් සඳහා ඇති හැකියාව සොයා බැලීමටත් තීරණය විය.

## 2013/14 මුදල් වර්ෂයේ ප්‍රගතිය

- **නිෂ්පාදනය**

| වසර | නිෂ්පාදනය | | |
|---|---|---|---|
| | මන්නාරම | වෙම්මනි | එකතුව |
| 2011/2012 | 4,147 | 135 | 4,282 |
| 2012/2013 | 4,527 | - | 4,527 |
| 2013/2014 (දෙසැ.දක්වා) | 3,819 | - | 3,819 |

- **විකුණුම්**

| වසර | නිෂ්පාදනය | | |
|---|---|---|---|
| | විකුණුම් (මෙ.ටො.) | ආදායම (රු.මි. ) | ලාභය(රු.මි.) |
| 2011/2012 | 4,016 | 43.5 | 3.8 |
| 2012/2013 | 3,801 | 38.5 | 0.8 |
| 2013/2014 (දෙසැ.දක්වා) | 3,771 | 42.7 | 3.8 |

- **මන්නාරම ලේවායේ සංවර්ධන කටයුතු**

සංවර්ධන කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමත මිලියන 25 ක මුදල වැය කර ලේවායේ සංවර්ධන කටයතු නිම කර ඇත.

- **කිලෝ 1 ප්‍රමාණයේ අයඩින් මිශ්‍ර ලුණු පැකට් කිරිම**

"රජ ලුණු" යන වෙළද නාමය යටතේ නිෂ්පාදිත ලුණු කිලෝ 1 ප්‍රමාණයේ අයඩින් ලුණු වශයෙන් වෙළෙඳ පොළට නිකුත් කර පැකට් 50, 000 ක සැපයුම් ඉලක්කය කරා ළඟා වී ඇත. ඉල්ලුම වර්ධනය වී ඇත.

- **තත්ත්ව පාලනය**

"රජ ලුණු" සඳහා SLS ප්‍රමිති සහතිකය ලබා ඇත.

- **මූල්‍ය තත්වය**

  මාන්තායි සෝල්ට් සමාගම ලාභ උපයන ආයතනයක් වන අතර, ආයතනයේ නිෂ්පාදන හා විකුණුම් ක්‍රියාවලියේ ලාභයෙන් මුදල් අමාත්‍යාංශය වෙත ලාභාංශ ගෙවා ඇත .

# ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය

### හැඳින්වීම

ශ්‍රී ලංකාව තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා දිරි දෙමින් ඒවා ප්‍රවර්ධනය කරමින් හා පහසුකම් සපයමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වර්ධනය, ප්‍රසාරණය හා සංවර්ධනය තහවුරු කිරීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ කාර්යභාරයයි.

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වූ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා මූලික පියවර ගැනීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ඒ පිළිබඳ විචාරණය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යයක් වේ. ඒ අනුව 2013 වසරේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි මැදිහත් වීම මත පහත සඳහන් පියවර ගන්නා ලදී.

- **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය**

මෙම වැඩසටහන GIZ ව්‍යාපෘතිය ශ්‍රී ලංකා රජය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ආරම්භ කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම මෙම වැඩසටහනෙහි අරමුණයි. මේ සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමෙහි ක්‍රියාවලියෙහි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය නියැලී සිටී. මේ සඳහා GIZ ව්‍යාපෘතිය යටතේ කමිටුවක් ස්ථාපිත කරනු ලැබූ අතර එමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා වූ ජාතික ප්‍රතිපත්තියෙහි මූලික කෙටුම්පත සකස් කරන ලදී.

- **ජාතික මානව සම්පත් සහ රැකී රක්ෂා ප්‍රතිපත්තිය**

මානව සම්පත් පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍යාංශ කාර්යාලය මගින් ඉහත ප්‍රතිපත්තිය දියත් කරනු ලැබූ අතර මේ සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි ක්‍රියාකාරී දායකත්වය සපයන ලදී. 2013 වසරේ මුල් භාගයේදී මෙම ප්‍රතිපත්තිය හඳුන්වා දුන් අතර, එහි පාර්ශව කරුවන් සමග ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා මානව සම්පත් සංවර්ධනයෙහි අවශ්‍යතාව සහ එම අංශය තුළින් සිදුවන රැකියා ජනනය පිළිබඳව වූ යෝජනා ඉහත ප්‍රතිපත්තිය සඳහා ඇතුලත් කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කටයුතු කරන ලදී.

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය තෝරා ගනු ලැබූ අතර ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි එක් කොටස් කරුවෙකු ලෙස තෝරා පත් කර ගන්නා ලදී.

### දිස්ත්‍රික් ව්‍යවසාය සංසද වැඩසටහන

ව්‍යවසායකයින් සඳහා ව්‍යාපාරික සේවා සැපයීම අරමුණු කරගෙන දිස්ත්‍රික් ව්‍යවසාය සංසද ස්ථාපිත කරන ලදී. මෙම වැඩසටහන දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා රජයේ සහ රාජ්‍ය නොවන ව්‍යාපාරික සේවා සපයන්නන්, සැපයුම්කරුවන්, වාණිජ මණ්ඩල හා දිස්ත්‍රික්කයේ වෙළඳ හෝ ව්‍යාපාර සංගම් සහභාගි වේ.

### ව්‍යාපාරික සේවා සපයන්නන්ගේ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම සහ ව්‍යාපාරික සේවා සපයන්නන් ශක්තිමත් කිරීම

ව්‍යවසායකයින්ට අවශ්‍යය සේවා සැපයීම සඳහා ව්‍යාපාරික සේවා සපයන ආයතන ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි. අලෙවිකරණය, තාක්ෂණ සංවර්ධනය හා හුවමාරුව, මූල්‍යමය සහයෝගය සැපයීම ව්‍යවසායකත්ව සංවර්ධනය, තොරතුරු තාපණය යන අංශ තුළින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය සඳහා මෙම ව්‍යාපාරික සේවා සපයන ආයතන ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි.

- ව්‍යාපාරික සේවා සපයන්නන්ගේ අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කිරීම.
- ව්‍යාපාරික සේවා සපයන ආයතන ශක්තිමත් කිරීම.

2013 වසරේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මෙම නාමාවලියෙහි මුද්‍රණ කටයුතු අවසන් කරන ලද අතර එය ජාතික මට්ටමින් හඳුන්වා දීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව පළාත් මට්ටමින් මෙම නාමාවලිය හඳුන්වා දීමේ වැඩසටහන් 02 ක් මධ්‍යම සහ දකුණු පළාත් තුළ ක්‍රියාත්මක කරන ලදී.

**ආංශික සංවර්ධන වැඩසටහන**

- **මල් වගා අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන - වයඹ පළාත**

මේ යටතේ ප්‍රදේශීය සංවර්ධන ආර්ථික වාසිය (LOCA) වැඩසටහනක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව වයඹ පළාත තුළ එක් තරගකාරී ව්‍යාපාරික අංශයක් වශයෙන් මල් වගාව හඳුනා ගන්නා ලදී. මෙම ව්‍යාපාරික අංශය හඳුන්වා දීමේ වැඩමුළුවක් මල් වගාකරුවන්ගේ සංගමේ, අපනයනකරුවන්, සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ඉහත ආයතන හා බැංකු නියෝජිතයන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කරන ලදී. මෙම කමිටුව තුළ සිදුකළ සාකච්ඡා හරහා මල් වගා අංශය මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට හැකි විය.

2013 වසරේදී ප්‍රතිලාභීන් 68 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ලබා දෙන ලදී. මෙහිදී මල් වගාකරුවන්ගේ ව්‍යවසායකත්ව දැනුම සහ කුසලතා ඉහළ නැංවීමටත් තාක්ෂණික පුහුණුව ලබා දීමටත් හැකි විය. එමෙන්ම වගාකරුවන්ගේ අලෙවිකරණ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා එක් දින පුහුණු වැඩමුළුවක් ක්‍රියාත්මක කරන ලදී.

මීට අමතරව මෙම ආංශික සංවර්ධන වැඩසටහන යටතේත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කිරි ගොවීන් 30 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහනක් වන්නිගම පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

**දිවි නැගුම ජාතික වැඩසටහන**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ආරාධනය පරිදි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය දක්වයි. මෙම ගෘහ කර්මාන්ත සංවර්ධන වැඩ සටහන යටතේ තෝරා ගත් ප්‍රතිලාභින් සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම, බැංකු සායන පැවැත්වීම, යන්ත්‍රෝපකරණ ලබා දීම සහ පසු විපරම් කටයුතු සිදු කරයි. මීට අමතරව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය සමග එක්ව හඳුන්කූරු නිෂ්පාදනය ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් දිවිනැගුම ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ අනුව, 2013 වසරේදී පහත සඳහන් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| **දිස්ත්‍රික්කය** | **පුහුණු කරන ලද ප්‍රතිලාභින් ගණන** |
|---|---|
| ගාල්ල | 75 |
| මාතර | 296 |
| කුරුණෑගල | 262 |
| මාතලේ | 98 |
| නුවරඑළිය | 106 |
| මුලතිව් | 72 |
| මඩකලපුව | 214 |
| **මුළු එකතුව** | **1124** |

- **හඳුන්කුරු නිෂ්පාදන වැඩසටහන**

**2013 වසරේදී ක්‍රියාත්මක කළ තාක්ෂණික පුහුණු වැඩසටහන්**

| ස්ථානය | සහභාගී වූ අය | නව ව්‍යාපාර | පවතින ව්‍යාපාර | නිකුත්කල ණය | මුදල (රු.මි.) | ණය ඉල්ලීම | ප්‍රතිලාභීන් ඉල්ලූම් කළ මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|
| මීගමුව | 35 | - | 35 | - | - | 27 | 2.700 |
| පානදුර | 27 | | 27 | 27 | 1.350 | - | - |
| හොරණ | 30 | - | 30 | 10 | 2.425 | 1 | 7.000 |
| කැබිතිගොල්ලෑව | 40 | - | 40 | 02 | 0.150 | - | - |
| තෝඩුවාවල | 30 | - | 30 | 01 | 0.250 | 02 | 0.450 |
| ගම්පහ | 30 | 01 | 29 | 04 | 1.350 | 02 | 0.500 |
| පිළියන්දල | 29 | - | 10 | 30 | 16.211 | - | - |
| අම්බලන්ගොඩ | 33 | - | 33 | - | - | 02 | 1.775 |
| මහනුවර (පිළිමතලාව) | 30 | 03 | 26 | 26 | 3.465 | 03 | 0.275 |
| පොල්ගහවෙල | 30 | 08 | 22 | 22 | 2.975 | 07 | 0.850 |
| වෙන්නප්පුව | 28 | 01 | 27 | 27 | 8.6401 | 01 | 0.100 |
| පොළොන්නරුව (කැකිරාව) | 30 | 07 | 23 | 19 | 3.675 | 10 | 1.000 |
| කන්තලේ | 33 | 08 | 25 | 25 | 2.100 | 08 | 0.800 |
| යාපනය | 28 | - | 28 | 27 | 3.2192 | 02 | 25.000 |
| මහනුවර | 40 | - | 40 | 31 | 229.780 | 06 | 12.700 |
| ගල්කිස්ස | 42 | 02 | 40 | - | - | - | - |
| **එකතුව** | **542** | **30** | **512** | **251** | **275.6** | **70** | **53.1** |

## නව ව්‍යාපාර ඇති කිරීම සහ විස්තාරණය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා මූල්‍ය ආයතන හා එක්ව ප්‍රතිලාභීන් තෝරා ගන්නා අතර මේ සඳහා ව්‍යවසායකත්ව කුසලතා, හැකියාවන් සහ අත්දැකීම් ආදී නිර්නායක භාවිතා කෙරේ.

තෝරා ගන්නා ප්‍රතිලාභීන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු දිස්ත්‍රික් මට්ටමින් ලබා දෙන අතර අවශ්‍යතාවය අනුව තාක්ෂණික පුහුණු ලබා දීමට කටයුතු කරනු ලැබේ. බැංකු ආයතන මගින් අවශ්‍යය මූල්‍ය පහසුකමේ සපයනු ලබන අතර පසු විපරම් කටයුතු බැංකු සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා එක්ව සිදු කෙරේ.

ඒ අනුව 2013 වසරේදී පහත සඳහන් ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ක්‍රියාත්මක කල අතර බැංකු ණය ලබා දීමට කටයුතු කරන ලදී.

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | හඳුනාගත් ප්‍රතිලාභීන් | තාක්ෂණික පුහුණුව ලැබූ ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| **බදුල්ල** | මීගහකිවුල | 28 | - |
| **මාතර** | හක්මන | 38 | - |
| **කොළඹ** | මොරටුව | 50 | 45 |
| **කළුතර** | බුලත්සිංහල | 41 | 41 |
| | පානදුර | 74 | 21 |
| | හොරණ | 57 | 57 |
| | අගලවත්ත | 30 | 30 |
| **කුරුණෑගල** | කුලියාපිටිය | 41 | 36 |
| **කෑගල්ල** | වරකපොළ | 27 | 30 |
| | රඹුක්කන | 30 | 36 |
| | රුවන්වැල්ල | 30 | - |
| **මාතලේ** | මාතලේ | 20 | 20 |
| **ගම්පහ** | අත්තනගල්ල | 31 | 31 |
| **මුළු ප්‍රතිලාභීන්** | | | **347** |

## කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ කාන්තාවන් බහුතරයක් රැකියා වියුක්ත හෝ ආර්ථික වශයෙන් අක්‍රිය කොටසක් ලෙස සැලකිය හැක. ඔවුන් ව්‍යවසායකත්ව සඳහා යොමු කරවීම. කාන්තා ව්‍යවසායකයින් නගා සිටුවීම කාන්තාවන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ගේ හා ඔවුන් සමග සේවය කරන සේවකයන්ගේද ආර්ථිකය නගා සිටුවීමට උපකාරී වේ. මෙය සැලකිල්ලට ගනිමින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ව්‍යවසායකත්වය සඳහා කාන්තාවන් උනන්දු කරවීමත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ඔවුනගේ දායකත්වය ඉහළ නැංවීමත් අරමුණු කොටගෙන කාන්තාවන් සඳහා

ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**මෙම වැඩසටහනෙහි විශේෂිත අරමුණු,**

- වෙළඳ පොළ පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීම

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, කාන්තා වාණිජ මණ්ඩල හෝ කාන්තාවන් සඳහා සේවා සපයන සංවර්ධන පදනම් හරහා මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රතිලාභීන් තෝරා ගැනීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි උපදේශනය මත කාන්තා වාණිජ මණ්ඩල හරහා සිදු කරනු ලැබේ.

තවද කාන්තා වාණිජ මණ්ඩල වල සහයෝගය මත කාන්තා ව්‍යාපාරික සංගම් පිහිටු වනු ලැබේ. මෙම සංගම් හරහා කාන්තා ව්‍යවසායකයින්ට අවශ්‍ය වෙළඳපොල සම්බන්ධීකරණය, මූල්‍ය සහයෝගය සහ අනෙකුත් ව්‍යාපාරික සංවර්ධන සේවා ලබා දීමට අවශ්‍යය පියවර ගෙන ඇත.

එමෙන්ම, කාන්තා ව්‍යවසායකයින්ගේ අවශ්‍යයතාවය මත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපාරික සංගම් ඇති කිරීම සඳහා එක් දින පුහුණු වැඩමුළුවක් හා දෙදින ව්‍යාවසායකත්ව සංවර්ධන පුහුණු වැඩමුළුවක් ක්‍රියාත්මක කරනු ලැබේ. තාක්ෂණික දැනුම හා කුසලතාවයන් වැඩි දියුණු කිරීම සඳහා එක්දින හෝ දෙදින තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

තවද මෙම කාන්තා ව්‍යාපාරික සංගම් මූල්‍යය ආයතන හා සම්බන්ධීකරණය කිරීමෙන් අවශ්‍යය මූල්‍යය පහසුකම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. පසු විපරම් කටයුතු සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මෙම කාන්තා ව්‍යාපාරික සංගම් හා එක්ව කටයුතු කරයි. එමෙන්ම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙහි මාර්ගෝපදේශනය මත කාන්තා ව්‍යවසායකයින් සඳහා අවශ්යය සේවා ලබා දීම ව්‍යාපාරික සංගම් හරහා සිදු කෙරේ. 2013 වසරේදී හම්බන්තොට, මොණරාගල, කුරුණෑගල, සහ මහනුවර යන දිස්ත්‍රික්ක මෙම වැඩසටහන තෝරා ගන්නා ලදී.

ඒ අනුව කුරුණෑගල කාන්තා වාණිජ මණ්ඩලය හා එක්ව කාන්තා ව්‍යවසාය සංවර්ධන වැඩසටහනක් කි‍්‍රයාත්මක කරන ලද අතර මේ හරහා රූපලාවන්‍යය අංශයෙහි ව්‍යවසායිකාවන් 30 දෙනෙකු හඳුනා ගන්නා ලදී. ඔවුන්ගේ එකතුවෙන් කාන්තා ව්‍යාපාරික සංගමයක් පිහිටුවන ලද අතර මෙම සංගමය සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් හා තාක්ෂණික පුහුණුවක් ලබා දෙන ලදී. මහනුවර දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන මහනුවර කාන්තා වාණිජ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී ප්‍රතිලාභීන් 30 දෙනෙකු තෝරා ගැනීමෙන් අනතුරුව ව්‍යාපාරික සංගමයක් පිහිටුවන ලදී. එම ව්‍යාපාරික සංගමය සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් හා තාක්ෂණික පුහුණුවක් ලබා දීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබීය. මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුළින් ප්‍රතිලාභීන් 30 බැගින් තෝරා ගන්නා ලද අතර එම කාන්තා ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු සහ තාක්ෂණික පුහුණු ලබා දිමට හැකි විය.

**වෘත්තීය පුහුණු තුළ නියැලෙන තරුණ පිරිස් සඳහා වූ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන**

සංඛ්‍යාලේඛණ වලට අනුව ශ්‍රී ලංකාවේ තරුණයින්ගේ ප්‍රතිශතය මුළු ජනගහනයෙන් 18.5% ක් පමණ වේ. වර්තමානයෙහි විරැකියාව 7.1% ක් වන අතර මින් 22% ක් නියෝජනය කරනු ලබන්නේ අවුරුදු 16 ත් 24 ත් අතර තරුණ පිරිසයි. මීට අමතරව වාර්ෂිකව 500,000 ක් පමණ පිරිසක් සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය නොලබා පාසැල් අතහැර යන අතර මින් වයස 15 ත් 19 ත් අතර වන 90,000 ක පමණ පිරිසක් රැකියා වෙළඳ පොළට පිවිසේ. එමෙන්ම 196, 000 ක පමණ තරුණ පිරිසෙන් වාර්ෂිකව උසස් පෙළ අධ්‍යාපනය නිම කරයි. මේ හේතුවෙන් ශ්‍රී ලංකාව දශක ගණනාවක සිට මෙම තරුණ පිරිස් සඳහා රැකියා ලබා දිමේ අභියෝගයට මුහුණ දී සිටී. මෙම තරුණ පිරිස් සඳහා ව්‍යවසායකත්වය සඳහා සුදුසු පරිසරයක් නිර්මානය කිරීම වර්ථමානයේ ප්‍රධාන අවශ්‍යතාවක් බවට පත්ව ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ මේ සඳහා අවශ්‍ය ප්‍රවිශ්ටය ලබා දී ඇත. 2013 ක්‍රියාකාරී සැලැස්මට අනුව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය වෘත්තීය පුහුණු තුළ නියැලෙන තරුණ පිරිස් අතර ව්‍යවසායකත්ව සංස්කෘතියක් ඇති කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කොට ඇත.

ව්‍යවසායකත්ව සංස්කෘතියක් ඇති කිරීම රටක ආර්ථික සංවර්ධනයෙහි දිගුකාලීන අරමුණක් වන අතර මේ සඳහා ස්වයං රැකියා, කුඩා ව්‍යාපාර යන සංකල්පයන්ගෙන් ඔබ්බට ක්‍රියා කල යුතු වේ.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ඉහත වැඩ සටහනල වෘත්තීය පුහුණු ආයතන, තාක්ෂණ අධ්‍යාපන සහ මූල්‍යය ආයතන සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබයි. මේ හරහා තරුණ පරපුර තුළ ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කෙරෙන අතර නව ව්‍යාපාර අවස්ථා ඇති කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම, නව තාක්ෂණය හඳුන්වා දීම, ව්‍යාපාර උපදේශනය සැපයීම සිදු කෙරේ.

මෙහි ඉලක්ක කණ්ඩායම ලෙස වෘත්තීය පුහුණු ආයතන හා තාක්ෂණ විද්‍යාල තුළ අවසන් වසර සිසුන් හා එම ආයතන වල අධ්‍යාපනය නිම කළ සිසුන් අතරින් ප්‍රතිලාභීන් 30 දෙනෙකු තෝරාගනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ තෝරාගත් ප්‍රතිලාභින් සඳහා දින 02 ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවක් සැපයීම සිදු කෙරෙන අතර මෙහිදී ඔවුන් තුළ, මෙම පිරිස තුල ව්‍යවසායකත්ව සංවර්ධන කුසලතා ඉහළ නැංවීම සඳහා පුහුණු කිරීම ඉතා වැදගත් වන අතර එය ඔවුන් තුල පවතින විභවතාවක් මෙන්ම අනාගත අරමුණු නිවැරදිව හඳුනා ගැනීම සඳහා උපකාර වේ.

- ව්‍යවසායකයකු ලෙස ආත්ම විශ්වාසය ගොඩ නැගීම
- මූල්‍ය සාපෙරතාව වැඩි දියුණු කිරීම
- ව්‍යාපාර සැලසුම්කරණ හා කලමණාකරන කුසලතාවය ඉහළ නැංවීම සිදු කෙරේ

යෝජිත ව්‍යාපාර සැලසුම් සඳහා බාහිර මූල්‍ය ප්‍රභවයක් අවශ්‍ය වන විටදි ඒ සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මැදිහත් වන අතර අදාළ ව්‍යාපාර සැලසුම් මූල්‍ය ආයතන හෝ රජයේ මූල්‍යාධාර ව්‍යාපෘති සමග සම්බන්ධීකරණය කිරීම තුළින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙනු ලැබේ. පසු විපරම් කටයුතු වෘත්තීය පුහුණු ආයතන හෝ තාක්ෂණික විද්‍යාල හරහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලබයි.

2013 වසරේදී කුරුණෑගල සහ කුලියාපිටිය තාක්ෂණ විද්‍යාල තුළ සිසුන් 60 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ක්‍රියාත්මක කරන ලදී.

**තාක්ෂණ හුවමාරු වැඩසටහන**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, කාර්මික තාක්ෂන ආයතනය හා ඒකාබද්ධව ඔමෙගා 3 සහ DHA බහුල නිෂ්පාදන තාක්ෂණ ව්‍යවසායකයෙකු සඳහා ලබා දීමට කටයුතු කල අතර මෙය වෙළඳපොළට හඳුන්වා දීම උත්සවාකාරයෙන් සිදු කරන ලදී.

**පර්ෂද සංවර්ධන වැඩසටහන**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් කිසියම් භූගෝලීය ප්‍රෙදේශයක අගයදාම ක්‍රියාවලියක පර්ෂද වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යවසායකයින් හඳුනාගන්නා අතර මෙම ව්‍යසායකයින් ව්‍යාපාර පර්ෂද ලෙස සංවර්ධනය කිරීම සිදු කරයි. ඉතා ඉහළ සංවර්ධන විභවතාවක් පෙන්වන ව්‍යාපාර පර්ෂද තෝරා ඉදිරියේදී මෙම පර්ෂද ආර්ථික කලාප ලෙස සංවර්ධනය කිරීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය එහි පනතට අනුව බලාපොරොත්තු වේ.

වෙළඳපොළ සංවර්ධනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, තාක්ෂණ හුවමාරුව, මූල්‍යය සහයෝගය සැපයීම තුළින් මෙම පර්ෂද ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාපාර පර්ෂද ලෙස සංවර්ධනය කෙරේ.

මීට අමතරව මෙම පර්ෂද දේශීය මෙන්ම විදේශීය ව්‍යාපාර සමග ව්‍යාපාරික සම්බන්ධතා ඇති කිරීම සිදු කරනු ලැබේ.

ඒ අනුව, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් 2013 වසරේදී පහත සඳහන් පර්ෂද හඳුනා ගන්නා ලදී.

- හස්ත කර්මාන්ත පර්ෂදය – මොණරාගල
- ලුහු ඉංජිනේරු පර්ෂදය – කුරුණෑගල
- කොහු පර්ෂදය – වයඹ පළාත

ඉහත පර්ෂද සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර මෙය අදියර තුනකින් ක්‍රියාත්මක කරන ලදී.

**ප්‍රථම අදියර**

සෑම පර්ෂදයක් සඳහාම එහි පාර්ෂවකරුවන් සමග හඳුන්වා දීමේ වැඩමුළු පැවැත්වීම.

**දෙවන අදියර**

අදාළ ආයතන සමග ඒකාබද්ධ වෙමින් සෑම පර්ෂදයක් සඳහාම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීම.

**තෙවන අදියර**

ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

**2013 වසරේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.**

***හස්ත කර්මාන්ත පර්ෂදය – මොණරාගල***

- හඳුන්වා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපාරික ගැටළු හඳුනා ගන්නා ලදී.
- ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් 08 ක් ප්‍රතිලාභීන් 280 දෙනෙකු සඳහා ක්‍රියාත්මක කරන ලදී.

***ලුහු ඉංජිනේරු පර්ෂදය – කුරුණෑගල***

- හඳුන්වා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- ප්‍රතිලාභීන් 106 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු වැඩමුළු පවත්වන ලදී.

***කොහු පර්ෂද වැඩසටහන වයඹ පළාත***

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ආදර්ශ කොහු මෝල් ලෙස සංවර්ධනය සඳහා කොහු මෝල් 4 ක් තෝරා ගන්නා ලදී. එමෙන්ම ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර වයඹ වාණිජ මණ්ඩලය මගින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශනය මත ක්ෂේත්‍ර නිරීපණය සිදු කරන ලදී.

**දැයට කිරුළ ජාතික වැඩසටහන**

**2013/2014 වසරේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

සෑම දිස්ත්‍රික්කයක් තුලින්ම නව හෝ පවතින ව්‍යාපාර 40 බැගින් තෝරා ගැනීම සහ ව්‍යාපාර කළමණාකරනය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පැවැත්වීම. (එක් දිස්ත්‍රික්කයක වැඩ සටහන් දෙකක් ක්‍රියාත්මක කරනු ලැබේ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රදේශයේ අනෙකුත් ව්‍යාපාර සේවා සපයන ආයතන හරහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

අවශ්‍යතාවය අනුව තාක්‍ෂණ පුහුණු ලබාදීම (පුහුණු දින ගණන අවශ්‍යතාවය අනුව තීරණය කරනු ලැබේ)

ඉහත තෝරාගත් ව්‍යාපාරිකයන් අතුරින් ප්‍රතිලාභීන් 10 දෙනෙකු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට රු.30,000.00 බැගින් මූල්‍යාධාර ලබාදීම

අවශ්‍යතාවය අනුව මූල්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමෙන් අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා සහයෝගය දැක්වීම

ප්‍රදේශයේ සිටින ව්‍යාපාර සේවා සපයන ආයතන හරහා පසු විපරම් කටයුතු සිදු කිරීම

මීට අමතරව මල් වගා අංශයේ නිරත ප්‍රතිලාභීන් 200 දෙනෙකු සඳහා ව්‍යාවසායකත්ව සංවර්ධන පුහුණු ක්‍රියාත්මක කරන ලදී.

**ව්‍යවසායකයින් හා ව්‍යාපාරික සංගම් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් තාක්‍ෂණ හුවමාරු වැඩසටහන් සහ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. වර්ථමානයේදී ආදායම් උත්පාදන ක්‍රියාවලි තුල නිරත වන බොහෝ දෙනා තුල ව්‍යවසායකත්ව සහ තාක්‍ෂණික කුසලතාවයන් නොමැත. මෙම හේතුව නිසා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විවිධ පළාත් තුල සිටින ව්‍යවසායකයින්ගේ තාක්‍ෂණික දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන් ජාතික හා දිස්ත්‍රික් වාණිජ මණ්ඩල හරහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

**වැඩසටහනෙහි අරමුණු,**

- ඉල්ලුමට අනුව නව නිෂ්පාදන බිහි කිරීම
- ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම
- රැකියා අවස්ථා ඇති කිරීම

2013 වසරේදී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

| ක්‍රියාත්මක කල වැඩසටහන | ප්‍රදේශය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| ව්‍යාපාර සැලසුම් සකස් කිරීම | අනුරාධපුරය | 26 |
| කණ්ඩායම් ගොඩනැගීම | රත්නපුරය | 32 |
| කණ්ඩායම් ගොඩනැගීම | අම්පාර | 30 |
| මානව සම්පත් කළමණාකරණය | හම්බන්තොට | 24 |

| | | |
|---|---|---|
| මූලික ගිණුම් තැබීම හා පොත් තැබීම | අනුරාධපුරය | 26 |
| මානව සම්පත් කළමණාකරණය | අනුරාධපුරය | 25 |
| කණ්ඩායම් ගොඩනැගීම | කුරුණෑගල | 28 |
| අලෙවිකරණය හා ගණුදෙනුකරුවන් | අනුරාධපුරය | 27 |
| **මුළු එකතුව** | | **218** |

**දේශීය ව්‍යාපාර ජාත්‍යන්තරීකරණය කිරීම සහ ව්‍යවසායකයන්ට නව තාක්‍ෂණය සහ අමුද්‍රව්‍ය වෙත පිවිසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට ඉහත වැඩසටහන ඇතුලත් වන අතර ඒ අනුව ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ව්‍යවසායකයින් යොමුකිරීම තුලින් ජාත්‍යන්තර ව්‍යාපාරික පරිසරය පිළිබද අවබෝධයක් ලබා ගැනීම සඳහා ඔවුනට අවස්ථාව ලබාදීමත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජාත්‍යන්තරීකරණය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමත් අරමුණු වේ.

**සුළු හා මධ්‍යය පරිමාණ අංශය සඳහා ඇති ප්‍රතිලාභ**

- ව්‍යවසායකයින් හට ජාත්‍යන්තර ව්‍යාපාරික පරිසරය පිළිබද අවබොාධයක් ලබා දීම (තාක්‍ෂණය, යන්ත්‍රෝපකරණ, අමුද්‍රව්‍යය සහ නිෂ්පාදන වල ගුණාත්මක ලක්‍ෂණ ආදිය)
- වෙළඳපොල සම්බන්ධතා සහ ජාත්‍යන්තර වෙළඳ සබඳතා ඇතිකිරීම.
- ව්‍යවසායකයින් ආනයන හා අපනයන ක්‍රියාවලි තුල නියැලීම ප්‍රවර්ධනය කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර ආයෝජකයින් ගොඩනැංවීම සහ හඳුන්වා දීම.
- දේශීය ව්‍යාපාරිකයින් අතර සහ සම්බන්ධතාවය වැඩි කිරීම.

2013 වසරේදී බැංකොක් වෙළඳ ප්‍රදර්ශණය සඳහා ව්‍යාපාරිකයින් 15 දෙනෙකු සහභාගී කිරීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබීය.

**විද්‍යුත් මාධ්‍ය හරහා ව්‍යවසාකත්ව අධ්‍යාපනය ලබාදීම. (රූපවාහිනී අධ්‍යාපන වැඩසටහන්)**

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි. මෙම අංශය සංවර්ධනය දුප්පත් බව තුරන් කිරීම සඳහා මෙන්ම විරැකියාව සඳහාද ඉතා හොඳ විසඳුමක් වේ. ශ්‍රී ලංකාවේ බහුතරයක් ජනගහනය ග්‍රාමීය ප්‍රදේශ තුල ජීවත් වන අතර මෙය සමස්ථ ජනගහනයෙන් 78 ක් පමණ වේ. ප්‍රාදේශීයව ක්‍රියාත්මක වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් රැකියා ජනනය සඳහා මෙන්ම මෙම අංශයේ සංවර්ධනය සඳහා වැදගත් වේ. කෙසේ වුවද වෙනත් රටවල් හා සංසන්දනය කර බැලීමේදී ආර්ථික සංවර්ධනය සඳහා මෙම අංශයෙහි දායකත්වය අපේක්‍ෂිත මට්ටම කරා ලඟා වී නොමැත.

මේ හේතුවෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ආරම්භයේ සිටම සුළු හා මධ්‍යය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය සඳහා විවිධ පියවර ගන්නා ලදී. 2013 ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ව්‍යවසායකත්ව අධ්‍යාපන වැඩසටහනක් ජාතික රූපවාහිනී සංස්ථාව හරහා ක්‍රියාත්මක කරනු ලැබිණ. මෙම වැඩසටහන විනාඩි 30 ක වැඩසටහනක් වන අතර මසකට වරක් විකාශනය කෙරේ. සෑම වැඩසටහනක්ම විශේෂිත මාතෘකාවක් යටතේ සංවාදාත්මක ලෙස ඉදිරිපත් වන අතර මේ සඳහා ව්‍යාපාරික සේවා සපයන ආයතන සහභාගී වෙයි. (උදා: ව්‍යාපාර ලියාපදිංචිය, නිෂ්පාදන වල ගුණාත්මකභාවය, අලෙවිකරණය, ඵලදායීතාවය ඉහළ නැංවීම) රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන වල නිළධාරීන් මෙම සංවාදය සඳහා සහභාගී වේ.

විද්‍යුත් මාධ්‍ය හරහා ව්‍යාපාරික දැනුම සහ තොරතුරු ඉතා කාර්යක්ෂම ලෙස ලබාදිය හැක. සිද්ධි අධ්‍යයන, ක්ෂේත්‍ර නිරීක්‍ෂණ මෙම වැඩසටහන සඳහා ඇතුලත් වේ.

**2013 වසරේදී ක්‍රියාත්මක කල අනෙකුත් වැඩසටහන්**

- සංවර්ධන නිළධාරීන් සඳහා ක්‍රියාත්මක කළ ධාරිතා සංවර්ධන වැඩසටහන්
- සංවර්ධන නිළධාරීන් සඳහා ක්‍රියාත්මක කළ පාර්ෂව කරුවන්ගේ වැඩමුළුව
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් - සංවර්ධන නිළධාරීන් හරහා ක්‍රියාත්මක කරන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මූල්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම - සංවර්ධන නිළධාරීන් හරහා ක්‍රියාත්මක කරන ලදී.
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද 03ක් පිහිටුවීම
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද 11 ක් පැවැත්වීම
- මීට අමතරව අනුග්‍රාහක ආයතන වල දායකත්වයෙන් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය - අනුග්‍රාහකත්වය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය
- පිත්තල නිෂ්පාදකයන් සඳහා වෙළඳපොළ සම්බන්ධීකරණ වැඩසටහන - අනුග්‍රාහකත්වය බෙලිඅත්ත ට්‍රේඩ් සෙලර් ඇහළුම් හල
- මත්ස්‍ය පසුඅස්වනු තාක්ෂණය පිළිබඳ දින තුනක තාක්ෂණික පුහුණු වැඩසටහන - අනුග්‍රාහකත්වය - දකුණ පළාත් සභාව
- දකුණු පළාතේ ව්‍යවසායකයින් සඳහා ක්‍රියාත්මක කල ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් (02) - අනුග්‍රාහකත්වය - දකුණ පළාත් සභාව
- දකුණු පළාතේ ව්‍යවසායකයින් සඳහා ක්‍රියාත්මක කල ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් (02) - අනුග්‍රාහකත්වය - කොමර්ෂල් බැංකුව
- මාතර දිස්ත්‍රික්කයේ සිල්ලර කඩ හිමියන් සඳහා ක්‍රියාත්මක කල ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන - අනුග්‍රාහකත්වය හේමාස් ආයතනය
- ගාල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් සඳහා ක්‍රියාත්මක කල ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන
- ගාල්ල දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් සඳහා ස්වර්ණාභරණ සහ LED බල්බ් නිෂ්පාදනය සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන - අනුග්‍රාහකත්වය - දකුණ පළාත් සභාව

# පේෂකර්මාන්ත සංවර්ධන අංශය

## හැඳින්වීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පේෂකර්මාන්ත සංවර්ධන අංශය මගින්, අත්යන්ත්‍ර පේෂකර්මාන්තය, බලවේග පේෂකර්මාන්තය, ඇඟළුම් කර්මාන්තයයන අංශයන්හි චිරස්ථිතිය අරමුණු කර ගනිමින් මානව සම්පත් සංවර්ධනය, ඵලදායිතාව හා තත්ව වර්ධනය සඳහා ප්‍රතිපත්ති උපායමාර්ග සම්පාදනය, වැඩ සටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීමට සිදු කරමින් මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා පෞද්ගලික අංශය පළාත්සභා සහ අනෙකුත් ප්‍රමුඛ ආයතන සමඟ එක්ව කටයුතු කරනු ලැබේ.

- **අත්යන්ත්‍ර පේෂකර්මාන්තය**

අත්යන්ත්‍ර පේෂකර්මාන්තය තාක්ෂණික, මූල්‍යමය සහ වෙළෙඳපොළ යන අංශයන් හරහා සංවර්ධනය කළ යුතුව ඇත. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයමගින් පේෂකර්මාන්ත සංවර්ධනය උදෙසා පත්කළ කාර්ය සාධන බලකාය මගින් පේෂකර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීම පිළිබඳ කරන ලද නිර්දේශයන් ප්‍රකාර අලෙවිකරණය, පුහුණුව, මෝස්තර නිර්මාණකරණය, නව තාක්ෂණය හා ව්‍යවසායකත්ව සංවර්ධනය යන අංශයන් වෙත වැඩි අවධානයක් යොමු කරමින් පේෂකර්ම සංවර්ධන වැඩපිළිවෙළ සකස් කරනු ලැබේ. අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත වන්නන් පහත පරිදි වේ.

- පෞද්ගලික අංශය - සමාගම්, ඒක පුද්ගල ව්‍යවසායන්, ස්වයං රැකියාවක් ලෙස නියුතු වූවන්
- රාජ්‍ය අංශය - පළාත්සභා මඟින් මෙහෙයවන නිෂ්පාදන මධ්‍යස්ථාන
- සමූපකාර සමිති

පේෂකර්මාන්තය පිළිබඳ කාර්ය සාධන බලකාය මගින් පේෂකර්මාන්තයේ තිරසාර සංවර්ධනය උදෙසා කරන ලද නිර්දේශ පදනම් කර ගනිමින් පේෂකර්මාන්ත සංවර්ධන අංශය මගින් සකස් කළ 2013 වර්ෂයට අදාල සංවර්ධන වැඩ පිළිවෙළ පහත පරිදි වේ.

අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන වැඩ සටහන් සඳහා 2013 වර්ෂය වෙනුවෙන් රු. මි. 90 ක් වෙන් වී ඇත. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම වැඩ සටහන යටතේද අත්යන්ත්‍ර පේෂ ගම්මාන ස්ථාපනය කිරීමේ වැඩ සටහන වෙනුවෙන් රු. මි. 30 ක් ලබා දී ඇත.

එක් එක් පේෂ මධ්‍යස්ථානයක් වෙනුවෙන් අත්යන්ත්‍ර 35ක් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර ඉන් 15ක් පුහුණු වැඩ සටහන් උදෙසාද, ඉතිරි 20 අදාල පේෂ ගම්මානය තුළ පුහුණුලාභීන්ට පුහුණුව අවසානයේ බෙදාදීම පිණිසද විය. එම අත්යන්ත්‍ර බෙදාදීමේදී ඊට අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය ඔවුන් වෙත ලබා දෙන ලදී. පේෂකර්මාන්ත පාදක කර ගනිමින් ගෘහාශ්‍රිත පේෂකර්මාන්ත 300 ක් ඇති කරමින් නව රැකියා අවස්ථා 300 ක් ඇති කරන ලදී (15 * 20 = 300).

### නියමු ව්‍යාපෘතිය

මේ යටතේ පළාත්සභා සමඟ එක්ව පහත දක්වා ඇති පරිශ්‍රයන්හි පේෂ ගම්මාන වැඩසටහන දියත් කර ඇත.

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|
| **බස්නාහිර** | කොළඹ | පාදුක්ක | අරුක්වත්ත |
| **නැගෙනහිර** | අම්පාර | කල්මුනේ | නත්පෙට්ටිමුනේ |
| **ඌව** | මොනරාගල | බුත්තල | ඔක්කම්පිටිය |
| **උතුර** | මන්නාරම | මන්නාරම | එරික්කිලම්පිට්ටි |
| **දකුණ** | හම්බන්තොට | අම්බලන්තොට | පොලියර්වත්ත |

**දිවිනැගුම ව්‍යාපෘතිය**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමග එක්ව දිවිනැගුම සංවර්ධන වැඩපිළිවෙළ යටතේ පහත දක්වා ඇති පරිශ්‍රයන්හි පේෂ ගම්මාන වැඩසටහන දියත් කර ඇත.

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ස්ථානය |
|---|---|---|---|
| **උතුරුමැද** | අනුරාධපුරය | පළුගස්වැව | නාමල්පුර |
| **සබරගමුව** | කෑගල්ල | රුවන්වැල්ල | දුනුමාල |
| **වයඹ** | පුත්තලම | නාත්තන්ඩිය | නාරවිල |
| **වයඹ** | කුරුණෑගල | වීරඹුගෙදර | කළුගමුව |
| **දකුණ** | ගාල්ල | අම්බලන්ගොඩ | ගලබොඩ |
| **බස්නාහිර** | කළුතර | බුලත්සිංහල | මහගම |
| **ඌව** | බදුල්ල | සොරණාතොට | කන්දෙගෙදර |
| **නැගෙනහිර** | මඩකලපුව | එරාවූර් | ඉයන්ගර්නි |
| **මධ්‍යම** | මහනුවර | මිණිපේ | අඹගහපැලැස්ස |
| **උතුර** | මුලතිව් | මැරිට්ටම්පත්තු | මුල්ලයාවෙලි |

පේෂකර්මාන්ත මධ්‍යස්ථානවල ඌණ උපයෝජන තත්වයේ ඇත් අත්යන්ත්‍ර අළුත්වැඩියා කිරීම යටතේ උතුර, මධ්‍යම, ඌව, සබරගමුව, බස්නාහිර, දකුණ හා වයඹ යන පළාත් සහා යටතේ ඇති පේෂකර්ම මධ්‍යස්ථාන වල ඌන උපයෝජන තත්වයේ ඇති අත්යන්ත්‍ර හඳුනාගෙන ඒවා අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

නිෂ්පාදන විවිධාංගීකරණය,නූල් ඊණ ගැන්වීම හා වර්ණ සිද්ධාන්ත පුහුණු පාඨමාලා පැවැත්වීමයටතේ පාඨමාලා 08ක් මඟින් 175 දෙනෙකුට පුහුණුව ලබා දීම.

වියන්නන් සහ පේෂ උපදේශිකාවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම යටතේ අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා පේෂකර්ම සංවර්ධන හා පුහුණු ආයතන හරහා ඉන්දියාවේ කේරළහි පේෂකර්ම පුහුණු ආයතනය සම්බන්ධ කර ගනිමින් අත්යන්ත්‍ර පේෂකර්මාන්තයට අදාළ මෝස්තර නිර්මාණකරණය හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ නේවාසික පුහුණු වැඩසටහනක් සඳහා පළාත් 09 නියෝජනය කරමින් 11 දෙනෙකු සහභාගි කරවීම

- **බලවේග පේෂකර්මාන්තය - රාජ්‍ය අංශයේ රෙදිපිළි අවශ්‍යතාවය සපුරාලීම**

බලවේග පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයේ රෙදිපිළි අවශ්‍යතාවය සපුරාලීම තුළින් පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට ස්ථාවර වෙළඳපොළක් සැපයීම සඳහා මෙම අංශය දේශීය රෙදිපිළි බෙදාහැරීමේ කමිටුව මගින් අවශ්‍ය මූලික කටයතු කරනු ලබයි. මේ යටතේ ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ජාතික ශිෂ්‍යභට බලකායන්හි නිල ඇඳුම් රෙදිපිළි අවශ්‍යතා සහ පාසල් නිල ඇඳුම් රෙදිපිළි අවශ්‍යතා දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් මගින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

***ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ජාතික ශිෂ්‍යභට බලකාය සහ පාසල් නිල ඇඳුම් සඳහා නිල ඇඳුම් අවශ්‍යතාවය - 2013***

| | අවශ්‍යතාවය (මීටර් /ඒකක) |
|---|---|
| ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා නිල ඇඳුම් අවශ්‍යතාවය | මීටර් 5,230,700<br>ඒකක/යුගල 1,981,504 |
| පාසල් නිල ඇඳුම් රෙදිපිළි අවශ්‍යතාවය | මීටර් 11,011,000 |

- **ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (PIP)**

2013 වර්ෂය තුල මේ සඳහා රු. මිලියන 5 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති අතර කර්මාන්තශාලා 12ක පුහුණු වැඩ සටහන් පවත්වා සේවාස්ථ පුහුණුව සහ උපදේශනය ලබා දී ඇත.

- **නිපුණතා සංවර්ධන සංවර්ධන වැඩසටහන (SME Skill Development Programme)**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබයි. සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් නිෂ්පාදකයන් සඳහා සුදුසු පුහුණු වැඩ සටහන් ලබා දීම මගින් ඔවුන්ගේ කළමනාකරණ සංවර්ධනය, නිෂ්පාදන හා තාක්ෂණික හැකියාව වැඩිදියුණු කරමින් තරඟකාරී හා නිසි කර්මාන්ත පරිසරයක් බිහි කිරීම මෙහි අපේක්ෂාවයි. 2013 වර්ෂය තුල මේ සඳහා රු. මිලියන 15 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති අතර පුහුණු වැඩ සටහන් 20ක් මගින් සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා 20ක සේවකයින් 845 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත.

- **ඇඟළුම් කර්මාන්තයේ දේශීය හා අන්තර්ජාතික ප්‍රතිරූපය වර්ධනය කිරීමේ වැඩසටහන (JAAF)**

පේෂකර්මාන්ත සංවර්ධන අංශය, ඒකාබද්ධ ඇඟළුම් සංවිධාන සංසදය සමග එක්ව ඇඟළුම් ක්ෂේත්‍රයේ අන්තර්ජාතික ප්‍රතිරූපය හා වෙළඳපොල ඉහළ නැංවීමේ වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී උසස් තත්ත්වයේ ඇඟළුම් සැපයුම්කරුවෙකු ලෙස ගෝලීය වෙළඳපොල තුල ශ්‍රී ලංකාව වෙත ගෝලීය පාරිභෝගිකයන්ගේ ආකර්ශණය දිනා ගැනීම උදෙසා වෙබ් අඩවි හා අලෙවිකරණ අවස්ථාවන් ද, සංසද හා සෘජු වෙළඳපොල අවස්ථාවන් ද ක්‍රියාත්මක කර ඇත. මේ සම්බන්ධයෙන් 2013 වසර සඳහා අමාත්‍යාංශය මගින් රු. මිලියන 15 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත.

- **ඇඟළුම් අපනයන සේවා අංශය**

මෙම අංශය මගින් අපනයන ඇඟළුම් නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගේ පහසුව පිණිස අපනයන ක්‍රියාවලියේදී අවශ්‍ය වන ලියකියවිලි නීත් රීත් පහසු කිරීමේ පරමාර්ථයෙන් සෘජුවම අන්තර්ජාලය හරහාඉදිරිපත්කිරීමට හැකි පරිගණක පද්ධතියක් ශ්‍රී ලංකා රේගුව සමඟ එක්ව හඳුන්වා දී ඇත. මේ මගින් අපනයනකරුවන්ට එම ක්‍රියාවලියේදී සිදු වූ සම්පත් නාස්තිය හා කාලය ගතවීම වළක්වා ඇත.මේ යටතේ,

**2013දෙසැම්බර් 31දිනට ප්‍රගතිය**

| | **වර්ෂය තුළ** |
|---|---|
| ලියාපදිංචි කරන ලද ඇඟළුම් කම්හල් සංඛ්‍යාව | 20 |
| ලියාපදිංචි කරන ලද ඇ ඇඟළුම් මිලදී ගැනීමේ හා සම්බන්ධීකරණ ආයතන සංඛ්‍යාව | 01 |
| නේවාසික වීසා නිර්දේශ ලබා දී ඇති විදේශිකයන් සංඛ්‍යාව | 42 |
| ලියාපදිංචි කරන ලද නිෂ්පාදකයන් නොවන ඇගළුම් අපනයනකරුවන් සංඛ්‍යාව | 06 |
| අපනයනකරුවන්ට අලෙවි කර ඇති යුරෝපා රටවල් සඳහා වන ප්‍රභව සහතික සංඛ්‍යාව | 29,000 |

**2013 දෙසැම්බර් 31දිනට ඇගළුම් අපනයන සේවා අංශය මඟින් අනුමත කරන ලද අපනයනවල ප්‍රගතිය**

| | **ඇගළුම් ප්‍රමාණය (දුසිම්)** | **වටිනාකම (ඇ.ඩො.මි.)** |
|---|---|---|
| ලියපදිංචි ඇඟළුම් නිෂ්පාදකයන් | 1,564,129.4 | 51,221,339.53 |
| නිෂ්පාදකයන් නොවන අපනයනකරුවන් | 105,059.8 | 3,067,783.99 |
| **එකතුව** | **1,669,189.2** | **54,289,123.52** |

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරි ඇති විෂයකි. ඒ අනුව, පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරි ඇත්තේ එම විෂයට අදාල ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාල සේවාවන් සැපයීමයි.

**2013 දෙසම්බර්31 දිනට ප්‍රගතිය පහත දැක්වේ**

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| ගොඩනැගිලි අළුත්වැඩියාව නල්ලූර් සහ ගැටඹේ පේෂකර්ම පුහුණු පාසල් ධාරිතා සංවර්ධනය හා නිපුනතා සංවර්ධනය | ගැටඹේ සහ නල්ලූර් පේෂකර්ම පුහුණු පාසල් වල අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර ඇත.<br>සිසුන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදී ඇත. |
| පේෂ පාසල් නිල ඇඳුම් | පෙර පාසල් සිසුන් 150ක් සඳහා නිල ඇඳුම් සපයා ඇත. |
| ජාතික අත්යන්ත්‍ර පේෂකර්ම ප්‍රදර්ශනය හා වෙළඳ සල්පිල - 2013 | 2013 මෙම ප්‍රදර්ශනය දෙසැම්බර් 17 සිට 19 දින දක්වා පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර ඇත. |
| පේෂකර්ම තාක්ෂණික ශිල්පීන් පුහුණු කිරිමේ වැඩසටහන | සිසුන් 138 දෙනෙකු බඳවාගෙන ඇත. |
| මෝස්තර නිර්මාණ ශිල්පීන් පුහුණු කිරිමේ වැඩසටහන | සිසුන් 24ක් දැනටමත් බඳවාගෙන ඇත. |
| පේෂකර්ම පාසල්වල සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරිමේ පුහුණු වැඩසටහන | පේෂකර්ම පාසල් 11ක සිසුන් සඳහා ඉංග්‍රීසි දැනුම ලබාදීම. |
| සේවාස්ථ පුහුණු වැඩසටහන | දෙපාර්තමේන්තු නිලධාරීන් පේෂ පාසල්වල නිලධාරීන් පේෂ පාසැල් සිසුන් සහ වෙනත් පුහුණුලාභීන් ඇතුළු 726 දෙනෙකු සඳහා පුහුණුව ලබා දි ඇත. |
| ප්‍රවර්ධන ක්‍රියාකාරකම් | දැයට කිරුළ 2013<br>පේෂකර්මාන්තඅමුද්‍රව්‍ය සැපයීම<br>මුලතිවු සහ මන්නාරම් ව්‍යපෘති ආරම්භ කිරීම<br>මඩම්පැල්ල ව්‍යාපෘතියේ තුන්වන අදියර ආරම්භ කිරීම<br>ජංගම සේවා සැපයීම යටතේ තාක්ෂණිකයින්ට අවශ්‍ය පුහුණු පහසුකම් සපයා ඇත. |
| අනෙකුත් ක්‍රියාකාරකම් | පේෂකර්ම පාසල් සඳහා අවශ්‍ය උපකරණ ලබාදී ඇත. |
| අත්යන්ත්‍ර රෙදි පිළි පුහුණු පාසල් වල විභාග | 2013 වසර සඳහා පේෂකර්ම පාසල් හි සිසුන් 151කට විභාග පවත්වා |

| | |
|---|---|
| පැවැත්වීම | ඇත. |
| අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් | පේෂකර්මාන්ත තොරතුරු යාවත්කාලීන කර ඇත.<br>පේෂකර්මාන්ත මෝස්තර ග්‍රන්ථ දෙකක් එළ කොට ඇත.<br>පේෂකර්ම නිෂ්පාදන ප්‍රචලිත කිරීම සඳහා ‘ගුරුගේ නේචර් පාර්ක්’ හි ප්‍රදර්ශන කුටියක් ඉදිකර ඇත.<br>වැලිකඩ බන්ධනාගාරය සඳහා අත්යන්ත්‍ර උපකරණ හා අවශ්‍ය පුහුණුව ලබාදී ඇත.<br>ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ප්‍රදර්ශනයක් මොණරාගල දී පැවැත්විය. එහිදී අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියුතු කාන්තාවන් ධෛර්යමත් කිරීමේ අරමුණින් ඔවුන්ට පහසුකම් සලසන ලදී.<br>මඩම්පැල්ල අත්යන්ත්‍ර සංවර්ධන (දෙවැනි අදියර) හි ප්‍රතිලාභීන් සඳහා අත්යන්ත්‍ර හා උපකරණ බෙදා දෙන ලදී.<br>අවශ්‍ය වැඩසටහන් සඳහා අත්යන්ත්‍ර මිලදීගෙන ඇත. |

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය

## හැඳින්වීම

රටක ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA ) වර්ෂ 2009 අංක 12 දරණ පනත යටතේ ස්ථාපිත කරන ලද අතර එහි ක්‍රියාකාරි මෙහෙයුම් 2009 ජූනි මස 15 වන දින සිට ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය, ශ්‍රී ලංකාවේ පේෂකර්ම, ඇඟළුම් සහ පාවහන් කර්මාන්තයට අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමේ ආයතන අතර ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි. පුහුණුවට අමතරව ආයතනය මඟින් උපදේශනය, තාක්ෂණික සේවා සහ පේෂකර්ම සහ ඇඟළුම් කර්මාන්තයට අවශ්‍ය පරීක්ෂණාගාර සේවා සපයනු ලබයි. ආයතනය මඟින් දිගුකාලීන ඩිප්ලෝමා, කෙටිකාලීන සහ කර්මාන්තශාලාවල අවශ්‍යතාවයන්ට අනුව පාඨමාලා මඟින් පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබාදේ. පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය (TT&SC ) සහ ඇඟළුම් කර්මාන්ත අභ්‍යාස ආයතනය (CITI ) යන ආයතන ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ගික තීරණය මඟින් මිනිස් සම්පත්, යන්ත්‍රෝපකරණ, ආයතනික ගොඩනැඟිලි කාර්‍යක්ෂමව ඵලදායි ලෙස භාවිතා කිරීම සිදුකර ඇත. තවද ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය එහි ආයතනික ව්‍යුහය ප්‍රතිසංවිධානය කර ඇති අතර ආයතනය තුල අංශ හයක් ව්‍යුහගත කර ඇත. එමඟින් පේෂකර්ම සහ ඇඟළුම් කර්මාන්තයේ ඇතිවන නව ව්‍යාපාරික අභියෝගයන්ට මුහුණදීමට පියවර ගෙන ඇත. ආයතනයේ කළමනාකාරිත්ව ව්‍යුහය තුලින් එක් එක් අංශවල කාර්යභාරය පැහැදිලි ලෙස නිර්වචනය කර තිබීම මඟින් ආයතනික ආදායම වැඩි කරගනු ලබයි.

## 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **පුහුණු කිරීම**

2013 වර්ෂය තුල පුහුණු කිරීමේ ක්‍රියාකාරකම්වල සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර ඒ සඳහා පේෂකර්ම හා ඇඟළුම් කර්මාන්තයේ සතුටුදායක තත්ත්වයද බලපා ඇත. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය මඟින් පවත්වනු ලබන ව්‍යුහගත පාඨමාලාවලට අමතරව මර්චන්ඩයිසින් ඩිප්ලෝමාව, රෙදිපිළි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සහ විලාසිතා නිර්මාණ හා නිෂ්පාදිත සංවර්ධනය සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාව ආයතනය විසින් හඳුන්වා දී ඇත. පූර්ණකාලීන ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රධානතම ව්‍යුහගත පාඨමාලාව ලෙස පවත්වා ගෙන යන අතර, එමඟින් පේෂකර්ම සහ ඇඟළුම් ක්ෂේත්‍රයට අවශ්‍ය කරනු ලබන මධ්‍යම මට්ටමේ තාක්ෂණික කළමනාකරුවන් බිහි කිරීම සඳහා පාඨමාලාව නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ 2013 ඩිප්ලෝමා පාඨමාලාවන් හි සහතික පත්‍ර ප්‍රදානය ඩිප්ලෝමාධාරීන් 194 දෙනෙකු සඳහා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී අප්‍රේල් මස පවත්වන ලදී.

මෙම කාල පරිච්ඡේදය තුල දීර්ඝකාලීන, කෙටිකාලීන සහ කර්මාන්තශාලා අවශ්‍යතා මත සැලසුම් කරන ලද පාඨමාලා 84 ක් පවත්වා ඇති අතර, එමඟින් 1061 ක් පුහුණුව ලබාගෙන ඇත. මේ සඳහා ශිෂ්‍යයන් සහ කර්මාන්තවල නියැලෙන්නන් සහභාගී වී ඇත. මෙම වර්ෂයේ පූර්ණකාලීන ඩිප්ලෝමාව මාර්තු මස ආරම්භකල අතර, ඒ සඳහා පූර්ණකාලීන ශිෂ්‍යයන් 60 දෙනෙකු බඳවා ගෙන ඇති අතර, ඔවුන් අධ්‍යයන කටයුතුවල නිරතව සිටී. දීර්ඝකාලීන පාඨමාලා වැඩිවීමත් සමග තාක්ෂණික කාර්ය මණ්ඩල සංවර්ධනය ද දේශීය හා විදේශීය වශයෙන් සිදු කර ඇත. මෙම කාලය තුල පුහුණුවෙන් ලද ආදායම රු. මිලියන 46.35 ක් වූ

අතර, එම ආදායම සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වී පසුගිය වර්ෂයට වඩා වැඩි බව පෙන්නුම් කෙරේ.

- **පර්යේෂණාගාර සේවා**

ISO 17025 තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් පර්යේෂණාගාරය පිළිගත හැකි තත්ත්ව මට්ටමේ පර්යේෂණාගාර සේවා රජයේ සහ පෞද්ගලික අංශවලට ලබාදීම සිදු කරනු ලබයි. පර්යේෂණාගාරය මෙම කාලය තුල භෞතික සහ රසායනික පරීක්ෂණ 60,965 ක් පරීක්ෂාවට ලක්කර ඇති අතර, එමඟින් රු. මිලයන 75.43 ක් උපයා ගෙන ඇත. මෙම පර්යේෂණාගාරය සම් සහ පාවහන් කර්මාන්තය සඳහා වූ පරීක්ෂණාගාර සේවා සැපයීම සඳහා පියවර ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීම ද සිදුකරනු ලබන අතර එමඟින් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහාය ද ලබාදේ.

- **උපදේශන සේවා සැපයීම**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති සඳහා තාක්ෂණික සහාය ලබාදේ. මේ සම්බන්ධයෙන් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ද සහායෝගීතාවය ලබාගෙන ඇත. මෙහි මුල් පියවරයන් ලෙස පුහුණුව සහ උපදේශන වැඩසටහන් වයඹ සහ නැගෙනහිර පළාත්වල පේෂකර්ම හා අත්යන්ත්‍ර කර්මාන්තයට ලබාදී ඇත. මෙයට අමතරව රෙදි තාක්ෂණය සහ කර්මාන්තශාලා ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපදේශනය රජයේ සහ පුද්ගලික අංශයේ කර්මාන්ත වෙත ලබා දී ඇත.

- **නිෂ්පාදන ඵලදායිතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඇඟළුම් අපනයනය කරන්නන්ගේ මණ්ඩලය, දේශීය ඇඟළුම් නිපදවන්නන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය, මෙම නිෂ්පාදන ඵලදායිතා වර්ධනය කිරීමේ වැඩ සටහනේ පාර්ශවකරුවන් වන අතර, මෙමඟින් කුඩා හා මධ්‍යම මට්ටමේ ව්‍යවසායකයන්ගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම කරනු ලැබේ. වසරේ පළමු හය මසක කාල සීමාව සඳහා කුඩා හා මධ්‍යම මට්ටමේ කර්මාන්තශාලා 7 ක් මෙම වැඩ සටහනට ඇතුලත් කරන ලද අතර, එම කර්මාන්තශාලාවලට උපදේශකවරුන් මඟින් නිෂ්පාදන කාර්යක්ෂමතාවය හා තත්වය වැඩි දියුණු කිරීම මඟින් දේශීය හා විදේශීය ඇඟළුම් නිපදවීමේ තරඟකාරීත්වයට එළඹීම සඳහා අවශ්‍ය උපදේශනය ලබාදෙනු ලැබේ. දෙවන මාස හයක කාලය සඳහා කුඩා හා මධ්‍ය මට්ටමේ කර්මාන්තශාලා 5ක් සඳහා අගෝස්තු මස ඇතුලත් කරගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය උපදේශනය ලබාදෙමින් සිටී. මෙම වැඩ සටහන සඳහා අමාත්‍යාංශය රු. මිලයන 15 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

- **නිපුණතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන**

කුඩා හා මධ්‍යම මට්ටමේ පේෂකර්ම සහ ඇඟළුම් කර්මාන්තශාලාවල සේවකයින්ගේ නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් මෙම පුහුණු වැඩසටහන සැලසුම් කර ඇත2013 වසර තුල පුහුණු වැඩසටහන් 14ක් කුඩා හා මධ්‍යම කර්මාන්තශාලාවල සහ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයෙහි පවත්වා ඇති අතර කර්මාන්තශාලා කළමනාකරුවන් ඇතුලු සේවකයින් 831 දෙනෙකු සඳහා පුහුණුව ලබා දී ඇත. මෙම වැඩසටහන යටතේ කර්මාන්තශාලාවල පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම මෙම කර්මාන්තශාලාවට අනුකූලව සිදු කරනු ලබයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක වන කාලය තුල නිපුණතා වැඩි දියුණු කිරීම තුලින් නිෂ්පාදන ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා දායකත්වය ලබාදී ඇත.

- **සම්භාණ්ඩ හා පාවහන් නිෂ්පාදන පුහුණුකිරීමේ සංවර්ධන වැඩසටහන**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මඟින් ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ හා පාවහන් නිෂ්පාදන

කර්මාන්තය සඳහා විදේශ වෙළඳපොළට පිවිසීමට ඇති හැකියාව හඳුනාගෙන ඇත. සම්භාණ්ඩ හා පාවහන් නිෂ්පාදන කේෂ්ත්‍රයේ දැනටමත් 30,000 ක සෘජු සේවා නියුක්තියක් ඇති අතර, 5000 ක පමණ වක්‍ර සේවා නියුක්තියක් ද ඇත. ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟළුම් ආයතනය දැනටමත් පුහුණු වැඩ සටහන් මඟින් සම්භාණ්ඩ සහ පාවහන් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදෙනු ලැබේ. මෙම වර්ෂයේ මාර්තු මස දෙවන පුහුණු වැඩ සටහන පවත්වන ලදී. මෙම පුහුණු කිරිමේ අංශය සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර මෙම වර්ෂයේ දී ලැබී ඇත. මෙම අංශය මඟින් පවත්වනු ලැබූ පළමුවන පාඨමාලාවේ සිසුන් 11 දෙනෙකු සඳහා සහතික පත්‍ර ලබාදීම බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2013 අප්‍රේල් මස සිදු කරන ලදී.

- **පර්යේෂණ හා සංවර්ධන අංශය**

ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟළුම් ආයතනය මඟින් පර්යේෂණ හා සංවර්ධන අංශයක් 2013 ජූනි මස ස්ථාපිත කරන ලදී. මෙම අංශය ජේෂකර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රයේ වෘත්තීය දැනුම ලත් උපදේශකවරයෙකුගේ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ පවත්වා ගෙන යනු ලබයි. එමඟින් ජේෂකර්ම සහ ඇඟළුම් ක්ෂේත්‍රයට අදාල ප්‍රවර්ධන ප්‍රචාරණ දැනුම ලබාදීම සහ සමීක්ෂණ කටයුතු සිදුකිරීම කරනු ලබයි. මෙහි ආරම්භයේ දී දිවයින පුරා දැනට පවත්වා ගෙන යනු ලබන ජේෂකර්ම, අත්යන්ත්‍ර සහ ඇඟළුම් ආයතන සම්බන්ධයෙන් දත්ත රැස්කිරීම සහ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා සංඛ්‍යාන ලබාගැනීම දැනටමත් ආරම්භ කර ඇත.

- **දිවිනැගුම ජාතික වැඩ සටහන යටතේ ගෘහ කර්මාන්ත පුහුණුව**

මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟළුම් ආයතනය ජේෂකර්මාන්තයට අදාල ගෘහ කර්මාන්තකරුවන් හට නිපුනතාවය ලබාදීම සඳහා පුහුණු වැඩ සටහන් 6 ක් කළුතර දිස්ත්‍රික්කයේ ද පුහුණු වැඩ සටහන් 8 ක් මන්නාරම දිස්ත්‍රික්කයේ ද පවත්වා ඇත. මේ දක්වා කාලය තුල මෝස්තර කැපීම, වර්ග කිරීම සහ නිර්මාණය කිරීමේ පුහුණුව, පාවහන් නිෂ්පාදනය සහ බතික් මුද්‍රණය යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුහුණුව ලබාදී ඇත. මේ සඳහා ගෘහස්ත කර්මාන්තවල යෙදී සිටින්නන් 308 දෙනකු සහභාගී කරවන ලදී. මෙම වැඩසටහන යටතේ පුහුණුව ලැබූ කර්මාන්තකරුවන් දිවිනැගුම ප්‍රතිලාභ ලැබීම සඳහා නිර්දේශ කර ඇත.

මන්නාරම දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟළුම් ආයතනය මඟින් පුහුණු කරන ලද දිවිනැඟුම ප්‍රතිලාභීන් සඳහා සහතික පත් ප්‍රදානය කිරීම 2013 සැප්තැම්බර් මස පවත්වන ලදී.

# වාණිජ අංශය

# වාණිජ දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමෙහිලා කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් උපදේශක ආයතනය වශයෙන් කටයුතු කරනු ලැබේ. මෙම වගකීමට, අනෙකුත් කරුණු අතර. (අ) ශ්‍රී ලංකාවේ නිදහස්/ වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම, (ආ) අනෙකුත් රටවල් සමඟ ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභාවල කටයුතු මෙහෙයවීම, (ඇ) විදේශයන්හි විවිධ වෙළඳ ප්‍රතිපත්ති හා සම්බන්ධ සංසදවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම ඇතුළත් වේ.

ප්‍රවර්ධන කාර්යයන්හිදී, විදේශයන්හි ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු පුළුල් කිරීම සඳහා ඉවහල් වන වෙළඳ, ආයෝජන සහ සංචාරක වැඩසටහන් පුළුල් පරාසයක් සංවිධානය කිරීම/ පහසුකම් සලසාලීමෙහිලා වාණිජ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැ෴බ. මේ සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යයන් වන්නේ, ව්‍යාපාරික දූත පිරිස්, වෙළඳ සල්පිල්, ආයෝජන සංසද, සංචාරක කණ්ඩායම්, මාධ්‍ය ව්‍යාපාර සංවිධානය කිරීම, වෙළඳපළ සමීක්ෂණ පැවැත්වීම සහ වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීමයි.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළ දක්වා ඇති සංවර්ධන අරමුණු ඉටුකරගැනීමෙහිලා ඉහත සඳහන් කාර්යයන් මගින් ඉතා වටිනා දායකත්වයක් ලබා දෙනු ලැබේ.

**2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය**

- **බහුපාර්ශ්වික කටයුතු අංශය**

***ලෝක වෙළඳ සංවිධානය (WTO)***

- ලෝක වෙළඳ සංවිධානයේ ශික්ෂණයන් මගින් පාලනය වන්නාවූ බහුපාර්ශ්වික වෙළඳ ක්‍රමය තුළ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම, ලෝක වෙළඳ සංවිධානය සඳහා ශ්‍රී ලංකාවේ නිත්‍ය දූත මණ්ඩලයේ (ජිනීවාහි සිටින නිලධාරීන්) ප්‍රධාන වැදගත් වගකීම වී ඇත.
- බහු පාර්ශවීය වෙළඳ කටයුතු යටතේ සිදුකරනු ලබන ප්‍රධානත ම කටයුත්ත වනුයේ දෝහා සංවර්ධන න්‍යාය පත්‍රය ට (DDA) අදාල අංශයන් හි වෙළඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරී ව සහභාගී වීමයි.ඒ අනුව මෙම වර්ෂය තුළදී වෙළඳ ගැටලු හා සම්බන්ධ කුඩා ම පැකේජය සාකච්ඡාව ට ගනිමින් ,ඒ වන විට තරමක් ඉදිරියට යැමට වැළැක් වී ඇති දෝහා වටයේ සාකච්ඡා වල සාමාජික රටවල් නිරත විය.එනමුදු ,මෙම වර්ෂයේ දෙසැම්බර් මස 05-06 දින අතර කාලය තුළ ඉන්දුනීසියාවේ බාලි නගරයේ පැවති ලෝක වෙළඳ සංවිධානයේ අමාත්‍ය මණ්ඩල 9 වැනි සමුළුවේ දී බාලි පැකේජය නමින් ගිවිසුම් අත්සන් කිරීම සිදුවිය.
- ලෝක වෙළඳ සංවිධානය සඳහා වන ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත ජිනීවා හි පිහිටි කාර්යාලය මෙම වර්ෂය තුළ වෙළඳ පොළ පිවිසුම්,කෘෂිකර්මය,ආරක් ෂණය,සනීපාරක්ෂක උපක්‍රම(SPS MEASURES),,වෙළඳාමට සම්බන්ධ තාක්ෂණික බාධා (TBT) , සහ වෙළඳාම හා සංවර්ධනය යනාදීන් යටතේ ,ලෝක වෙළඳ සංවිධානයේ පිහිටුවා ඇති විශේෂ කොමිටි රැස්වීම් වලට සහභාගී විය.
- උන්ක්ටැඩ් (UNCTAD) සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානය (ITC) යන ජාත්‍යන්තර සංවිධාන

සමග ශ්‍රී ලංකාවේ වෙළදාමට සම්බන්ධ ධාරිතාවය වර්ධනය සඳහා වු තාක්ෂණික සහයන් උදෙසා( UNCTAD) සහ (ITC ) යනාදී ජාත්‍යන්තර සංවිධාන සමග ඉතා සමීපව කටයුතු කිරීම.

- බාලි පැකේජය නමින් දෝහා වෙළද සාකාච්ඡා වටයේ, ඉතා සාර්ථක සංධිස්ථානයක් ලෙස මෙම වර්ෂයේ,ලෝක වෙළද සංවිධානයේ සාමාජිකයින් ගිවිසුමක ට එළඹි අතර, ඒ හා සම්බන්ධ වර්ෂ 2014 සඳහා ක්‍රියාකාරී වැඩසටහනක් හැකි ඉක්මනින් සකස් කිරීමට එකඟ විය.
- එම බාලි පැකේජය යටතේ වෙළදාම පහසුකරණය පිළිබඳ ගිවිසුමකට අත්සන් කරන ලද අතර ,එමගින් සමාජික රටවල් හි විදේශ වෙළදාමෙහි දේශ සීමාවන් හි පනවන රේගු නීති,කාර්යපටිපාටිය,අයකිරීම්,විනිවිද භාවය සහ ප්‍රති නැවිගත කිරීම් පහසු කිරීම් යනාදියත් ඇතුළත් වේ.එසේම සාමාජික රටවල් මෙම ගිවිසුම ක්‍රියාත්මක වු විගස ඉටුකළ යුතු අතර එම රටවල් වලට අදාළ එකඟවීම් සහ අදාළ ලැයිස්තු 2014 ජූලි මස දිනදී සකසා ඉදිරිපත් කිරිමට එකඟ විය.
- කැන්කුං විශේෂිත ආන්තර වු පැකේජ (CANCUN S & D PACKAGE) නමින් වු යෝජනා 28 කින් සමන්විත පැකේජයට මේ වර්ෂයේ ශ්‍රී ලංකාව සහය දක්වන ලදී.
- කිරිපිටි ආනයනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තිරු බදු වැඩි කිරීමට ගනු ලැබු තීරණය සම්බන්ධව නවසීලන්තය විසින් 2012 නොවැම්බර් මස ලෝක වෙළද සංවිධානයේ කෘෂිකර්මය සහ වෙළදපළ පිවිසුම් යන කොමිටියට වාර්තා කරන ලද අතර ශ්‍රී ලංකාවේ වෙළදාම හා ආයෝජන ප්‍රතිපත්ති පිළිබද දෙපාර්තමේන්තුවේ සහය ලබමින් ඒ පිළිබද සුදුසු කටයුතු සිදුකෙරෙමින් ද පැවතිණි.
- දෝහා සංවර්ධන න්‍යාය පත්‍රයේ (DDA) සාකච්ඡා අනුව, අප දූත මණ්ඩලය විසින් ආහාර - සුරක්ෂිතා කටයුතු සඳහා මහජන කොටස් හිමිකම සම්බන්ධයෙන් 33 කණ්ඩායම විසින් (33 කණ්ඩායමේ (G-33) සාමාජිකත්වයට ශ්‍රී ලංකාවද ඇතුළත් වේ) ඉදිරිපත් කරන ලද යෝජනාවට සහාය දක්වනු ලැබ ඇත. මේ සඳහා එකඟ වුවහොත්, මෙම යෝජනාව මගින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල රජයන් වෙත ඔවුන්ගේ ආහාර - සුරක්ෂිතතා අරමුණු ඉටුකර ගැනීම සහ කෘෂිකාර්මික වෙළදාමට අදාළ ලෝක වෙළද සංවිධානයේ (WTO) නීති උල්ලංඝනය නොකර සම්පත් හිඟ ගොවීන් වෙත සහාය දැක්වීම සඳහා බොහෝ නම්‍යතාවන් ලබාදෙනු ඇත.
- ශ්‍රී ලංකා රේගුව සමඟ නිරතුරුව විමසමින්, මෙම දූත මණ්ඩලය විසින් සාර්ථක අදියරකට ළඟාවී ඇති වෙළදාම පහසුකරණය පිළිබඳ සාකච්ඡාවල අඛණ්ඩව නිරතවෙමින් සිටිනු ලැබේ. ලෝක වෙළද සංවිධානයේ සාමාජිකයන් විසින් 9වන අමාත්‍ය සමුළුවට (MC-9) පෙරාතුව වෙළදාම පහසුකරණය පිළිබඳ සාකච්ඡා අවසන් කිරීමට හැකි සෑම ප්‍රයත්නයක්ම දරමින් සිටිනු ලැබේ.
- බලපෑමට ලක් වූ අනෙකුත් රටවල (තුර්කිය, ඕස්ට්‍රේලියාව යනාදී) සහ ලෝක වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශක මධ්‍යස්ථානයේ (ACWL) සමීප සහයෝගීතාවයෙන් යුතුව දූත මණ්ඩලය විසින්, ශ්‍රී ලංකාවේ තිරිඟු පිටි අපනයන මත ආරම්භකර ඇති ආරක්ෂණ විමර්ශන අවසන් කරන ලෙස ඉන්දුනීසියා රජය වෙත බලකිරීමෙහිලා සහ පෙළඹවීමෙහිලා ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන ලදී. විමර්ශන කාල සීමාව තුළදී තාවකාලික ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් ඉන්දුනීසියාව විසින් පනවන ලද ඉහළ තීරු බද්ද, ඉන්දුනීසියානු වෙළඳපළ වෙත ශ්‍රී ලංකාවෙන් තිරිඟු පිටි අපනයනය කිරීම සඳහා අහිතකර ලෙස බලපාන ලදී. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ඉන්දුනීසියාව වෙත කරන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 87.01ක් වටිනා මුළු අපනයනයන්ගෙන් 82%ක් පමණ (ඇමෙරිකානු ඩොලර් මිලියන 71.44) තිරිඟු පිටි අපනයනයන්ගෙන් සමන්විත විය.

- ඉන්දියාව විසින් ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් ශ්‍රී ලංකාවෙන් MDF පුවරු ආනයනය සඳහා අවම මිලක් පනවන ලදී. මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම හේතුකොටගෙන, ඉන්දියානු බලධාරීන් විසින් අවම මිල ප්‍රායෝගික මට්ටමක් දක්වා අඩුකරන ලදී.
- සමාලෝචනයට බඳුන්වූ කාල පරිච්ඡේදය තුළදී, වියට්නාමය විසින් එරටට අපනයනය කරනු ලබන ශ්‍රී ලංකා තේ වලට (සිලෝන් ටී) එරෙහිව සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) නියමයන් පනවන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් රාජ්‍යතාන්ත්‍රික මාර්ග මගින් සිදු කරන ලද නියෝජනයන් අනුව, සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) නියමයන්ට අනුකූල වීම සඳහා සුදුසු ප්‍රතිකාර්මීය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බලධාරීන් වෙත හැකියාව ලබාදෙමින් වියට්නාම බලධාරීන් විසින් සහන කාලයක් ලබාදෙන ලදී.
- ශ්‍රී ලංකාව තුළ වෙළඳාම ආශ්‍රිත හැකියා වර්ධනය සඳහා තාක්ෂණික සහාය ලබාගැනීමේ ශක්‍යතාව සොයාබැලීම සඳහා ලෝක වෙළඳ සංවිධානය (WTO), වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD) සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (ITC) සමඟ සමීප සාකච්ඡා ආරම්භ කිරීම. සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) යටිතල පහසුකම්, අපනයන තත්ත්ව සහතික ක්‍රමය සහ විද්‍යුත් අලෙවිය (e-marketing) යනාදිය හැකියා වර්ධනය සඳහා යොමුගත ප්‍රමුඛ ක්ෂේත්‍ර වේ.

***ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)***

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අතර ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP) පිළිබඳ ගිවිසුම 1989 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වෙළඳ වරණ ක්‍රමය යනු, දකුණ - දකුණ අතර වෙළෙඳාම හා ආර්ථික සහයෝගීතාව වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයෙහි (UNCTAD) අනුග්‍රහය යටතේ සාකච්ඡා සම්මුතිවලට එළැඹුණු වරණීය තීරුබදු යෝජනා ක්‍රමයකි. මේ යටතේ වර්ෂ 2013 තුළ ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් 19,173,709.96 ක් වටිනා භාණ්ඩ මෙක්සිකෝවට සහ පේරු රාජ්‍යයන්ට අපනයනය කර ඇත.

***වරණීය පොදු ක්‍රමය (GSP)***

**(අ) යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (GSP ) යෝජනා ක්‍රමය**

යුරෝපා සංගමයේ පාර්ලිමේන්තුව විසින් 2012 ජුනි 13 වන දින නව GSP යෝජනා ක්‍රමය අනුමත කරනු ලැබ ඇති අතර, එය **2014 ජනවාරි 01** දින සිට බලාත්මක වේ. ශ්‍රී ලංකාව අඛණ්ඩව මෙම යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභියෙකු වනු ඇත.

**(ආ) නෝර්වේ GSP + යෝජනා ක්‍රමය**

නෝර්වේ රජය විසින් 2013 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පහළ මධ්‍යම ආදායම් ලාභී රටවල් සඳහා නව GSP+ ප්‍රවර්ගයක් හඳුන්වා දෙනු ලැබ ඇති අතර ශ්‍රී ලංකාව, මෙම පහසුකම යටතේ ප්‍රතිලාභ ලැබීම සඳහා හිමිකම් ලබන රටවල් 17 අතර සිටී. ශ්‍රී ලංකාව, 1972 සිට නෝර්වේයානු GSP පහසුකම යටතේ ප්‍රතිලාභ භුක්තිවිඳිමින් සිටින අතර මෙම වර්ෂයේ සිට නව GSP+ තත්වය භුක්ති විඳීම සඳහා වන නිර්ණායකය සපුරා ඇත. අපනයන වෙළඳපළ පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීමත් සමඟ පහළ මධ්‍යම ආදායම් ලාභී රටවල වර්ථමාන තත්වය උසස් කිරීම සඳහා මෙම නව GSP+ පහසුකම හඳුන්වා දෙනු ලැබ ඇත.

සාමාන්‍ය වරණීය පොදු ක්‍රමයෙන් අනාවරණය නොවූ (GSP) රෙදි පිළි අයිතමයන් සඳහා තීරුබදු රහිත වෙළඳපළ ප්‍රවේශයක් ලබාගන්නා අතරතුර, සාමාන්‍ය වරණීය පොදු ක්‍රමයේ සහන භුක්තිවිඳීමටද GSP+ රටවලට හැකියාව පවතී. මෙම රටවලට, සාමාන්‍ය GSP යෝජනා ක්‍රමය තුළ ලැයිස්තු ගතකර නොමැති කෘෂිකාර්මික නිෂ්පාදන කිහිපයක් සඳහා 50%ක සහ 100%ක තීරුබදු රහිත වෙළඳපළ

ප්‍රවේශයක් සඳහාද හිමිකමක් ඇත. එබැවින්, GSP+ නිෂ්පාදන ආවරණය සහ තීරුබදු සහන සාමාන්‍ය වරණීය පොදු ක්‍රමයට (GSP) වඩා පුළුල් වේ.

**(ඇ) එක්සත් ජනපද GSP + යෝජනා ක්‍රමය**

එක්සත් ජනපද කොන්ග්‍රසය විසින් මෙම යෝජනා ක්‍රමයේ කාල සීමාව දීර්ඝ නොකිරීම හේතුවෙන්, එක්සත් ජනපද GSP වැඩසටහන යටතේ පිවිසි සුදුසුකම්ලත් නිෂ්පාදන සඳහා තීරුබදු රහිත වෙළඳපළ ප්‍රවේශයේ කාල සීමාව 2013 ජූලි 31 දින අවසන් විය. එක්සත් ජනපද GSP වැඩසටහනේ කාල සීමාව 1974 වර්ෂයේදී එහි ආරම්භයේ සිට 12 වතාවක් අවසන්වී ඇත. එහෙත්, එක්සත් ජනපද කොන්ග්‍රසය විසින් වරණීය පොදු ක්‍රමය (GSP) අනුමත කළවිට, ප්‍රතිසක්‍රිය පදනම මත වරණීය පොදු ක්‍රමයේ ප්‍රතිලාභ ඉල්ලාසිටීමට එක්සත් ජනපද ආනයනකරුවන්ට හැකියාව ලැබෙනු ඇත.

- **ද්විපාර්ශ්වික කටයුතු අංශය**

***ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)***

**(අ) විශේෂ ආර්ථික හවුල**

දෙරට අතර විශේෂ ආර්ථික හවුලක් සඳහා පිවිසුම් මාර්ග සොයා බැලීමට ඉන්දියාවේ වාණිජ ලේකම් සහ ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අතර සාකච්ඡා යළි ආරම්භ කිරීමට 2013 ජනවාරි මාසයේදී පවත්වන ලද ඒකාබද්ධ කොමිසමේදී එකඟවන ලදී.

එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සහ ඉන්දියාවේ වාණිජ ලේකම් අතර නිල සාකච්ඡා 2013 ජුනි 24 සිට 25 දක්වා කොළඹදී පවත්වන ලදී. මෙහිදී, ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ විසඳීමට ඇති ගැටළු පිළිබඳවද සාකච්ඡා කරන ලද අතර දෙපාර්ශ්වය විසින් දෙරට අතර වෙළඳාම පුළුල් කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ දෙරටට ලැබී ඇති සැලකියයුතු ප්‍රතිලාභ පිළිබඳව මෙම හමුවේදී ඒත්තු ගන්වන ලදී. ද්විපාර්ශ්වික වෙළඳාම් ප්‍රමාණය තවදුරටත් වර්ධනය කිරීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට දෙපාර්ශ්වය විසින් එකඟවන ලදී.

- දේශීය සංවේදීතාවන් මතකයේ තබාගනිමින්, අවසානයේදී අඩියරගත කිරීමේ අදහසින් යුතුව අදාළ සෘණාත්මක අයිතම ලැයිස්තු සමාලෝචනය කිරීම.
- තීරුබදු නොවන සම්බාධක ඉවත්කිරීම.
- වෙළඳ ආරවුල් විසඳීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- වෙළඳ හිඟය අඩුකිරීම කෙරෙහි අවධානය යොමුකරමින් වසර 3ක කාල පරිච්ඡේදයක් තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක් දක්වා ද්විපාර්ශ්වික වෙළඳාම පුළුල් කිරීම.

ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව සමඟ වැඩිවන වෙළඳ හිඟයට පිළියම් කිරීමේ වැදගත්කම අවධානයට ලක් කරන ලද අතර ඇඟලුම්, උසස් නිමි තේ, අගය එකතු කළ රබර් නිෂ්පාදන, මල් වගාව (floriculture) සහ කුළු බඩු වැනි අගය එකතු කළ නිෂ්පාදන සඳහා වෙළඳපළ පිවිසුම ඉල්ලා සිටින ලදී.

ඉන්දියාව විසින්, මුළු සලාකය කොන්දේසි රහිතව තීරුබදු වලින් නිදහස් කරමින් මුළු ඇඟලුම් කෑලි මිලියන 8න් ඉතිරිවන ඇඟලුම් කෑලි මිලියන 5 මත රෙදිපිළි ලබාගැනීමේ කොන්දේසිය ඉවත් කරන ලදී. මුල් කාලයේදී, ඇඟලුම් කෑලි මිලියන 5ක් සඳහා මෙම කොන්දේසිය අදාළ විය. ශ්‍රී ලංකාවෙන් සැකසූ මස් සහ පළතුරු ආනයනය මත පනවන ලද සීමාවන් ඉවත් කර ඇති බවද ඉන්දියානු පාර්ශ්වය විසින් මෙම හමුවේදී දැනුම්දෙන ලදී.

2009 වර්ෂයේදී සාමය උදාවීමත් සමඟ සංචාරක ව්‍යාපාරය පුනර්ජීවය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් අපේක්ෂා සහිත වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව සංචාරක ව්‍යාපාරය පිළිබඳ සාකච්ඡාව අතර තුරදී අවධාරණය කරන ලදී. දකුණු ආසියානු කලාපය තුළ පුද්ගලයින් සහ භාණ්ඩ නිදහසේ

සංචලනය වීම හා සම්බන්ධකතාවයේ වැදගත්කම සහ ඉංදියාව හා ශ්‍රී ලංකාව අතර සම්බන්ධකතාවයේ වර්ථමාන මට්ටම් කලාපය තුළ ඉතා උසස් අන්දමින් පවතින්නේ යැයි යන කරුණ අවධානයට ලක්කරමින්, වර්ථමාන තත්වය සහ අනාගත අපේක්ෂාවන් වඩාත් හොඳින් පිළිබිඹු කිරීම සඳහා සංචාරක ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ සහයෝගීතාව පිළිබඳ වර්ථමාන අවබෝධතා ගිවිසුම ප්‍රතිශෝධනය කිරීමට මෙම හමුවේදී එකඟවන ලදී.

හවුල් ව්‍යාපාර ආකාරයෙන් පැමිණෙන ආයෝජන වැඩි වශයෙන් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකාව විසින්, ආනයන ආදේශනය ඇතිවන සහ අතිරික්ත නිෂ්පාදනය අපනයනය කළ හැකි සීනි පිරිපහදුව සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ආදර්ශය භාවිත කරමින් ශ්‍රී ලංකාව ආනයන මත දැඩි ලෙස විශ්වාස තබන ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳව අවධාරණය කරනු ලැබ ඇත.

**(ආ) ඒකාබද්ධ කාර්ය සාධන බලකාය (JTF)**

ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජන තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවේශ මාර්ග සොයා බැලීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව විසින් ඉන්දියා-ශ්‍රී ලංකා ඒකාබද්ධ කාර්ය සාධන බලකාය පිහිටුවන ලදී. 2013 ජුනි මස 24 වන දින පවත්වන ලද ඒකාබද්ධ කාර්ය සාධන බලකායේ පළමු රැස්වීමේදී, අනෙකුත් දෑ අතර, ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ (ISFTA) වර්ථමාන තත්වය, ද්විපාර්ශ්වික වෙළඳාම වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග, සෘණාත්මක අයිතම ලැයිස්තු සමාලෝචනය, තීරුබදු නොවන සම්බාධක (NTBs) සඳහා විසඳුම් ලබාදීම, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඉංදියාවේ සී/ස යටිතල පහසුකම් කල්බදු මූල්‍ය සේවා සමාගම (ILFS) විසින් මෙම රැස්වීමේදී, විශේෂයෙන් මෝටර් රථ, ඖෂධ, නිපුණතා පුහුණු, රෙදිපිළි, ඉංජිනේරු, යටිතල පහසුකම් සහ සංචාරක යන කර්මාන්ත තුළ පිරිනැමිය හැකි සේවාවන් පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලදී. අදාළ රටවල වාණිජ දෙපාර්තමේන්තු, තීරුබදු නොවන සම්බාධක (NTBs) වලින් පැන නගින ගැටළු විසඳීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා කේන්ද්‍රස්ථානය විය හැකිය යන්න සම්බන්ධයෙන් ඒකාබද්ධ කාර්ය සාධන බලකාය (JTF) විසින් එකඟතාව පළ කරන ලදී.

**(ඇ) ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ අපනයන**

ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ආකර්ෂණීය ආකාරයකින් අපනයන විවිධාංගීකරණය කිරීමට ශ්‍රී ලංකාවට හැකිවී ඇත. වර්තමානයේදී, පරිවාරක කම්බි සහ විදුලි රැහැන්, ඇඟළුම්, රබර් ටයර්, අත්වැසුම්, ගෘහ භාණ්ඩ, බයිසිකල්, සෙරමික් නිෂ්පාදන, බෝතල්, බෝතල්-සිසිල්කරණ, සොසේජස්, ස්ට්‍රෝබෙරි සහ විස්කෝතු වැනි නව නිෂ්පාදන පුළුල් පරාසයක් ඉන්දියාව වෙත ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන ප්‍රමාණයට ඇතුළත් වේ. 2013 වර්ෂයේ දී ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව ඇමෙරිකානු ඩොලර් මිලියන 316 ක් වටිනා භාණ්ඩ ඉන්දියාවට අපනයනය කර ඇත.

***පාකිස්ථාන – ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)***

පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) පිළිබඳ තාක්ෂණික මට්ටමේ 5වැනි සභාවාරය 2013 අප්‍රේල් 28 -29 දිනවලදී ඉස්ලාමාබාද්හිදී පවත්වන ලද අතර ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ ලේකම් සහ පාකිස්ථානයේ වාණිජ ලේකම් මෙම රැස්වීමේ සම-සභාපතිත්වය දරන ලදී.

සාකච්ඡා පැවැත්වෙන අතරතුරදී, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ විසඳීමට ඇති ගැටළු කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, මදුරු දඟර (Mosquito repellent coils), බෝතල් සිසිල්කරණ යන්ත්‍ර, අමු පොල් තෙල්, බුලත් කොල

සහ ශාකසාර රූපලාවන්‍ය නිෂ්පාදන වැනි නිෂ්පාදන පහක් සඳහා පුළුල් වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබුණි. තවද, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන ජින්ජර් බියර් සහ සෙරමික් නිෂ්පාදන සඳහා තීරු බදු සහන ලබාදීම සලකා බැලීමට පාකිස්ථානු පාර්ශ්වය එකඟ විය.

අදාළ විෂයයන් පිළිබඳ යොමුගත සාකච්ඡා සඳහා පහසුකම් සලසාලනු වස්, භාණ්ඩ වෙළඳාම, රේගු සහයෝගීතාව, ආයෝජනය සහ මෝටර් රථ ක්ෂේත්‍රය (Auto Sector) පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම් (Joint Working Groups) පිහිටුවීමට ද දෙපාර්ශ්වය එකඟ වූහ. ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර ඒකාබද්ධ ආර්ථික කොමිසමෙහි (JEC) 11 වන සැසිය මෙම වර්ෂයේ නොවැම්බර් මස 27 සහ 28 දෙදින තුළ කොළඹදී පැවැත්වූ අතර දෙරටෙහි වෙළඳාම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සමඟ දෙරටෙහි නිදහස් වෙළඳ ගිවිසිම හා සම්බන්ධ කරුණු එහිදී සාකාච්ඡාවට ගැනිණි.

මෙම හමුවේදී කර්මාන්ත සහයෝගීතාවය ,රේගු සහ විද්‍යුත් දත්ත ගබඩා,ආයෝජන සහ කෘෂිකර්මාන්තය යනාදියෙහි පහසුකම් සැපයීමට උදෙසා ඒකාබද්ධ කණ්ඩායමක් පිහිටුවීමටද දෙපාර්ශය එකඟ විය. ශ්‍රී ලංකාවෙන් පකිස්ථානය ට කරනු ලබන බුලත් අපනයනය වෙනුවෙන් වර්තමානයෙහි පවතින 35% ක තීරු බදු වරණීය අනුපාතය (MOP) 50% ක් දක්වා ඉහළ දැමීමට පාකිස්ථානය මෙහි දී එකඟ විය.

2013 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ පාකිස්ථානය සමඟ නිදහස් වෙළඳ ගිවිසුම (FTA) යටතේ ශ්‍රී ලංකාවේ අපනයන වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 31 ක් ළඟා කරගන්නා ලද අතර එය, පාකිස්ථානය වෙත ශ්‍රී ලංකාවේ මුළු අපනයන වලින් 72%කට සමාන වේ.

***ශ්‍රී ලංකාව සහ බෙලරුස් අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම***

දෙරට අතර පවත්නා වෙළඳ සහ ආර්ථික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකාව සහ බෙලරුස් අතර ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සහයෝගීතා ගිවිසුමක් අත්සන් කිරීමට බෙලරුස් රජය විසින් යෝජනා කරන ලදී. ඒ අනුව, 2013 අගෝස්තු 25 සිට 28 දක්වා අතිගරු ජනාධිපතිතුමාගේ බෙලරුස් රාජ්‍ය සංචාරය අතරතුරදී එම ගිවිසුම අත්සන් කරන ලදී.

තවද, බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ නියුතු අමාත්‍ය (වාණිජ), ආර්.ඩී.එස්. කුමාරරත්න මහතා සහ ජනාධිපති දූත පිරිසේ සාමාජිකයෙකු විසින්, බෙලරුස්හි බෙලරුසියානු වාණිජ මණ්ඩලයේදී පවත්වන ලද ශ්‍රී ලංකා - බෙලරුස් ව්‍යාපාරික සංසදයේදී ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලදී.

- **කලාපීය කටයුතු අංශය**

***දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම* (SAFTA)**

2016 වන විට වසර දහයක් තුළ නිමකිරීමට සැලසුම් කරන ලද දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ වෙළඳාම් ලිහිල්කරණ වැඩසටහන (TLP) යටතේ, සෘණාත්මක අයිතම ලැයිස්තුවල පවත්නා නිෂ්පාදන හැර අනෙකුත් නිෂ්පාදන මත අය කරනු ලබන තීරුබදු ප්‍රගතශීලී ලෙස අඩු කරනු/ඉවත් කරනු ලබනු ඇත. වසර 2014 වන විට ශ්‍රී ලංකාව විසින් සමාන වාරික හයකින් 0 - 5% දක්වා එහි තීරුබදු පහත හෙළිය යුතුය. ඌන සංවර්ධිත සාමාජික රාජ්‍යයන් එනම්, ඇෆ්ඝනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, මාලදිවයින සහ නේපාලය විසින් වසර 2016 වන විට සමාන වාරික අටකින් 0 - 5% දක්වා ඔවුන්ගේ තීරුබදු පහත හෙළිය යුතු අතර, ඉන්දියාව සහ පාකිස්ථානය විසින් වසර 2013 වන විට සමාන වාරික පහකින් 0 - 5% දක්වා ඔවුන්ගේ තීරුබදු පහත හෙළිය යුතුය.ශ්‍රී ලංකාව ඌන සංවර්ධිත

නොවන සාමාජික රාජ්‍යයක් වුව ද එහි ආර්ථික තත්වයන් සළකා බලා ආනයන තීරු බදු ක්‍රමිකව අඩු කිරීම සඳහා දීර්ඝ කාල සීමාවක් ලබා ගැනීමට හැකිවන වන ලදී.

2013 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) යටතේ ඉන්දියාව, මාලදිවයින සහ නේපාලය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 1.85 ක් වටිනා භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත. අපනයනය කරන ලද නිෂ්පාදන වන්නේ, දිසිදි පොල්, පිටිකළ පොල් කිරි, කොප්පරා, පොල් තෙල්, ගම්මිරිස්, සෙරමික් නිෂ්පාදන, සහ කෘත්‍රිම තනි සූත්‍රිකා (synthetic monofilament), ප්‍රතිචක්‍රීය කළහැකි කඩදාසි නිෂ්පාදන, කොහු කෙඳි, දැවමය ගෘහ භාණ්ඩ, ආලේපිත කැල්සියම් කාබනේට්, සහ ගෙතු රෙදිපිළි සහ බිම් ගඩොල් (floor tiles) ය.

මෙම ගිවිසුම යටතේ සංවේදී ලැයිස්තුව 20% කින් එහි සෑම සාමාජික රටක්ම අඩු කලයුතු බවට මෙම වර්ෂය තුළදී එකඟතාවයට පැමිණෙන ලදී.එසේ එකඟ වූ අඩුකිරීම් පහත වගුවෙන් දැක්වේ.

| සාමාජික රට | සංවේදීතා ලැයිස්තුව 20% පහත හෙළීමට පෙර | | සංවේදීතා ලැයිස්තුව 20% පහත හෙලු පසු | |
|---|---|---|---|---|
| | ඌන සංවර්ධිත රටවල් | ඌන සංවර්ධිත නොවන රටවල් | ඌන සංවර්ධිත රටවල් | උන සංවර්ධිත නොවන රටවල් |
| ඇෆ්ගනිස්ථානය | 1072 | | 850 | |
| බංග්ලාදේශය | 1233 | 1241 | 987 | 993 |
| භූතානය | 150 | | 150 | |
| ඉන්දියාව | 180 | 868 | 25 | 614 |
| මාලදිවයින | 681 | | 152 | |
| නේපාලය | 1257 | 1295 | 998 | 1036 |
| පාකිස්ථානය | 1169 | | 936 | |
| ශ්‍රී ලංකාව | 1042 | | 837 | 963 |

**2013 වසරේදී පහත සඳහන් රැස්වීම් පවත්වන ලදී.**

- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සංවේදී අයිතම ලැයිස්තු අඩුකිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන සභාවාරය (III වන අදියර), සාර්ක් මහලේකම් කාර්යාලය, කත්මණ්ඩු, 2013 ජූලි 30
- තීරුබදු නොවන ක්‍රියාමාර්ග සහ පැරා තීරුබදු ක්‍රියාමාර්ග පිළිබඳ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ විශේෂ සභාවාරය, සාර්ක් මහලේකම් කාර්යාලය, කත්මණ්ඩු, 2013 ජූලි 31 සිට අගෝස්තු 01 දක්වා
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ අටවැනි සභාවාරය, කොළඹ, 2013 අගෝස්තු 21 - 22
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය කවුන්සිලයේ හත්වැනි සභාවාරය, කොළඹ, 2013 අගෝස්තු 23

වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ අටවැනි සභාවාරය සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය කවුන්සිලයේ හත්වැනි සභාවාරය කොළඹදී පවත්වන ලදී.

**ඉහත සඳහන් සභාවාරයන්හිදී පහත සඳහන් ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී.**

- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ අත්සන් තබන ලද ප්‍රතිශෝධිත සංවේදී අයිතම ලැයිස්තු නිකුත් කිරීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය (II වන අදියර)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සංවේදී අයිතම ලැයිස්තු තවදුරටත් අඩුකිරීම සඳහා අනුගමනය කළ යුතු නියමයන් සහ කාල රාමුව (III වන අදියර)
- සාමාජික රාජ්‍යයන් වෙතින් ලද තීරුබදු නොවන ක්‍රියාමාර්ග / පැරා - තීරුබදු ක්‍රියාමාර්ග පිළිබඳව

සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග / පැරා - තීරුබදු ක්‍රියාමාර්ගයන්ට අදාළ ගැටළු පිළිබඳව දැනුම්දීම් පරීක්ෂා කිරීම

- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙන් පරිබාහිරව සාර්ක් කලාපය තුළ වෙළඳ ප්‍රවාහයන්ට අදාළ ගැටළු
- යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය (EU GSP) යටතේ අධි කලාපීය සමුච්චිතය (Super Regional Cumulation), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) සහ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සත්‍යාපන යාන්ත්‍රණයක් (Verification Mechanism) ආයතනීයකරණය කිරීම, දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය සහ වෙළඳාම් පහසුකරණ වැඩසටහනට අදාළ ගැටළු
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීමට අදාළ ගැටළු

***සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)***

2010 අප්‍රේල් මාසයේදී භූතානයේදී පවත්වන ලද 16 වැනි සාර්ක් සමුළුව අතර තුරදී සාමාජික රාජ්‍යයන්ගේ නායකයින් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම් කෙටුම්පත අත්සන් කරන ලදුව, ඒ සඳහා එකඟතාව පළ කරන ලදී.

සාමාජික රටවල් විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා බැඳීම් උපලේඛනවල කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටිනු ලැබේ. ඉංදියාව සහ භූතානය විසින් සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS) යටතේ පවත්නා බැඳීම් උපලේඛන දැනටමත් ඉදිරිපත් කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ බැඳීම් උපලේඛනයේ කටයුතු අවසන් කරනු ලැබ ඇත.

***සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)***

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ (SAFTA) පුරෝගාමියා වන, සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1993 අප්‍රේල් මාසයේදී අත්සන් කරන ලදුව 1995 දෙසැම්බර් මස 07 දින සිට ක්‍රියාත්මක කරන ලදී. මෙම ගිවිසුම මගින් පිළිබිඹු වන ලද්දේ, සහන හුවමාරු කර ගැනීම තුළින් සාර්ක් කලාපය තුළ අන්‍යෝන්‍ය වෙළඳ හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙනයාම සඳහා සාමාජික රාජ්‍යයන්ගේ කැමැත්තයි.

මූලික වශයෙන් දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) හා රේගු සංගමය දෙසට යොමු වීමේ පියවර ලෙස සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ආරම්භ කරන ලදී. එබැවින්, අනාගතයේදී සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම වෙනුවට ක්‍රමිකව දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) ආදේශ කිරීමට නියමිතය. ඒ අනුව, සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු වරණය භාවිතය පහත වැටී ඇත. 2013 වසරේ දී, ශ්‍රී ලංකාව විසින් සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම යටතේ ඉංදියාව සහ පාකිස්ථානය වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 2.2 ක වටිනාකමින් යුතු භාණ්ඩ අපනයනය කරනු ලැබ ඇත. රේසින් රබර් ෂීට් (Resin Rubber Sheets), වල්කනයිස් කරන ලද රබර් (Vulcanized Rubber), රබර් පටි, පොල් තෙල්, කලු තේ සහ අපතේ දමන කඩදාසි (Waste Paper) සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම යටතේ අපනයනය කරන ලද නිෂ්පාදන වේ.

***ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)***

ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමේ ස්ථාවර කමිටුවේ 40 වැනි සහ 41 වැනි සභාවාරයන් පිළිවෙලින් 2013 අප්‍රේල් මාසයේදී සහ ජුනි මාසයේදී පවත්වන ලදී. සාමාජිකයන් විසින්, ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු ලිහිල්කරණයේ 4 වැනි වටය, ප්‍රභවස්ථාන රීති (Rules of Origin ), වෙළඳාම පහසුකරණය, ආයෝජනය සහ සේවාවන් ඇතුළත් පුළුල් ගැටළු පරාසයක් පිළිබඳව සාකච්ඡා කරන ලදී. ප්‍රභවස්ථාන රීති නිර්ණායකය සම්බන්ධයෙන්,

සාමාජික රාජ්‍යයන් විසින් නිෂ්පාදන විශේෂී ප්‍රභවස්ථාන රීති සම්බන්ධ බොහෝ කටයුතු නිමාවට පත්කරන ලදී. එය, පෙර සාකච්ඡා වලදී සාකච්ඡා කරන ලද විකල්ප ප්‍රභවස්ථාන රීතියක් සමඟ, ඉදිරියේදී පැවැත්වෙන අමාත්‍ය සමුළුවේදී එක් පැකේජයක් වශයෙන් මෙන්ම 4වැනි වටයේ පැකේජයේ කොටසක් වශයෙන් ද පිළිගැනීමට අපේක්ෂා කෙරේ. මෙම වටයේ සාකාච්ඡා තීරු බදු සහන ඉහළ නැංවීම ප්‍රභවස්ථාන නීතිය ලිහිල් කිරීම,වෙළදාම පහසුකරණය,ආයෝජනය සහ සේවා පිළිබඳ රාමු ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීම යනාදියෙන් සමන්විත වේ.

මොන්ගෝලියාව සහ ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමේ සියලුම සහභාගීත්ව රාජ්‍යයන් අතර ද්විපාර්ශ්වික සාකච්ඡා සාර්ථක ලෙස නිමාවට පත්කරනු ලැබ ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මොන්ගෝලියාව නිල වශයෙන් ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුමේ නව සාමාජිකයෙකු බවට පත්වනු ඇත.

කොහු කෙඳි, ඇඟලුම්, රබර් නිෂ්පාදන, පෝසිලේන් භාණ්ඩ, තේ යනාදියෙන් සමන්විත නිෂ්පාදන පරාසයක් සහිත, ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ අපනයන 2013 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 34.6 ක් වාර්තා කරන ලදී.

***කලාපීය සහයෝගීතාව සඳහා වූ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානය (INDIAN OCEAN RIM ASSOCIATION FOR REGIONAL CO-OPERATION-IOR-ARC)***

කර්මාන්ත හා වාණිජ අමාත්‍ය, ගරු. රිසාඩ් බදියුඩීන් මැතිතුමා විසින්, 2013 ජුලි 4 - 5 දිනයන්හිදී මුරුසියේදී පැවති කලාපීය සහයෝගීතාව සඳහා වූ ඉන්දියානු සාගර වටද්දර රටවල සංවිධානයේ (IOR-ARC) පළමු අමාත්‍ය මට්ටමේ ආර්ථික සහ ව්‍යාපාරික සමුළුවට (EBC) සහභාගී වන ලදී. වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ශ්‍රී ලාංකික සමාගම් පහක නියෝජිතවරුන් ද ගරු. අමාත්‍යවරයා සමඟ මෙම අවස්ථාවට සහභාගී වන ලදී.


තවද මෙහි 13 වන අමාත්‍යවරුන්ගේ කවුන්සිලයේ රැස්වීම ,මෙම වර්ෂයේ ඔක්තොම්බර් 30 සිට නොවැම්බර් 01 දක්වා ඕස්ට්‍රේලියාවේ පර්ත් නුවර පැවැත්විණි.එහිදී මෙම සංවිධානයේ වරණාත්මක වෙළඳ ගිවිසුමක් (PTA) ඇතිකිරීමේ අදහසට ශ්‍රී ලංකාව කැමැත්ත පළ කළේය.

- **වෙළඳ ප්‍රවර්ධන අංශය**

***2013 වර්ෂයේ ජාත්‍යන්තර වෙළඳාම - සංක්ෂිප්තයක් ලෙස***

ශ්‍රී ලංකාවේ සමස්ථ අපනයන ආදායම 2012 වර්ෂයට සාපේක්ෂව බලන කල ඇමරිකානු ඩොලර් මිලියන 9180 සිට ඇමෙරිකානු ඩොලර් මිලියන 10009 දක්වා මෙම වර්ෂයේ ඉහළ ගොස් ඇත.එය පසුගිය සාපේක්ෂව 8.28% ක වර්ධනයකි.

**2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ වෙළඳ ගමන් මඟ**




***ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම***

(අ) අන්‍යෝන්‍ය සහ අන්‍යෝන්‍ය නොවන වරණීය වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම සඳහා වගකිවයුතු බල අධිකාරිය වන්නේ වාණිජ දෙපාර්තමේන්තුවයි.

**ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුම** (APTA), දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), දකුණු ආසියානු වරණීය

වෙළඳ ගිවිසුම සහ **ගෝලීය වෙළඳ වරණ ක්‍රමය** (GSTP), අන්‍යෝන්‍ය වරණීය වෙළඳ ගිවිසුම් වන අතර වරණීය පොදු ක්‍රමය (GSP) අන්‍යෝන්‍ය නොවන වරණීය වෙළඳ ගිවිසුමක් වේ. යුරෝපා සංගමය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය, තුර්කිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ස්විට්සර්ලන්තය, කැනඩාව, නෝර්වේ සහ රුසියාව වර්තමානයේදී GSP වරණය ලබාදෙන්නාවූ රටවලට ඇතුළත් වේ.

ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම යනු, විවිධ වෙළඳ ගිවිසුම් යටතේ අදාළ ප්‍රභවස්ථාන රීති නිර්ණායකය පිළිබඳව ගැඹුරු දැනුමක් ලබාගැනීම අවශ්‍යවන ඉතා විශේෂිත කාර්යයක් වේ. මේ සම්බන්ධයෙන් වාණිජ දෙපාර්තමේන්තුවේ වගකීම් වන්නේ; (අ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීම, (ආ) අපනයනකරුවන්ගේ තොරතුරු සටහන් (profiles) ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම, (ඇ) පිරිවැය ප්‍රකාශයන් සහ යෝග්‍යතාව සපුරාලීම සඳහා අපනයනකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් ආධාරක ලිපිලේඛන ඇගයුමට ලක්කිරීම, (ඈ) වරණය ලබාදෙන්නාවූ රටවල ඉල්ලීම මත ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීමෙන් පසු විගණන පැවැත්වීම සහ (ඉ) ප්‍රභවස්ථාන සහතික ආශ්‍රිත දත්ත සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

(ආ) තීරුබදු සහන සඳහා නිෂ්පාදනයක යෝග්‍යතාව තක්සේරු කිරීමේදී, නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ භෞතික පරීක්ෂණය සඳහා කර්මාන්තශාලා පරීක්ෂාවන්ද අවශ්‍ය විය හැක. සමාලෝචනයට බඳුන් කරන ලද කාල පරිච්ඡේදය තුළ, දෙපාර්තමේන්තුව විසින් දිනකට සාමාන්‍යයෙන් පිරිවැය ප්‍රකාශයන් 20ක් තක්සේරු කරන ලද අතර කර්මාන්තශාලා පරීක්ෂාවන් 10ක් සිදු කරන ලදී.

(ඇ) 2013 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් ප්‍රභවස්ථාන සහතික (COOs) නිකුත් කිරීම සඳහා අපනයනකරුවන් 4186 ක් ලියාපදිංචි කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා රේගු තොරතුරු අනුව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික යටතේ 2013 ජනවාරි සිට ජුනි දක්වා කාල පරිච්ඡේදය තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,627ක් පමණ වටිනා වෙළඳ භාණ්ඩ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබ ඇති අතර එය, අදාළ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවෙන් ලෝක වෙළඳපළ වෙත කරන ලද මුළු අපනයනයන්ගෙන් 37%ක් වේ. 2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා දෙපාර්තමේන්තුව විසින් අදාළ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

**ප්‍රභවස්ථාන සහතික නිකුත්කිරීම**

| ගිවිසුම | ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව |
|---|---|
| යුරෝපා සංගමයේ වරණීය පොදු ක්‍රමය | 79,454 |
| වරණීය පොදු ක්‍රමය - අනෙකුත් රටවල් | 13,410 |
| වරණීය පොදු ක්‍රමය - පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල් | 929 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 11,088 |
| පාකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම | 8,190 |
| ආසියානු පැසිෆික් වෙළඳ ගිවිසුම | 3,482 |
| දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම | 74 |
| දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම | 243 |
| ගෝලීය වෙළඳ වරණ ක්‍රමය | 147 |
| **එකතුව** | **117,017** |

*මූලාශ්‍රය: වාණිජ දෙපාර්තමේන්තුව*

(ඈ) සාමාන්‍යයෙන්, වාණිජ දෙපාර්තමේන්තුව විසින් දිනකට ප්‍රභවස්ථාන සහතික 470ක් පමණ නිකුත් කරනු ලැබේ.

(ඉ) අපනයනය කරනු ලබන නිෂ්පාදනවල යෝග්‍යතාව තවදුරටත් නිශ්චිතව දැන ගැනීම සඳහා

වරණීය පහසුකම් ලබාදෙන්නාවූ රටවල ඉල්ලීම මත 2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31දක්වා සත්‍යාපනයන් 45ක් පමණ සිදු කරන ලදී.

*දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම*

(අ) එක්සත් ජනපදයේ ආහාර සහ ඖෂධ පරිපාලනයේ නව ආහාර ආරක්ෂණ නවීකරණ පනත (US Food and Drug Administration's new food safety modernization Act) සහ ආහාර සහ ඖෂධ පරිපාලනයේ (FDA's) පිරික්සුම් ක්‍රියාවලිය පිළිබඳ සම්මන්ත්‍රණය - 2013 අගෝස්තු 24

වොෂින්ටනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින්, ඇමෙරිකා එක්සත් ජනපදයේ ආහාර සහ ඖෂධ පරිපාලනයේ සහ ආහාර කර්මාන්තයේ පෞද්ගලික අංශයේ විශේෂඥයෙකු සමඟ ශ්‍රී ලංකාවේ පවතින සහ විභව ආහාර සහ ආශ්‍රිත අපනයනකරුවන් සඳහා, සහභාගීවන්නන් 55 කින් යුතු, සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණයේ අරමුණ වූයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ ආහාර නවීකරණ පනත (Food Modernization Act of USA) සහ මෙම වර්ෂයේ අවසන් භාගය තුළදී ශ්‍රී ලංකාවේදී පවත්වනු ලබන ආහාර සහ ඖෂධ පරිපාලනයේ (FDA's) පිරික්සුම් ක්‍රියාවලිය පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමයි.

(ආ) නෝර්වේ GSP යෝජනාක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන - 2013 අගෝස්තු 08

ලංකා වාණිජ මණ්ඩලයේ කාර්ය සංවිධාන සහයෝගය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව විසින්, නව නෝර්වේ GSP+ යෝජනාක්‍රමය යටතේ නෝර්වේ රාජ්‍යය වෙත අපනයන පුළුල් කිරීම සඳහා වන ශක්‍යතාව පිළිබඳව, සහභාගීවන්නන් 50 කින් යුතු දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

***ශ්‍රී ලංකාවේ සිටින විදේශීය ව්‍යවසායකයින් සඳහා නේවාසික වීසා බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා නිර්දේශ ලබාදීම***

2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා, මෙම දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා බලපත්‍ර 204 ක් නිකුත් කරනු ලැබ ඇත.

***පළමු ශ්‍රී ලංකා - චෙච් ආර්ථික සංසදය 2013***

පළමු ශ්‍රී ලංකා - චෙච් ආර්ථික සංසදය චෙච් ජනරජයේ Prague හිදී පැවැත්වීමට සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු. බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින්, රජයේ නිලධාරීන් සහ ශ්‍රී ලාංකික සමාගම් 40ක ජ්‍යෙෂ්ඨ නියෝජිතයින්ගෙන් සමන්විත ශ්‍රී ලංකා දූත පිරිස මෙහෙය වන ලදී. චෙච් සමාගම් 160ක් පමණ ව්‍යාපාරකයින් මුණගැස්සවීමේ අවස්ථාවට සහභාගීවන ලදී. වාණිජ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපාරික දූත පිරිස සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීමට අමතරව සියලුම මූලික කටයුතු මෙහෙයවන ලදී.

***කර්මාන්ත හා වාණිජ අමාත්‍ය, ගරු. රිසාඩ් බදියුදීන් මැතිතුමාගේ ඉරාක සංචාරය, 2013 පෙබරවාරි 19 සිට 23 දක්වා***

වාණිජ දෙපාර්තමේන්තුව විසින්, ගරු. කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමාගේ ඉරාක සංචාරය සංවිධානය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන තේවල තත්ත්ව පාලන කටයුතු ඇතුළත්ව ශ්‍රී ලංකාව සහ ඉරාකය අතර ද්විපාර්ශ්වික වෙළඳාම පුළුල් කිරීම සඳහා නව පිවිසුම් මාර්ග පිළිබඳව දෙපාර්ශවය විසින් සාකච්ඡා කරන ලදී.

***තුර්කියේ අයිස්මීරයේ පැවති 82වන අයිස්මීර් (IZMIR) ජාත්‍යන්තර වෙළඳ සල්පිල සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය, 2013 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 02 දක්වා***

වාණිජ දෙපාර්තමේන්තුව විසින්, තුර්කියේ අයිස්මීරයේ පැවති 82වන අයිස්මීර් (IZMIR)

ජාත්‍යන්තර වෙළඳ සල්පිල සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීමට සහයෝගය දක්වන ලදී. කර්මාන්ත හා වාණිජ අමාත්‍ය, ගරු. රිසාඩ් බදියුඩීන් මැතිතුමා විසින්, අයිස්මීර් (IZMIR) වෙළඳ සල්පිල සඳහා සහභාගීවූ දූත පිරිස මෙහෙය වන ලදී.

***චීනයේ කුන්මින්හි (KUNMING) පැවති පළමු චීන - දකුණු ආසියා එක්ස්පෝ සඳහා ශ්‍රී ලංකාව සහභාගීවීම - 2013 ජුනි 06 සිට 10 දක්වා***

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය, ගරු. දි.මු. ජයරත්න මැතිතුමා විසින්, 2013 ජුනි 06 සිට 10 දක්වා කුන්මින්හි (**KUNMING**) පැවති පළමු චීන - දකුණු ආසියා එක්ස්පෝ සඳහා ශ්‍රී ලංකාවෙන් සහභාගීවූ අපනයනකරුවන් 120ක දූත පිරිසක් මෙහෙය වන ලදී. එක්ස්පෝ සමාරම්භක උළෙලේදී, ගරු. අග්‍රාමාත්‍යතුමා විසින් ප්‍රධාන කථාව පවත්වන ලදී. චීනයේ ශ්‍රී ලංකා තානාපති, අග්‍රාමාත්‍ය ලේකම්, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම් සහ වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් ද මෙම අවස්ථාව සඳහා සහභාගීවූ උසස් නිලධාරීන් අතර වූහ.

අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) සහයෝගය ඇතිව තානාපති කාර්යාලයේ වාණිජ අංශය විසින්, එක්ස්පෝ ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රදර්ශන කුටිය , මැණික් සහ ස්වර්ණාභරණ, තේ, බතික්, අත්කම්, සෙරමික්, කොහු නිෂ්පාදන, ආයුර්වේද නිෂ්පාදන සහ තෑගි භාණ්ඩ වැනි නිෂ්පාදන යටතේ වන ශ්‍රී ලාංකික සමාගම් 120කින් සමන්විත විය. චීනයේ පවත්වන ලද ප්‍රදර්ශනයකදී ශ්‍රී ලංකාවෙන් සහභාගීවූ විශාලතම කණ්ඩායම මෙය වූ අතර නව සබඳතා ඇතිකර ගැනීම සහ ස්ථානීය විකුණුම් සම්බන්ධයෙන් ඉතාමත් සාර්ථක විය.

ශ්‍රී ලංකාවේ ගරු. අග්‍රාමාත්‍යතුමා සහ නිල දූත පිරිස විසින්, චීනයේ උප අග්‍රාමාත්‍ය, මා කායි (Ma Kai) සහ යුනාන් (Yunnan) පළාත් ආණ්ඩුකාර, ලි ජිහෙන් (Li Jiheng) සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ ලේකම් විසින් චීන - දකුණු ආසියා ව්‍යාපාරික සංසදයේදී කතාවක් පවත්වන ලදී. තවද, ඔහු විසින් CCPIT යුනාන් (Yunnan) අනු කවුන්සිලයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක්ද පවත්වන ලදී. වාණිජ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් චීන - දකුණු ආසියා ජොෂ්ඨ ආර්ථික සහ වාණිජ නිලධාරීන්ගේ රැස්වීමට සහභාගී වන ලදී.

***Reflection Of Sri Lanka –වෙළඳාම ,සංචාරක කර්මාන්ත හා ආයෝජන පිළිබඳ පැවති කොළඹ දී ජාත්‍යන්තර ප්‍රදර්ශනය 2013 නොවැම්බර් මස 13 සහ 17***

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල වල වාණිජ කටයුතු භාර අංශ මගින් මේ සඳහා විශාල ප්‍රසිද්ධියක් සහ ‘ප්‍රවර්ධනයක් ලබා දුන් අතර, සිය ගණනක විදේශ ව්‍යාපාරික ප්‍රජාවේ මහත්ම මහත්මීන් මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවීම සිදුකරන ලදී

- **විදේශ වාණිජ නියෝජනය**

  “මහින්ද චින්තන ඉදිරි දැක්ම” සංකල්පයට අනුව යමින් ක්‍රියාත්මක වන පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්ව වැඩසටහන යටතේ, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් ශ්‍රී ලාංකික සමාගම් ජාත්‍යන්තර වෙළඳපළ වෙත හඳුන්වාදීමට මෙම දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. ශ්‍රී ලාංකික අපනයන සඳහා ජාත්‍යන්තර වෙළඳපළ තවදුරටත් පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා, විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවයෙහි යොදවා ඇති වෙළඳ නිලධාරීන්ගේ සහ ශ්‍රී ලංකාවේ පිහිටි අනෙකුත් සහාය ව්‍යාපාරික සංවිධානවල සහයෝගය ඇතිව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පෙළක් ක්‍රියාවට නංවන ලදී. නව අපනයන වෙළඳපළ හඳුන්වාදීම සහ පවත්නා වෙළඳපළවල වඩාත් යෝග්‍ය පරිසරයක්

නිර්මාණය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළඳපළ තුළ ඔවුනගේ වෙළඳපළ කොටස පුළුල් කිරීම සඳහා ප්‍රමුඛ අපනයනකරුවන් වෙත මූලික අවධානය යොමුකරන අතරතුර, වෙළඳ නිලධාරීන් විසින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් වෙත, විශේෂයෙන් පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්ව වැඩසටහන තුළින් ඔවුනගේ නිෂ්පාදන වෙනුවෙන් ජාත්‍යන්තර වෙළඳපළ ප්‍රවේශයක් ලබාගැනීම සඳහා අඛණ්ඩව සහයෝගය දක්වන ලදී.

විදේශයන්හි සිටින වෙළඳ නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා අපනයන අවස්ථාවන් හඳුනාගැනීම සඳහා වෙළඳපළ සමීක්ෂණ/ තොරතුරු සම්පාදනය කිරීම.
- සත්කාරක රටෙහි වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්, විශේෂයෙන් තීරුබදු සහ තීරුබදු නොවන ක්‍රියාමාර්ග අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම.
- වැදගත් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන/අවස්ථා සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය සංවිධානය කිරීම. මෙය, ශ්‍රී ලාංකික අපනයන ප්‍රවර්ධනය කිරීමෙහිලා වඩාත් ඵලදායී මෙවලමක් වශයෙන් සළකනු ලැබේ.
- ශ්‍රී ලංකාවේ පවත්වන ලද ප්‍රදර්ශන/අවස්ථා සඳහා විදේශීය ව්‍යාපාරික දූත පිරිස් සංවිධානය කිරීම.
- සත්කාරක රටවලදී ශ්‍රී ලංකා-විශේෂී (තනි-රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත වෙළඳ, ආයෝජන සහ සංචාරක දූත පිරිස් සංවිධානය කිරීම.
- ව්‍යාපාරික අවස්ථාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් සහ ශ්‍රී ලංකාව වෙත පුද්ගල ව්‍යාපාරික සංචාරයන් සංවිධානය කිරීම.
- සත්කාරක රටවල වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍ර වලට අදාළ රජයේ නිලධාරීන් ජාලගත කිරීම සහ ශ්‍රී ලංකාවේ වාණිජ සහ ආර්ථික කටයුතු වලට අදාළ ගැටළු/ කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය සහ ජාත්‍යන්තර සංවිධාන වලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.
- වෙළඳ, ආයෝජන සහ සංචාරක ආශ්‍රිත වෙළඳ විමසුම් සම්බන්ධයෙන් සේවය සැපයීම, විදේශ ව්‍යාපාරිකයින් හමුවීම/ සාකච්ඡා පැවැත්වීම, ශ්‍රී ලාංකික අපනයනකරුවන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම සහ වෙළඳ ආරවුල් විසඳීම යනාදිය.

# සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

**හැදින්වීම**

සමාගම් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා වෙනම ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමෙන් අනතුරුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වර්ෂ 1861 සිට සමාගම් වලට අදාලව පනවන ලද ආඥාපනත් සහ පනත් ක්‍රියාත්මක කරමින් දිපව්‍යාප්ත සේවාවක් සපයනු ලබයි. වෙනත් ව්‍යවස්ථා මගින් දෙපාර්තමේන්තුවට පැවරී ඇති සහ සමාගම් පනතේ අධීක්ෂණ හා නියාමන බලතල ක්‍රියාත්මක කරමින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා එහි ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

- **සමිති ආඥා පනත - 123 වන අධිකාරිය**

සමිති ආඥා පනත - 123 වන අධිකාරිය යටතේ සමිති ලියාපදිංචි කිරීම සහ මෙරට දැනට ලියාපදිංචි සමිති නියාමනය කිරීම මේ මගින් සිදුවේ. 2013 දෙසැම්බර් 31 වන දිනට සමිති 12,120 ක් ලියාපදංචි කර ඇත.

- **1935 අංක 61 දරන සීට්ටු ආඥාපනත**

සීට්ටු ලියාපදිංචි කිරීමට ක්‍රියාත්මක නොවේ.

- **1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත**

රුපියල් මිලියන 05 ඉක්මවන පොදු කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවකු හෝ ඒ වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයකු, අනු නියෝජිතයකු, උප නියෝජිතයකු හෝ නාමිකයකු ලියාපදිංචි කිරීම අරමුණු කර ගෙන, මෙම පනත 1987 දී හඳුන්වා දී ඇත. 2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා පොදු කොන්ත්‍රාත් අයදුම්පත් 4,455 ක් ලියාපදිංචි කර ඇත.

**එක් එක් අංශයේ ක්‍රියාකාරිත්වය**

- **තොරතුරු අංශය**


සමාගම් විසින් ලියාපදිංචි කිරීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා හෝ ගෙන එනු ලබන සියළුම ලියවිලි දෙපාර්තමේන්තුවට භාර ගැනීමට ප්‍රථම මෙම නිලධාරින්ගේ පරීක්ෂාවට භාජනය වේ. මෙම ක්‍රියාවලිය නිසා දෝෂ සහිත ලියකියවිලි ගොනු කිරීමෙන් ඇතිවන අනවශ්‍ය ලිපි හුවමාරුව අවම වීම, අපහසුතාවය අවම කිරීම, ලියාපදිංචි ක්‍රියාවලිය වේගවත් වීම සහ ලියාපදිංචි ලේඛනවල සහතික පිටපත් නිකුත් කිරීමේ ප්‍රමාදය අවම කිරීම සිදුවේ.

- **නම් අනුමත කිරීම සහ නව සමාගම් සංස්ථාගත කිරීම**

මෙම ක්‍රියාවලිය සඳහා සෑමවිටම ප්‍රමුඛස්ථානය ලබා දෙනු ලැබේ. සමාගම් නාමාවලිය පරීක්ෂා කිරීම සහ නව සමාගම් සංස්ථාගත කිරීමට ලැබෙන ලිපි ලේඛන පරීක්ෂා කිරීම සඳහා වගකීම් පැවරුණු, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට සෘජුවම වාර්තා කරන ජ්‍යේෂ්ඨ නිලධාරින් දෙදෙනෙකු පත් කර ඇත. සාමාන්‍යයෙන් අදාල අයදුම්පත ලැබුනු දිනට පසු දිනම එම නම අනුමත කිරීමට හා ලේඛණ ලැබුණු දිනට පසුදින සංස්ථාගත කිරීමේ සහතිකය නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත. 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2013 දෙසැම්බර් 31 වන විට නව ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 39,125 කි.

.

## 2007 මැයි මස 03 වනදා සිට, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගම්




| | Jan | Feb | mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2007 | | | | | 105 | 444 | 576 | 397 | 340 | 351 | 380 | 370 |
| 2008 | 395 | 436 | 460 | 378 | 334 | 399 | 397 | 342 | 395 | 332 | 354 | 310 |
| 2009 | 316 | 252 | 346 | 273 | 270 | 374 | 421 | 365 | 416 | 389 | 436 | 365 |
| 2010 | 357 | 436 | 523 | 334 | 394 | 470 | 595 | 576 | 585 | 630 | 625 | 816 |
| 2011 | 668 | 737 | 798 | 520 | 541 | 694 | 680 | 666 | 689 | 616 | 618 | 678 |
| 2012 | 685 | 616 | 682 | 469 | 619 | 567 | 563 | 645 | 547 | 629 | 532 | 630 |
| 2013 | 540 | 471 | 497 | 482 | 503 | 522 | 540 | 440 | 438 | 562 | 495 | 482 |

- **ලියාපදිංචි කිරීමේ අංශය**

ලේඛණ ලියාපදිංචි කිරීම සහ ලේඛනවල සහතික පිටපත් නිකුත් කිරීම ආදී කාර්යයන් රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරින් 25ක් සහ සංවර්ධන නිලධාරින් 15කගේ සහයෝගයෙන් ඒකක හතරක් යටතේ සිදුකරනු ලැබේ. සෑම එක් අංශයක්ම සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. මෙය දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යයක් වේ.

- **ඇවර කිරීමේ අංශය**

සමාගම් ඇවර කිරීම වෙනම ක්‍රියාත්මක වන වැදගත් විෂයක් වන අතර එය සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරුන් හතරදෙනාගෙන් එක් අයෙකු යටතේ ක්‍රියාත්මක වේ. 2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා සමාගම් 642ක් ඇවර කර ඇති අතර ව්‍යාපාර පවත්වාගෙන නොයන සමාගම් 471ක් රෙජිස්ටරයෙන් නම කපාහැරීමේ ක්‍රියාවලියට භාජනය කර ඇත.

**2013 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව**

| | |
|---|---|
| සමාජිකයින් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම | 45 |
| ණය ගැතියෙන් ස්වේච්ඡාවෙන් ඇවර කිරීම | 15 |
| අධිකරණයෙන් ඇවර කිරීම | 5 |
| පනතේ 394 යටතේ නම කපා හැරීම | 565 |
| ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපාහැරීම (245 වගන්තිය) | 12 |
| **එකතුව** | **642** |

- **නැවත ලියාපදිංචි කිරීමේ අංශය**

නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු මූලික වශයෙන් අවසන් කර ඇති බැවින්, මෙම අංශය මේ වන විට ක්‍රියාත්මක නොවේ.

- **නඩු පැවරීමේ අංශය**

දෙපාර්තමේන්තුවේ නඩු පැවරීමේ කටයුතු සමාගම් පරික්ෂකවරුන් 04 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මෙහෙයවනු ලබයි. සමාගම් පනත යටතේ කොන්දේසි කඩකරනු ලබන සමාගම් වලට හා අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නඩු පැවරීමේ කටයුතු මෙම අංශය විසින් සිදු කරනු ලබයි. එසේම පරික්ෂණ මෙහෙයවීම සහ විමර්ශණ සඳහා සහාය වීම ද ඔවුන් විසින් සිදු කරනු ලබයි. විශ්‍රාම යෑම සහ ඉවත්වීම හේතුවෙන් පුරප්පාඩු 03ක් ඇති අතර ඒවා පිරවීමට කටයුතු කෙරෙමින් පවතී. 2013 වර්ෂයේදී අලුතින් නඩු පැවරීම් 35ක් සිදු කර ඇත. ඊට අමතරව සිදු කරන ලද වැරදි 1,845ක් නඩු පැවරීමෙන් තොරව සමථයට පත් කර ඇත. වැරදි සමථයට පත් කිරීම මගින් දෙපාර්තමේන්තුව ලබා ඇති ආදායම රු. 10,692,927.00 කි.

- **ගිණුම් හා ආයතන අංශය**

දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු සහ පරිපාලන කටයුතු නිසි පරිදි කරගෙන යාම සඳහා වෙනම අංශ දෙකක් වශයෙන් ස්ථාපිත කර ඇති අතර පිළිවෙලින් ගණකාධිකාරිවරයකු හා පරිපාලන නිලධාරියකු මගින් ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. 2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ ආදායම රුපියල් මිලියන 406.8 ක් වන අතර සමස්ථ වියදම රුපියල් මිලියන 45.3 කි.

- **ප්‍රමුඛතා**

**දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පරිගණකගත කිරීම**

E.W. Information Systems (PVT) LTD ආයතනය මෘදුකාංග නිර්මාණකරු ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගෙන ඇත.

# ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

## හැඳින්වීම

රටක 2003 අංක 36 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය සම්බන්ධ බලය පැවරී ඇත. මෙම බලය පැවරීම සහිතව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ප්‍රථමයෙන් පිහිටුවන ලද්දේ 1979 අංක 52 දරණ ජාතික බුද්ධිමය දේපළ සංග්‍රහ පනතේ විධිවිධාන යටතේ 1980 දී ය.

## නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර

මෙම කාර්යාලය විසින් දේශීය හා විදේශීය පේටන්ට් බලපත්‍ර අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන නව නිපැයුම් වලට පේටන්ට් ආරක්ෂාව ප්‍රදානය කරනු ලැබේ. එසේ පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීමෙන් අනතුරුව ඊට අදාල අලුත්කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් යනාදී විවිධ අංගයන් ද මෙම කාර්යාලය විසින් පරිපාලනය කරනු ලැබේ.

**2013 දෙසැම්බර් 31 වන දිනටලැබී ඇති අයදුම්පත් සහ ඉටුකල කාර්යයන්**

| ක්‍රියාකාරකම | 2013 ලද අයදුම්පත් සංඛ්‍යාව | 2013 නිමකල සංඛ්‍යාව |
|---|---|---|
| ලියාපදිංචි කිරීම | 516 | 236 |
| ලැබුනුබව දැන්වීම | - | 603 |
| මූලික පරීක්ෂා | - | 656 |
| සංශෝධන | - | 17 |
| පිරික්සුම් හා පරීක්ෂණ වාර්තා | - | 152 |
| ගැසට් නිවේදන | - | 52 |
| සම්බන්ධිත ලිපි පිළිබඳ කටයුතු කිරීම | 550 | 1002 |
| වලංගු කිරීම හා විවිධ | - | 2048 |
| පැවරීම් | 09 | 15 |
| නම හා ලිපිනය වෙනස් කිරීම | 06 | 6 |
| අලුත් කිරීම් | 518 | 472 |
| ලේඛන පිටපත් | 17 | 51 |

- **වෙළඳ ලකුණු**

ලියාපදිංචි කිරීමට අයදුම්කර ඇති වෙළඳ ලකුණු, සේවා ලකුණු, සාමූහික ලකුණු සහ සහතික ලකුණු යන ලකුණු වල කාර්ය පටිපාටි, හරය සහ නෛතිකභාවය පිළිබඳව පරීක්ෂාකර බලා සුදුසුකම් ලැබූ ඒවා ලියාපදිංචි කිරීම මෙම කාර්යාලය මඟින් සිදු කෙරේ. තවද ලියාපදිංචි කරන ලද ලකුණු හා සම්බන්ධව අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් පිළිබඳ පරිපාලනමය කටයුතු ද ලකුණු හා සම්බන්ධ තොරතුරු රැස්කර ප්‍රචලිත කිරීම ද සිදු වේ.

***2013 දැසැම්බර් 31 වන දිනට ලැබී ඇති අයදුම්පත් සහ ඉටුකල කාර්යයන්***

| ක්‍රියාකාරකම | 2013 නිමකල සංඛ්‍යාව |
|---|---|
| වියානා වර්ගීකරණය | 4810 |
| පරීක්ෂාව හා සෝදිසි වාර්තා යැවීම | 20289 |
| ලකුණ පලකිරීමේ කටයුතු සැකසීම | 2656 |
| ගැසට් නිවේදන සකස් කිරීම | 2380 |
| ගැසට් නිවේදන පලකිරීම | 2169 |
| ලියාපදිංචිය කිරීමට යොමු කිරීම | 1459 |
| ලියාපදිංචි සහතික නිකුත් කිරීම | 1487 |
| අලුත් කිරීමේ සහතික | 1458 |
| ඒකපාර්ශ්වික විභාග | 522 |
| විරුද්ධපාර්ශ්වික විභාග | 23 |
| ගොනු වසාදැමීම් | 4159 |
| මුද්‍රණය කිරීම් | 38800 |
| පැවරීම්, නම හා ලිපිනය වෙනස් කිරීම සහ අවසර ගිවිසුම් | 3675 |

**අයදුම්පත් වෙනත් ලේඛන ලැබීම - 2013**

| | ලේඛන වර්ග | අයදුම්පත්/ ලේඛන ලැබීම් සංඛ්‍යාව | නිමකල සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ලියාපදිංචිය සඳහා අයදුම්පත් | 8825 | 20289 |
| 02 | ගැසට් නිවේදන පලකිරීමට ගෙවීම් | 3257 | 2656 |
| 03 | ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීම් | 2052 | 1487 |
| 04 | ලියාපදිංචිය අලුත් කිරීමේ අයදුම්පත් | 1993 | 1458 |
| 05 | පැවරීම්, නම හා ලිපිනය වෙනස් කිරීම සහ අවසර ගිවිසුම් | 757 | 3675 |

- **කාර්මික සැලසුම්**

කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම්ලත් ඒවා ලියාපදිංචි කිරීම මෙම කාර්යාලය මඟින් සිදුකරන අතර අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් ඇතුළු ලියාපදිංචි කිරීමෙන් පසුව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද කටයුතු කරයි. කාර්මික සැලසුම් හා සම්බන්ධ තොරතුරු එක්රැස්කොට බෙදා හැරීමද මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලැබේ.

**2013 දෙසැම්බර් 31 වන දිනටලැබී ඇති අයදුම්පත් සහ ඉටුකල කාර්යයන්**

| ක්‍රියාකාරකම | 2013 | |
|---|---|---|
| | ලද අයදුම්පත් සංඛ්‍යාව | නිමකල සංඛ්‍යාව |
| ලියාපදිංචි කිරීම | 346 | 130 |
| ලැබුනුබව දැන්වීම් | - | 229 |
| මූලික පරීක්ෂා | - | 361 |
| පරීක්ෂණ වාර්තා (නවතාවය පිළිගත් ) | - | 497 |
| පරීක්ෂණ වාර්තා (නවතාවය ප්‍රතික්ෂේපිත) | - | 177 |
| ලියාපදිංචි ගාස්තු කැඳවීම | - | 419 |
| ගැසට් නිවේදන | 445 | 459 |
| සම්බන්ධිත ලිපි පිළිබඳ කටයුතු කිරීම | 419 | 696 |
| වලංගු කිරීම හා විවිධ | - | 1627 |
| පැවරීම් | 1 | 1 |
| අලුත් කිරීම් | 95 | 140 |
| ලේඛන පිටපත් | 14 | 14 |

- **ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම්**

ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්යය ප්‍රවර්ධනය කිරීම ද මෙම කාර්යාලයෙන් සිදු වේ. ප්‍රකාශන හිමිකම් ආරාවුල් නිරාකරණය සඳහා වර්ෂය තුල ඉදිරිපත් වූ ඉල්ලීම් 04 ක් පිළිබඳව කටයුතු කෙරෙමින් පවතී.

- **යටිතල පහසුකම් සංවර්ධනය**

මෙහිදී මූලික අවධානය යොමු වූයේ බුද්ධිමය දේපළ පරිපාලනය පරිගණක ගත කිරීම කෙරෙහිය. වෙළඳ ලකුණු, පේටන්ට් හා කාර්මික සැලසුම් පිළිබඳ පරිගණක ක්‍රමය පූර්ණ ලෙස දැන් ක්‍රියාත්මක වේ. සරජ් අංශය සඳහා පරිගණක ක්‍රමවේදයක් හඳුන්වා දීමේ කටයුතු හා ආයතනයේ රාජකාරී කටයුතු සඳහා සියලු නිලධාරීන්ට රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා කාර්යාලයීය නිල විද්‍යුත් තැපැල් පහසුකමක් ලබා දීමේ වැඩපිළිවෙලක් පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී.

- **දැනුවත් භාවය වැඩිකිරීම සහ හැකියාවන් ගොඩනැංවීම**

බුද්ධිමය දේපළ භාවිතා කරන්නන්ගේ සහ අයිතිකරුවන්ගේ යහපත තකා බුද්ධිමය දේපළ පිළිබඳ මහජනතාව අතර දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම කෙරහි අවධානය යොමුව ඇත. රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම විවිධ ඉලක්ක

කණ්ඩායම් සඳහා සම්මන්ත්‍රණ සහ පොදු දේශනද ඇතුලු ක්‍රියාකාරකම් 07ක් සංවිධානය කිරීම හෝ සංවිධානය කිරීමට සක්‍රියව සහභාගිවීම බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිදුකරන ලදී. මේ සඳහා සම්බන්ධ වූ සංවිධානවලට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විනිසුරුවරුන්ගේ ආයතනය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය, කුළුබඩු මණ්ඩලය,ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා කජු සංස්ථාව, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන ද ඇතුළත් වේ.

සේවයේ සිටියදීම කාර්ය මණ්ඩලයට පුහුණුව ලබාදීම සෑම විටම ධෛර්යමත් කරනු ලැබේ. මීට අමතරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 15 දෙනෙකුට ද දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර නිලධාරීන් 10 ද විදේශ පුහුණුව/ සම්මන්ත්‍රණ හා රැස්වීම් වලට සහභාගී වීමට අවස්ථාව ලබාදෙන ලදී.

- **සැකසෙමින් ඇති නීතීන්**

අභිජනනකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ නීතිය පිළිබඳ මූලික ලේඛනයක් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සකස් කළ අතර මේ සම්බන්ධයෙන් පත්කල කැබිනට් අනුකමිටුව විසින් මෙම විෂය පිළිබඳව සම්පූර්ණ බලතල කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පැවරෙන පරිදි නව නීති සකස් කරන ලෙස උපදෙස් දී ඇත. ඒ අනුව නීති කෙටුම්පත් දෙපාර්තමේනතුව විසින් අවශ්‍ය සංශෝධන සිදු කරමින් ඇත. අදාළ හිමිකරුවන්ගේ බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ පසු ලියාපදිංචියක් බුද්ධිමය දේපළ කාර්යාලයේ අවශ්‍ය වේ දැයි පරීක්ෂා කර බලා ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසීම පිළිබඳව පසුව තීරණය කල යුතු බවද කමිටුව තීරණය කර ඇත. ප්‍රකාශන හිමිකම් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ස්වේච්ඡාවෙන් ලියාපදිංචියට (Voluntary Deposit) අවශ්‍යකරන නීති සම්පාදනය කිරීම, භූගෝලීය දර්ශක (Geographical Indication) ලියාපදිංචි කිරීම සඳහා නීති සැකසීම, සම්ප්‍රදායික දැනුම (Traditional Knowledge) ආරක්ෂා කිරීමට නීති සැකසීම සම්බන්ධයෙන් මූලික පියවර ගනිමින් ඇත.

- **ජාත්‍යන්තර සම්බන්ධතා**

බුද්ධිමය දේපළ දැනුම වැඩිදියුණු කිරීම අරබයා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය, ජපන් පේටන්ට් කාර්යාලය සහ කොරියානු අන්තර්ජාතික බුද්ධිමය දේපළ පුහුණු ආයතනය ස්වීඩන් රජය වැනි වෙනත් රටවල බුද්ධිමය දේපළ කාර්යාල හා ආයතන මගින් පවත්වන බුද්ධිමය දේපළ සම්බන්ධ වැඩ සටහන් වලට නිලධාරීන් සහභාගී කෙරේ. ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහාය ලබාගෙන ශ්‍රී ලංකාව තුළ බුද්ධිමය දේපළ දැනුම ප්‍රචලිත හා ප්‍රවර්ධනය කිරීමට වැඩ සටහන් ක්‍රියාත්මක කෙරේ.

- **තොරතුරු සහ උපදේශක සේවා**

බුද්ධිමය දේපළ පිළිබඳ උනන්දුවන ව්‍යාපාරික ආයතන, කාර්මික ආයතන, පර්යේෂණ හා සංවර්ධන ආයතන වැනි විවිධ සංවිධාන වල ආරාධනයෙන් මෙන්ම එම ආයතනද සහභාගී කරවාගෙන නිර්මාණ බිහිකරන්නන්ගේ හා නව නිපැයුම් කරුවන්ගේද ප්‍රයෝජනය පිණිස මෙම කාර්යාලය විසින් බුද්ධිමය දේපළ හා සම්බන්ධ සියලු ක්ෂේත්‍ර වලට අදාල තොරතුරු එක්රැස් කිරීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සිදුකරනු ලැබේ. නව නිපැයුම්කරුවන්ට, කර්මාන්තකරුවන්ට, ශාස්ත්‍රීය හා කලාත්මක නිර්මාණකරුවන්ට සහ පර්යේෂණහා සංවර්ධන ආයතනවලට ඔවුන්ගේ ඉල්ලීම මත විශේෂඥ සහ උපදේශන සේවා සපයනු ලැබේ. ආයතනයේ නමින් වෙබ් අඩවියක්(www.nipo.gov.lk) ක්‍රියාත්මක වෙමින් පවතී. එහි "තොරතුරු" යටතේ බුද්ධිමය දේපළ කාර්යාලය මගින් පවත්වන වැඩ සටහන් හා

සම්මන්ත්‍රණ පිළිබඳව ජනතාව දැනුවත් කෙරේ. සහභාගිවන්නන්ගේ අයදුම්පත් ද විද්‍යුත් තැපැල මගින් කැඳවනු ලැබේ. ඉක්මනින් තොරතුරු බෙදාහැරීම හා උපදෙස් ලබා දීම සඳහා තොරතුරු කවුළුවක් පිහිටුවා ඇත. එහි දී මහජන පිරික්සුම් 8703ක් සිදු කර ඇත. උපදෙස් සේවා 9893 ක් ලබා දී ඇත.

- **රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ සහයෝගීතාව**

රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන ගණනාවකට බුද්ධිමය දේපළ හා අදාල කටයුතු වලදි මෙම කාර්යාලය සහයෝගීතාව දක්වා තිබේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විනිසුරුවරුන්ගේ ආයතනය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය, කුළුබඩු මණ්ඩලය,ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා කජු සංස්ථාව, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය ඇතුලු පෞද්ගලික අංශයේ විවිධ ආයතන ද මීට ඇතුළත් වේ.

- **බුද්ධිමය දේපළ නියෝජිතයන්**

ලියාපදිංචි කිරීම් 24ක් අලුත්කර ඇත.නව ලියාපදිංචි කිරීම් 18ක් සිදු කරන ලදී.

- **මූල්‍ය කටයුතු**

ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන අප ආයතනය සේවා ගාස්තු අය කරමින් බුද්ධිමය දේපළ පනත යටතේ ස්ථාපිත කරන ලද බුද්ධිමය දේපළ අරමුදල පවත්වාගෙන යනු ලැබේ. ප්‍රශ්තුත කාලසීමාව තුලදී සපයන ලද සේවා මඟින් රැස්කර ගත් ආදායම් පහත දැක්වේ.

ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන අප ආයතනය සේවා ගාස්තු අයකරමින් බුද්ධිමය දේපළ පනත යටතේ ස්ථාපිත කරන ලද බුද්ධිමය දේපළ අරමුදල පවත්වාගෙන යනු ලැබේ.
ප්‍රශ්තුත කාලසීමාව තුලදී සපයන ලද සේවා මගින් රැස්කර ගත් ආදායම් පහත දැක්වේ.

| 2012 | 2013 |
|---|---|
| රු . 78,384,984.24 | රු. 78,176,424.13 |

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

### හැඳින්වීම


ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැළි ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය, තම වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය සහ විෂය පථය පැහැදිලිව හඳුනාගෙන ඇත. ඒ අනුව ප්‍රතිපත්ති උපදේශක, පසු විපරම්කරු ප්‍රවර්ධන සහායක සහ දැනුම ලබා දෙන්නා යනුවෙන් ප්‍රධාන භූමිකා 5 ක් යටතේ මණ්ඩලය අපනයන ක්ෂෙත්‍රයේ කටයුතු වල නියැලේ.

වසර ගණනක් පුරා, අපනයන සංවර්ධන මණ්ඩලය තම සුවිශේෂී ශක්තීන් සහ හැකියාවන් වර්ධනය කර ගන්නා ලදී. දශක තුනක් පුරාවට ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂෙත්‍රයේ සංවර්ධනයෙ අධිකාරිත්වය දරූ අපනයන සංවර්ධන මණ්ඩලය සතුව පැහැදිලිව විධායක බලයක් පවතින අතර එමගින් ආයතනයට ශක්තිමත් ස්ථාවරත්වයක් ලැබී ඇත. තම පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කරමින් යාවත්කාලීන දැක්මකින් සහ උපායමාර්ගයන්ගෙන්ද පරිපූර්ණය.

ව්‍යාපාරික ප්‍රජාවගේ ඉහළ මට්ටමෙ ගෞරවයට පාත්‍ර වී ඇති අපනයන සංවර්ධන මණ්ඩලය, තම උපායමාර්ගයන් ක්‍රියාත්මක කිරීමෙදී සහ අධීක්ෂණය කිරීමෙදී පෞද්ගලික අංශයේ ප්‍රමුඛයන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය මගින් තම දුරටත් ශක්තිමත් වේ.


පුළුල් උපදේශක ක්‍රියාවලියන්ගේ අනුග්‍රහයෙන් උපාය මාර්ගික අරමුණු සහ ක්‍රියාවන් ක්‍රමවත්ව දැක්විය හැකි අතර එමගින් ජාතික ආර්ථික අවශ්‍යතා, ගෝලීය ආර්ථික සහ ව්‍යාපාරික තත්වයන් මෙන්ම පාර්ශවකරුවන් සහ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් විය හැක.

### ජනවාරි සිට දෙසැම්බර් කාලය තුල අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගතිය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

2013 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයන ආදායම ඇ.ඩො.මිලියන 9,774 ක් වූ අතර එය පසුගිය 2012 වසර අපනයන ආදායම වූ ඇ.ඩො.මි 9,774 හා සසඳන විට 6.27% ක වර්ධනයක් දක්නට ලැබේ.




| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 | 903 | 882 | 921 | 759 | 833 | 820 | 962 | 951 | 853 | 890 | 879 | 906 |
| 2012 | 888.2 | 821 | 861 | 748.7 | 806 | 755.8 | 794.4 | 828.9 | 801.5 | 770.4 | 827.6 | 871.1 |
| 2013 | 728.7 | 797.5 | 837 | 696.6 | 793.9 | 807.4 | 857.8 | 918.1 | 890.3 | 1041 | 1032 | 986.1 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

### අපනයන සංවර්ධන මණ්ඩලය මගින් යොදාගන්නා ලද උපාය මාර්ග

2010 සහ 2011 වසර තුල සීඝ්‍ර වර්ධනයනක් පෙන්වූ ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂෙත්‍රය, 2012 වසරේදී ගෝලීය වෙළඳපලේ පවත්නා ඉල්ලුම් සීමාවන් සහ අභ්‍යන්තර සැපයුම් බාධාවන් නිසාවෙන් අපනයන ආදායමෙ අඩුවීමක් වාර්තා කරන ලදී.

අපනයන ක්ෂෙත්‍රයේ පසුබෑම වාර්තා වීමෙන් අනතුරුව අපනයන සංවර්ධන මණ්ඩලය කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය හා එක්ව ප්‍රධාන අපනයන කරුවන්ගේ අදහස් විමසීමේ හමුවන් සංවිධානය කරන ලදී.

ගෝලීය ආර්ථික පසුබෑමෙන් ඇතියව අභියෝගතා වලට අපනයනකරුවන් මුහුණ දීමේදී ඇතිවන ගැටළු සාකච්ඡා කිරීම සහ අපනයන ක්ෂෙත්‍රය වර්ධනයන කිරීම සඳහා සුදුසු උපායමාර්ගයන් සකස් කිරීමේ අරමුණින් මෙම හමුවන් පවත්වන ලදී. මෙහිදී පාර්ශව කරුවන්ගෙන් ලැබුණු තොරතුරු ආශ්‍රයෙන් අපනයන සංවර්ධණ මණ්ඩලය, අපනයන ක්ෂෙත්‍රයට බාධා ගෙන දෙන මහා පරිමාණ ගැටළු සහ නිෂ්පාදන ක්ෂෙත්‍රයන්ගේ ගැටළු ඇතුලත් ගොනුවක් පිළියෙල කරන ලදී.

එමෙන්ම අපනයන ක්ෂෙත්‍රයේ වර්තමාන තත්වය , අපනයනයේ රටාවන් ගැටළු සහ අපනයන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා යෝජිත උපායමාර්ගයන් විශ්ලේෂණය කරමින් වාර්තාවන්ද අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සකස් කරන ලදී.

සකස් කරන ලද සියළුම වාර්තා මෙම ආර්ථික තත්වයට මුහුණ දීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම යාවත්කාලීන කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන සංවර්ධන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයට, ගරු ආර්ථික කටයුතු ඇමතිතුමාට, ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමාට සහ ගරු ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය තුමාට ප්‍රධානය කරන ලදී.

- **උපදේශක සභා පිහිටුවීම**

1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත යටතේ උපදේශක සභා 26 ක් පිහිටුවනු ලැබූ අතර 2013 ජුනි 11 වන දින, නො: 1814/14 අංක දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කරන ලදී.

2013 ජූලි 10 වන දින ගරු රිෂාඩ් බදියුදීන්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා විසින් ප්‍රධාන අපනයන ක්ෂෙත්‍රයන් සහ අනෙකුත් අපනයන ආශ්‍රිත ක්ෂෙත්‍රයන් ආවරණය වන පරිදි පිහිටුවනු ලැබූ උපදේශක සභා සාමාජිකයන්ට පත්වීමේ ලිපි ප්‍රදානය කරනු ලැබිය. මෙයට සමගාමීව "එක්ස්පෝ 2014" අන්තර්ජාතික ප්‍රදර්ශනය නිල වශයෙන් මෘදුකාංක ඇසුරින් දියත් කරන ලදී. මෙයට අමතරව පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයන්ගේ හමුව ඉලක්ක කොටගෙන සංවිධානය කිරීමට නියමිත වෙළඳ ප්‍රදරශනයක් පිළිබඳවද නිවේදනය කරන ලදී.

මෙම ප්‍රදර්ශනයේ ශ්‍රී ලාංකිය අරමුණ අපනයනකරුවන් 200-300 කගේ තත්වයෙන් උසස් නිෂ්පාදන සහ සේවා එකම වේදිකාවක් තුලදී සියළුම පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල නායකයින් හා වෙළඳ නියෝජිතයන්ට නැරඹීමට සැලැස්වීමයි. මෙහිදී අපනයන සංවර්ධන මණ්ඩලය , මෙම ප්‍රදරශනය සංවිධානය කිරීම සඳහා උපදේශක සභාවන්ගේ නියෝජිතයනගේ අනුග්‍රහය අයැද සිටින ලදී.

- **වෙළඳපල සංවර්ධන වැඩසටහන්**

ශ්‍රී ලාංකීය අපනයන වලින් 50%කට ආසන්න ප්‍රමාණයක් ඇදී යන්නේ යුරෝපා කලාපයට සහ ඇමරිකා එක්සත් ජනපදයට වේ.

වෙළඳපල කිහිපයක් මත රැඳියාව නිසා එම වෙළඳපලවල ආර්ථිකයේ වෙනස්වීම අප අපනයන ක්ෂෙත්‍රය කෙරෙහිද බලපානු ලබයි. මෙයට ප්‍රතිවිරෝධය දක්වමින් ආසියානු කලාපය, ලෝකයේ වර්ධනයේ මධ්‍යස්ථානය බවට පත්වෙමින් සිටී. 2013 දී ආසියානු කලාපයේ ප්‍රධාන වෙළඳපල වන ඉන්දියාව සහ චීනය 6%කින් වර්ධනය වීමට අපේක්ෂිතය. ඒ නිසා මෙම වෙළඳපල වලට අපනයනය කිරීමේ හැකියාව වැඩිවීමත් මෙම අනෙකුත් රටවලට අපනයනය කිරීමේ හැකියාව වැඩිවනු ඇත.

දැනට අපගේ අපනයන වෙළඳපල වලට යවනු ලබන අපනයන ප්‍රමාණය එලෙසම තබා ගැනීම සහ නව වෙළඳපලවල් හඳුනා ගනිමින් ඒවාට අපනයනය කිරිමෙන් අපනයන ආදායම වැඩි කළ යුතුය.

නව වෙළඳ උපාය මාර්ගයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය BRICS කලාපයට අපනයනයන් වැඩි කිරීමට කටයුතු කරමින් සිටී. එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය අප්‍රිකානු හා CIS කලාපයේ රටවල ද වෙළඳපොල ගවේෂණය කරමින් සිටී. මීට අමතරව යුරෝපා කලාපයේ ප්‍රධාන රටවල් කිහිපයකට පමණක් තිබූ සැලකිල්ල තුර්කියට ද යොමු කළ යුතු වේ.

නිෂ්පාදන සහ වෙළඳපල විවිධාංගිකරණය සහ අපනයන ක්ෂෙත්‍රයේ තරඟකාරිත්වය වැඩි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම මෙන්ම නිෂ්පාදන සන්නාමිකරණය සඳහා විශේෂ අවධානය ලක් කළ යුතුයි.

### වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන්

ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවාවන්, දැනට පවත්නා, නව සහ නැගී එන අරමුණින්, අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන වෙළඳපල ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

පලමු ඇමිණුම මගින් අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක කළ වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් සවිස්තරාත්මකව දැක්වේ.

අදාල කාලය තුල පහත වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය සංවිධානය කරන ලදී.

- **යුරෝපා කලාපය:**

1.යුරෝපා මුහුදු ආහාර වෙළඳ ප්‍රදර්ශනය(European Sea Food Exposition (ESE) - අපනයනකරුවන් 06

2.අයි පී එම් එසන් ෆෙයා 2013 (IPM Essen Fair 2013) - අපනයනකරුවන් 04

3.(BIOFACH) බයෝ ෆැක් 2013 - අපනයනකරුවන් 03

4.පේපර් වර්ල්ඩ් 2013 (Paper world) - අපනයනකරුවන් 07

5.නෙදර්ලන්තයේ CEBIT 2013 - අපනයනකරුවන් 05

6.ලන්ඩන් පොත් ප්‍රදර්ශනය 2013 - අපනයනකරුවන් 07

7.නෙදර්ලන්තයේ, ජාතින් සන්නාමිකරන අන්තර්ජාතික ප්‍රදර්ශනය(Nation Branding International Export) - අපනයනකරුවන් 04

8.එක්සත් රාජධානියේ අන්තර්ජාතික Food & drink Event - අපනයනකරුවන් 05

9.ජර්මනියේ අනුගා අන්තර්ජාතික වෙලෙඳ ප්‍රදර්ශනය - අපනයනකරුවන් 15

- **ඇමරිකානු කලාපය**

1.SIAL කැනඩා වෙළඳ ප්‍රදර්ශනය සහ සකස්කළ ආහාරපාන නිෂ්පාදනයන් දැනුම ලබාගැනීමේ වැඩසටහන - අපනයනකරුවන් 07

2.ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝහි IFT 2013 - අපනයනකරුවන් 08

3.ඇමරිකා එක්සත් ජනපදයේ සැන් ෆ්‍රැන්සිස්කෝ හි IFEAT 2013 -අපනයනකරුවන් 08

4.ඇමරිකා එක්සත් ජනපදයේ ලාස් වේගාස් හි Sourcing at Magic අන්තර්ජාතික මෝස්තර වෙළෙඳ ප්‍රදර්ශනය - අපනයනකරුවන් 09

- **ආසියානු කලාපය**

1.ඇක්වාරාමා අන්තර්ජාතික මත්ස්‍ය තරඟය සහ දැනුම ලබාගැනීමේ චාරිකාව - අපනයනකරුවන් 17

2.ඉන්දියා රබර් Expo 2013 - අපනයනකරුවන් 06

3.හොං කොං හි House ware Show 2013 - අපනයනකරුවන් 06

4.ඩුබායි හි තාක්ෂණික සහ වෙළඳපල දැනුවත් වීමේ වැඩ සටහන - අපනයනකරුවන් 07

5.චීනයේ දී පාවහන් හා සම්භාණ්ඩ පිළිබඳ තාක්ෂණය ලබා ගැනීමේ වැඩසටහන - අපනයනකරුවන් 10

6.චීනෙය් Chinaplas 2013 - අපනයනකරුවන් 08

7.අපනයන සේවා ක්ෂේත්‍රය සඳහා චීනයේ, බීජිංහි අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයට වෙළෙඳ දූත කණ්ඩායමක් සහභාගි කරවීම - අපනයනකරුවන් 07

8.ඉන්දියාවේ SOLO වැඩසටහන - අපනයනකරුවන් 15

9.ජපානයේ Foodex 2013 - අපනයනකරුවන් 04

10.චීනයේ කුන්මින් හි පළමු චීන දකුණු - අපනයනකරුවන් 114, ආසියා වෙළඳ ප්‍රදර්ශනය (SACTF)

11.ජපානයේ IFEX වෙළඳ ප්‍රදර්ශනය - අපනයනකරුවන් 06

- **මැද පෙරදිග කලාපය**

1.එක්සත් අරාබි එමීරයේ - අපනයනකරුවන් 15 Gulfood 2013

2.දකුණු අප්‍රිකාවේ SAITEX 2013 - අපනයනකරුවන් 06

අපනයන සංවර්ධන මණ්ඩලය වෙළඳපල කිහිපයක් මත රැඳියාව අඩු කිරීමට ශ්‍රී ලාංකීය අපනයන විවිධාංගීකරණය කිරීමේ අරමුණින් අදාල කාලය තුල වෙළඳපල පර්යේෂණයන් දෙකක් සිදු කරන ලදී.

1.ශ්‍රී ලංකාවේ අපනයන සඳහා නව ගමනාන්තයක් වන බ්‍රසීලියානු අ◌ාර්ථිකය.

2.ශ්‍රී ලංකාවේ අපනයන සඳහා දකුණු අප්‍රිකානු වෙළඳපලේ අවස්ථා

“බ්‍රසීලියානු ආර්ථිකය” පිළිබඳ වාර්තාව, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාට, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශ ලේකම්තුමාට, අදාල තානාපති කාර්යාල සහ වාණිජ දෙපාර්තමේන්තුවට යොමු කළ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් අනතුරුව අනෙක් වාර්තාවද අදාල ආයතන වලට යොමු කිරීමට නියමිතය.

- **ප්‍රධාන වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන්**

තුර්කියේ 82 වන ඉස්මීර් අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයෙ◌් ශ්‍රී ලංකාව වැජබේ.

2013 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 02 දක්වා තුර්කියේ පැවැති 82 වන ඉස්මීර් අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ සහභාගීත්වය සංවිධානය කරන ලදී.

තුර්කියේ පැරණිතම වෙළඳ ප්‍රදර්ශනයක් වන මෙහි මිතුරු රාජ්‍යයක් ලෙස ක්‍රියා කිරීමට ප්‍රථම වරට ආසියානු රටක් වන ශ්‍රී ලංකාවට හැකිවේ. ශ්‍රී ලංකාව වෙළඳ ආයෝජන සහ සංචාරක කර්මාන්තයන් සඳහා විශ්වාසනිය දිවයිනක් ලෙස ප්‍රවර්ධනය කිරීම මෙහි ශ්‍රී ලාංකීය සහභාගිත්වයෙන් සිදු කෙරිණි.

අපනයන වර්ධනය තුලින් ජාතික අ◌ාර්ථිකය ගොඩ නැගීමේ අරමුණින් මෙම ශ්‍රී ලාංකීය සහභාගිත්වය අපනයන සංවර්ධව මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණු වූයේ ශ්‍රී ලංකාවේ වෙළඳ ආයෝජන සහ සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සහ අන්තර්ජාතික ගැණුම්කරුවන් තුළ ශ්‍රී ලාංකීය තත්වයෙන් උසස් භාණ්ඩ සහ සේවා පිළිබඳ විශ්වාසය ගොඩ නැංවීමත්ය.

ප්‍රදර්ශනයට සමගාමීව ශ්‍රී ලංකා නියෝජිත පිරිසට ගැම්බියා තානාපත්, ලිබියානු අමාත්‍ය දූත මණ්ඩලය, ඉන්දුනීසියානු වෙළඳ දූත මණ්ඩලය, තුර්කියේ ඉස්මීර් සහ සිනෙ◌ාප් නගරයේ රජයේ ආණ්ඩුකාරවරයා සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාව ලැබිණ. එමෙන්ම තුර්කියේ ප්‍රධාන ව්‍යාපාරිකයන් සමඟ වෙළඳ හමුවන්ට සහභාගී වීමටද ශ්‍රී ලාංකීය නියෝජිත පිරිසට හැකි විය.

ශ්‍රී ලාංකීය අපනයනකරුවන් තත්වයෙන් උසස් නිෂ්පාදන රාශියක් ප්‍රදර්ශනය කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය මෙම ප්‍රදර්ශනයට සහභාගී කරවූ අපනයන කරුවන්ගේ ප්‍රගතිය එනම්

ඔවුන් ලැබූ වෙළඳ ඇණවුම් අ◌ාදිය ඇගැයීමට ලක්කිරීමට බලාපොරොත්තුවේ. 2013 අගෝස්තු 29 වන දින පැවති ප්‍රදර්ශනයෙ◌් සමාරම්භක උළෙලට සහභාගි වූ ගරු රිෂාඩ් බදියුදීන්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා රැස්ව සිටි පිරිස අමතා දෙ◌්ශනයක් පවත්වන ලදී. ගරු ෆිසාර් මුස්තාෆා, සංචාරක කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමාද මේ අවස්ථාවට සහභාගි විය.

ශ්‍රී ලාංකීය සහභාගිත්වය අතිශයින් සාර්ථක වූ අතර එමගින් විදේශීය ගැණුම්කරුවන්ට ආකර්ශනීය සහ සීඝ්‍රයෙන් වර්ධනය වන ශ්‍රී ලාංකීය වෙළඳපලෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ ප්‍රදර්ශනය කළ හැකි විය.

අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය සහ තරගකාරිත්වය නිර්මාණය කිරීම සඳහා කැප වී සිටින අතර අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන මගින් ශ්‍රී ලංකාව පිළිබඳ ලොවට ගෙන යාමද සිදු කරයි.

**දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය**

අපනයන සංවර්ධන මණ්ඩලය චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව ප්‍රථම වරට චීනයේ කුන්මින් හි දකුණු ආසියානු වෙළඳ ප්‍රදර්ශනය සඳහා වෙළඳ කුටි 130 කින් සමන්විත ශ්‍රී ලාංකීය සහභාගීත්වය සංවිධානය කරන ලද අතර එමගින් සාර්ථක ව්‍යාපාරික ප්‍රතිපල අත්කර ගත හැකි විය.

දකුණු ආසියානු රටවලින් චීනයට සිදු කරන අ◌ානයන වැඩි කිරීමේ අරමුණින් චීනයේ වාණිජ අමාත්‍යාංශය සහ යනාන් ප්‍රාන්ත රජය එක්ව මෙම ප්‍රදර්ශනය සංවිධානය කරනු ලැබේ. මෙවර ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපය තුල මැණික් සහ අ◌ාභරණ කුටි 77ක්, තේ 12ක්, අත්කම් 15ක්, කොහු ආශ්‍රිත නිෂ්පාදන 03ක්, රබර් සහ ප්ලාස්ටික් 02ක්, ආයුර්වේද නිෂ්පාදන 01ක් සහ සංචරණය 03ක් යනාදි වශයෙන් වෙළඳ කුටි තුල ශ්‍රී ලාංකීය නිෂ්පාදන ප්‍රදර්ශනය කෙරිණ.

මැණික් සහ ආභරණ, තේ, අත්කම් සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන වැඩිම ප්‍රගතියක් අත්කරගත් ක්ෂේත්‍ර වූ අතර මෙවර ප්‍රදර්ශනය තුලින් ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට ඇ.ඩො. මිලියන 1.3ක වෙළඳ ඇනවුම් ලැබී තිබිණ.

මීට අමතරව ප්‍රදර්ශනයට සමගාමීව පැවැති 21 වන චීන දකුණු ආසියානු වෙළඳ සමුළුවට සහභාගි වීමේ අවස්ථාවක් ලැබිණ.

ගරු දී.මු. ජයරත්න අග්‍රාමාත්‍ය තුමා, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමා සහ අපනයන සංවර්ධන මණ්ඩලය නිලධාරින්, යුනාන් ප්‍රාන්තයේ වැඩ බලන ආණ්ඩුකාරවරයා, අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ චීන කවුන්සිලය සහ යුනාන් ප්‍රාන්තයේ නිරෝධානය දෙපාර්තමේන්තුව සමඟ දෙරටේ ආර්ථික සංවර්ධනය වර්ධනය කිරීමේ අරමුණින් සාකච්ඡාවන් පවත්වන ලදී.

එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් චීනයේ විශාලතම පරිසර හිතකාමී එළවළු සහ පළතුරු නිෂ්පාදන සමාගමක් වන Chennong සමාගමේ කළමණාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීමේ අවස්ථාවක් ශ්‍රී ලාංකීය පරිසර හිතකාමී කොහු ආශ්‍රිත බඳුන් නිෂ්පාදිත අපනයනකරුවෙකුට ලබාදෙන ලදී.

ඇක්වාරාමා 2013 අන්තර්ජාතික මත්ස්‍ය තරඟය - ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා සම්මාන 30 ක්.

අපනයන සංවර්ධන මණ්ඩලය, සිංගප්පූරුවේ පැවැති අන්තර්ජාතික මත්ස්‍ය ප්‍රදර්ශනය සඳහා අපනයන කරුවන් 17කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කරන ලදී.

ශ්‍රී ලාංකීය මත්ස්‍ය අභිජනකයින් මෙම ලෙ◌ාව විශාලතම විසිතුරු මත්ස්‍ය තරගයේදී සම්මාන 30 ක් දිනා ගන්නා ලදී. විශේෂයෙන්ම ප්‍රථම වරට

ගෝල්ඩ්ෆිශ්, ගුරාමි සහ ජලජ පැළෑටි වැංකිය ශ්‍රී ලංකාවට සම්මාන හිමි විය.

මින් දෙදෙනෙක්ම අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කෘෂි කලාප ව්‍යාපෘතිය යටතේ පිහිටුවනු ලැබූ පොළොන්නරුව විසිතුරු මත්ස්‍ය ව්‍යාපෘතියේ සාමාජිකයන් වේ.

**මෙරට තුල ගැණුම්කරු - විකුණුම්කරු හමු**

- 2013 අගෝස්තු මස BMICH හි පැවැති Profood වෙළඳ ප්‍රදර්ශනය හා සමගාමීව එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් ගැණුම්කරු නියෙ◌ා◌්ජනයක් ගෙන්වීමට වොක්රාම්, ලූලා, අල් මායා ආදි ප්‍රසිද්ධ සුපිරි වෙළඳසැල් වලින් ගැණුම්කරුවන් 06ක් ගෙන්වීම, ඔවුන් සඳහා කර්මාන්ත ශාලාවන්ට චාරිකා සංවිධානය කිරීම.
- 2013 අන්තර්ජාතික මැණික් සහ ආභරණ ප්‍රදර්ශනය FACETS සඳහා රුසියාව, චීනය සහ ඇමරිකා එක්සත් ජනපදයෙන් ගැණුම්කරුවන් ගෙන්වීම.
- 2013 පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා පෝලන්තය, ජෝර්දානය, දකුණු අප්‍රිකාව සහ ඉන්දියාවෙන් ගැණුම්කරුවන් ගෙන්වීම.
- 2013 සැප්තැම්බර් 04 වන දින නෙදර්ලන්තයෙන් වෙළඳ ධූත කණ්ඩායමක් - 15 දෙනෙකුගෙන් යුතු වෙළඳ නියෝජිත කණ්ඩායම සඳහා වෙළඳ සමුළුවක් සහ B2B හමුවක් සංවිධානය කරන ලදී.
- තේ, ආයුර්වේද සහ සෙරමික් ක්ෂේත්‍ර සඳහා ව්‍යාපාරික වෙළඳ සබඳතා ගොඩ නගා ගැනීමේ හැකියාවන් ගවේෂණය කිරීමට 2013 පෙබරවාරි 08 සිට 10 දක්වා පෝලන්තයෙන් ගැණුම්කරුවන් තිදෙනෙක්ගේපැමිණීම සංවිධානය කරන ලදී.
- නව දිල්ලියෙහි පිහිටි බෙලරුසියා තානාපති කාර්යාලය මගින් නියෝජිතයන් 10කගෙන් යුත් වෙළඳ ධූත පිරිසක් ශ්‍රී ලංකාවට එවන ලද අතර අපනයන සංවර්ධන මණ්ඩලය ව්‍යාපාරිකයන් 40ක් සමඟ ව්‍යාපාරික හමුවන් සංවිධානය කරන ලදී.
- 2013 ජුලි මස පැවති “ආයුර්වෙද එක්ස්පෝ” ප්‍රදර්ශනය හා සමගාමීව ආයුර්වෙද හා ස්පා නිෂ්පාදන පිළිබඳ ව්‍යාපාරික සබඳතා ගොඩ නගා ගැනීමට දකුණු අප්‍රිකාවෙන් සාමාජිකයන් 03 දෙනෙකුගෙන් යුතු වෙළඳ ධූත පිරිසකගේ ආගමනය සංවිධානය කරන ලදී. ව්‍යාපාරික හමුවන් 05ක් සහ කර්මාන්තශාලාවන් සඳහා චාරිකා 02ක් සංවිධානය කරන ලදී.
- 2013 අගෝස්තු 26 සිට 31 දක්වා ඊශ්‍රායලයෙන් 25 දෙනෙකුගෙන් සමන්විත වෙළඳ ධූත පිරිසකගේ ආගමනය සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකාවේ චාරිකාවක් සඳහා පැමිණි ගරු බල්ගේරියාවේ කොන්සාල්තුමා වෙනුවෙන් සෙරමික් සහ පිඟන් භාණ්ඩ, මේස් මෝස්තර, කොහු ආශ්‍රිත නිෂ්පාදන සහ ස්පා නිෂ්පාදන, ඇඟළුම් කර්මාන්ත ශාලා යනාදිය සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරන ලද අතර රැස්වීම් 10ක් පවත්වන ලදී.
- නෙදර්ලන්තයෙන් පැමිණි වෙළඳ නියෝජිත පිරිස වෙළඳ සමුළුවක් සහ B2B හමුවන් සංවිධානය කරන ලදී.

**කෘෂි කාර්මික නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන සහ අපනයන සෙ◌්වා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.**

2013 ජනවාරි - සැප්තැම්බර් කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය කෘෂි කාර්මික නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන සහ අපනයන සේවා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය සංක්ෂිප්තව පහත දැක්වේ.

- **ශ්‍රී ලංකා කුරුඳු සන්නාමිකරණය**

ලෝක බුද්ධිමය දේපල කාර්යාලය (WIPO) හා එක්ව පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම.

"Pure Ceylon Cinnamon" අන්තර්ජාතික වෙළඳපලේ ගෝලීය සන්නමනාමයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිහිටුවන ලැබීය. වෙළඳ ලත් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රධාන වෙළඳපලවල්වල ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපලවල ලියාපදිංචි කරන ලද අතර ලෝක බුද්ධිමය දේපල කාර්යාලයේ ලියාපදිංචිය සඳහා දැනටමත් ඉල්ලුම් කර ඇත.

ශ්‍රී ලංකා කුරුඳු "පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු" ලෙසින් සන්නාමිකරණය සහ ඉලක්ක වෙළඳපලවල සන්නාමිකිරීම තුලින් ශ්‍රී ලංකාවේ කුරුඳු වල ප්‍රධාන ලක්ෂණ ඉස්මතු කිරීමෙන් කැසියා වැනි බාල ආදේශක වලින් කුරුඳු වෙන්කර හඳුනා ගැනීමට සැලැස්වීමෙන් තරඟකාරිත්වයේ වාසිය ශ්‍රී ලංකාවට ලබා ගත හැක.

මේ අනුව අන්තර්ජාතික වෙළඳපලේ සන්නාමිකරණය කරන ලද කුරුඳු මගින් සියළුම ආවේණික ලක්ෂණ පිළිඹිබු කරනු ලැබේ.

මෙක්සිකෝ, පීරු සහ කොලොම්බියා වෙළඳපල වලද ශ්‍රී ලංකා කුරුඳු වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කර තිබේ.

එමෙන්ම අපනයනය කරන කුරුඳු ආශ්‍රිත නිෂ්පාදන සඳහා "පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු" සන්නම් ලකුණ ලබා දීමට අපේක්ෂිතය.

ශ්‍රී ලංකා කුරුඳු (Ceylon Cinnamon) හි භාරකාරත්වය, කැබිනට් මණ්ඩල අනුමැතියකින් අපනයන සංවර්ධන මණ්ඩලයට ලැබුණු අතර "Sri Lanka Cinnamon" සහ "Sri Lankan" යනාදිය ද භාවිතා කිරීමේ අයිතිය මණ්ඩලය සතු විණ. එමෙන්ම ශ්‍රී ලාංකීය කුරුඳු අ◌ාරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමෙ මගකීම ද මණ්ඩලයට පැවරිණ.

පලමු පියවර යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය භූගෝලීය දර්ශකය (GI) යටතේ කුරුඳු ආරක්ෂා කිරීමට ජාතික බුද්ධිමය දේපල කාර්යාංශය (NIPO) සමග ශ්‍රී ලංකා කුරුඳු ලියාපදිංචි කරමින් සිටී.

එමෙන්ම යුරෝපා මණ්ඩලයට අමතරව අනෙකුත් වෙළඳපලවල ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

එමගින් ශ්‍රී ලාංකීය කුරුඳු සඳහා වැඩි ආරක්ෂාවක් ලැබෙන අතර කැසියා කුරුඳු වලින් ආරක්ෂාවක් ද ලැබේ.

**"අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්ය කිරීම" පිළිබඳ සම්මන්ත්‍රණය**

අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව කුරුඳු කර්මාන්තයේ නියැලි සිටින්නන්ට අවශ්‍ය වන ප්‍රමිතීන් සහ ආරක්ෂා සුරක්ෂිතතාවය පවත්වා ගැනීමට අවශ්‍ය දැනුම ලබා දීමේ අරමුණින් "අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්රමිති පිරිවිතර අනිවාර්ය කිරීම" මැයෙන් සම්මන්ත්‍රණයක් 2013 සැප්තැම්බර් 06 වන දින මණ්ඩලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

අපනයනය කරනු ලබන කුරුඳු සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර අනිවාර්ය කිරීම, 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වන අතර ඒ අනුව මෙම සම්මන්ත්‍රණය මගින් කුරුඳු කර්මාන්තයේ නියැලී සිටින්නන්ට අන්තර්ජාතික වෙළඳපලට පිවිසීමට අවශ්‍යවන ප්‍රමිතීන් සහ කුරුඳු කර්මාන්තයේ ගුණාත්මක බව වැඩිකිරීමට මෙන්ම අපනයන වෙළඳපල අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සැලකිලිමත් වීම සඳහා අනුග්‍රහය ලැබිය.

**අගය වර්ධනය කිරීමේ වැඩසටහන - කුරුඳු තලන්නන්ගේ පුහුණු විද්‍යාලයේ වැඩ කටයුතු සංවිධානය කිරීම.**

2013 ජාතික අයවැය මගින් අපනයන සංවර්ධන මණ්ඩලයට "කුරුඳු තලන්නන් විධිමත්ව පුහුණු

කිරීම සඳහා විද්‍යාලයක්" ඇරඹීම සඳහා අනුමැතිය ලැබුණි.

ශ්‍රී ලංකාවේ කුරුඳු කර්මාන්තයේ නිෂ්පාදන හැකියාව සහ තරඟකාරිත්වය වැඩි කිරීමේ අරමුණින් UNIDO හා එක්ව කුළු බඩු නිෂ්පාදකයන්ගේ කවුන්සිලය මගින් මෙම අය වැය යෝජනාව ඉදිරිපත් කරන ලදී. කුරුඳු පුහුණු විද්‍යාලය (Cinnomon Training Academy (Pvt.) Ltd (CTA) හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ගිවිසුම අත්සන් කරන ලදී.

- **විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සඳහා**

නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2013 ජාතික අයවැය මගින් අනුමත වූ විසිතුරු මත්ස්‍ය ක්ෂෙත්‍රයේ නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා මූල්‍ය සහනයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. අපනයන වෙළඳපල පැවැත්ම සහ වර්ධනය කිරීම සඳහා ආනයනික රටවල විශේෂයෙන් ජීවීන් සඳහා වූ නිරෝධායන සහ සෞඛ්‍යාරක්ෂිත ක්‍රම පිළිබඳ නීති රෙගුලාසි අනුගමනය කළ යුතුය.

ශ්‍රී ලාංකීය සෘජු සහ වක්‍ර විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් බහුතරයකට තවමත් උචිත නිරෝධායන සහ රඳවා ගැනීමේ පහසුකම් නොමැති වීම නිසා අවසාන ගමනාන්තය සඳහා පැමිණීමේදී මසුන් වැඩි ප්‍රමාණයක් මිය යාම සිදුවේ. එනිසා මෙම පහසුකම් ඇතිකිරීමත්, නිරෝධායන ක්‍රියාවලිය අනුගමනය කිරීමත් සමඟම අපනයනකරුවන්ට මත්ස්‍යයින්ගේ යහපත් සෞඛ්‍ය පවත්වා ගත හැකිවනු ඇත. මෙම සහන ලබා දීමේ වැඩ සටහනට තෝරාගත් අපනයනකරුවන්ට රුපියල් මිලියන 1.5 ක උපරිමයකට යටත්ව ඔවුන්ගේ මත්ස්‍ය ගොවිපල සංවර්ධනය සඳහා වැයවූ මුදලින් 50% ක් ප්‍රතිපූර්ණය කරනු ලැබේ. 2013 වසරේදී ව්‍යාපෘති 26ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර ඇත. මෙම වැඩ සටහන පිළිබඳ දැන්වීම් පළකල අතර යෝජනා 29ක් ලැබී ඇත. සුදුස්සන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. පත්කරන ලද ඇගයීම් කමිටුව ව්‍යාපෘති 26ක් සඳහා මූලික චාරිකා සිදුකරන ලද අතර ව්‍යාපෘති 14ක් ඇගැයීමට ලක් කරන ලදී.

- **"ශ්‍රී ලංකා නිල් මැණික්" හි ආවේණික බව ඉස්මතු කරමින් ශ්‍රී ලංකා මැණික් සහ ආභරණ ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම**

අපනයන සංවර්ධණ මණ්ඩලය ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය හා එක්ව ශ්‍රී ලංකාවේ මැණික් සහ ආභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවලෙක් ආරම්භ කරන ලදී.

වසර 2015 දී ඇමරිකානු ඩොලර් බිලියන 1ක අපනයන ඉලක්කයක් ලබා ගැනීම සඳහා විශ්වාසනීය ක්ෂේත්‍රයක් ලෙස මැණික් සහ ආභරණ ක්ෂේත්‍රය, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් හඳුනාගෙන තිබේ. ප්‍රවර්ධන වැඩ පිළිවෙලේ කාර්යයක් ලෙස ඉලෙක්ට්‍රොනික පුවත් පතක් ප්‍රකාශයට පත්කර අන්තර්ජාලය ඔස්සේ බෙදා හරින ලදී. මෙමගින් අන්තර්ජාතික වෙළඳපලේ පාරිභෝගිකයන් සඳහා තත්වයෙන්ද උසස් මැණික් (සෆායර්) ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විශ්වාසනීය දිවයිනක් බව ප්‍රචලිත කිරීමට හැකිවනු ඇත. එමෙන්ම ශ්‍රී ලාංකාවේ මැණික් සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීමෙන් , ශ්‍රී ලංකාවේ අපනයනය කරනු ලබන මැණික් ප්‍රමාණය වැඩි කළ හැක.

ශ්‍රී ලංකා මැණික් ප්‍රවර්ධනය සහ මැණික් වෙළෙන්දන්ගේ සහ ආභරණ නිෂ්පාදකයින් ලොවට හඳුන්වා දීම සඳහා දැනට ප්‍රකාශන කිසිවක් නොමැති හෙයින් මෙම විද්‍යුත් පුවත්පත මගින් කර්මාන්තයේ නියෙලෙන්නන්ට විශාල මෙහෙවරක් සිදු කිරීමට හැකිවනු ඇත. ප්‍රවර්ධන වැඩ පිළිවෙලේ ප්‍රධාන අංගයක් ලෙස අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් පිළිබඳ තොරතුරු අන්තර්ජාතික මාධ්‍ය ජාලය හා එක් කිරීමේ අරමුණින් වෙබ් අඩවියක් සකස් කරන ලදී. මෙම වෙබ් අඩවිය ශ්‍රී

ලංකි මැණික් සහ ආභරණ කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා නැවත සකස් කර දියත් කරන ලදී.

- **අන්තර්ජාතික මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය (FACETS ශ්‍රී ලංකා 2013)**

අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය සහ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය හා එක්ව 23වන අන්තර්ජාතික මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය (FACETS ශ්‍රී ලංකා 2013) 2013 අගෝස්තු 29 සිට සැප්තැම්බර් 01 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ශාලාවේදී පවත්වන ලදී.

ශ්‍රී ලාංකීය මැණික් සහ ස්වර්ණාභරණ නිෂ්පාදන අන්තර්ජාතික වෙළඳපලට හඳුන්වා දීමේ හා අන්තර්ජාතික වෙළඳපලේ ප්‍රමුඛ මැණික් සහ ස්වර්ණාභරණ සැපයුම්කරුවෙකු බවට ලංකාව පත්කිරීමේ අරමුණින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කෙරේ.

මෙවර අපනයන සංවර්ධන මණ්ඩලය, දිවයින පුරා සුළු හා මධ්‍ය පරිමාණ මැණික් සහ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් 18 දෙනෙකුගෙන් යුතු විශේෂ වෙළඳ මණ්ඩපයක් ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය ඉදිරිපත් කිරීමේ අරමුණින් කරන ලදී.

මෙටය අමතරව අපනයන සංවර්ධන මණ්ඩලය චීනයෙන් 11 ක්, රුසියාවෙන් 03ක්සහ ඇමරිකා එක්සත් ජනපදයෙන් දෙදෙනෙක් ඇතුළු වෙළඳ දූත කණ්ඩායමකගේ ආගමනය සංවිධානය කරන ලදී.

- **ශ්‍රී ලංකාවේ නොපවතින ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදන සඳහා අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීමට සහ තත්ත්ව පරීක්ෂණ සිදු කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන.**

ශ්‍රී ලංකාව SOLEDEAL, CONTINENTANAL, WONDER GRIP, MAPA සහ SAFETY WORK යනාදී ලොව ප්‍රමුඛ අන්තර්ජාතික සන්නම්නාම හිමි රබර් නිෂ්පාදකයන්ට රබර් නිෂ්පාදන සැපයීමේ මූලික රටක් වේ. ප්‍රසිද්ධියට පත් ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදන වල උසස් තත්වය සහ විශ්වාසනීයත්වය තව දුරටත් රඳවා ගැනීම සඳහා ශ්‍රී ලාංකීය අපනයනකරුවන් ශ්‍රී ලංකාවේ පහසුකම නොමැති වුවද අවශ්‍ය සහතික සහ ප්‍රමිතීන් ලබාගත යුතුය. මෙම ආරක්ෂා විධි සහ අනෙකුත් රෙගුලාසි වලට අනුකූල නොවී ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදන අලෙවි කරගත නොහැකි තත්වයක් පැනනැගී ඇත.

සමහර පර්යේෂණ/සහතික අඛණ්ඩව සිදු කළ යුතු අතර තවත් සමහර ඒවා ආනයනකරු මත ඔහුගේ අවශ්‍යතාවය මත රඳා පවතී. ශ්‍රී ලංකාවේ නොපවතින බැවින් මෙම පර්යේෂණයන් විදෙස් රටකදී සිදු කිරීමට අති විශාල පිරිවැයක් දැරීමට ශ්‍රී ලාංකීය අපනයන කරුවාට සිදුවේ. නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හේතුවෙන් අන්තර්ජාතික වෙළඳපලේ තරඟකාරිත්වයට මුහුණ දීමට ශ්‍රී ලාංකීය අපනයනකරුවා අපොහොසත් වේ.

රබර් නිෂ්පාදන අපනයනකරුවන්ට සහනයක් ලබා දීමට අපනයන සංවර්ධන මණ්ඩලය මෙම සහන ලබා දීමේ වැඩ සටහන ආරම්භ කරන ලදී.

මෙගින් අන්තර්ජාතික වෙළඳපලේ අගය එකතු කළ රබර් ආශ්‍රිත නිෂ්පාදනයන් හි ඵලදායිතාවය සහ තත්වය වර්ධනය කිරීමට හැකිවනු ඇත

- **පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය - 2013**

අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදකයින්ගේ සංගමය හා එක්ව පස්වන ශ්‍රී ලංකා පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය, 2013 පෙබරවාරි 08 සිට 10 දක්වා සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ සමමන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. ගරු බැසිල් රාජපක්ෂ, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා සමාරම්භක උළෙලේ ප්‍රධාන ආරාධිතයා විය. මෙම ප්‍රදර්ශනයේ මූලික අරමුණ දේශියව හා ජාත්‍යන්තරව වශයෙන් ශ්‍රී ලාංකීය පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන සඳහා ඉහළ ප්‍රතිරූපයක් ගොඩ නැගීමයි. විශේෂයෙන්ම මෙහිදී

සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සඳහා ද තම නිර්මාණ ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාවක් සලසා දෙන ලදී.

මෙවර ප්‍රදර්ශනය වෙළඳ කුටි 214 කින් සමන්විත වූ අතර පාවහන්, ගමනාගමන ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ සහ අදාල අනෙකුත් සේවා සහිත ප්‍රදර්ශන කුටි රාශියක් විය. කර්මාන්තයට අවශ්‍ය උපාංග සහ කොටස් නිෂ්පාදනය කරනු ලබන දේශීය ව්‍යාපාරිකයන්ට ද මෙවර ප්‍රදර්ශනයේදී ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමේ හැකියාව ලබා දෙන ලදී. මෝස්තර දැක්ම සහ හොඳම වෙළඳ කුටිය තේරීමේ තරඟය මෙවර ප්‍රදර්ශනයේ කැපී පෙනෙන අංග විය. ශ්‍රී ලාංකීය මෝස්තර කරුවන්ගේ හැකියාවන් හඳුනාගැනීම සහ ඇගයීම සඳහා සම්මාන ප්‍රධානෝත්සවයක් පැවැති අතර ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් ජයග්‍රාහකයන්ට සම්මාන පිරිනැමිණ.

- **පොදුරාජ්‍ය මණ්ඩලීය නායකයන්ගේ සමුළුව (CHOGM) හා සමගාමීව පැවැත්වීමට නියමිත වෙළඳ, සංචාරක සහ ආයෝජන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වෙළඳ ප්‍රදර්ශනය. "Reflection of Sri Lanka") නොවැම්බර් 13-17**

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ සුරතින් 2013 නොවැම්බර් 13 වන දින උත්කර්ශවත් ලෙස ආරම්භ වූ "Reflection of Sri Lanka" වෙළඳ, සංචාරක සහ ආයෝජන ප්‍රදර්ශනය සහ ඊට සමගාමී වැඩ සටහන් සඳහා විදේශීය නියෝජිතයන් ඇතුළුව 242, 000 කට අධික පිරිසක් සහභාගී වූහ.

පොදු රාජ්‍ය සමුළුවේ ප්‍රතිලාභ උපරිම කරගැනීමේ අරමුණින් ඊට සමගාමීව පවත්වන ලද මෙම ප්‍රදර්ශනය ආර්ථික කටයුතු අමාත්‍යාංශයත්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයත්, යටතේ පවතින ආයතන වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශය සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක සහභාගීත්වයෙන් සංවිධානය කරන ලදී. අපනයන ආයතන, තාක්ෂණික සේවා දායකයින්, සේවා සපයන්යින් හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ගෙන් සැදුම්ලත් දේශිය හා විදේශිය වෙළඳ කුටි 600ක ට අධික සංඛ්‍යාවකින් මෙම ප්‍රදර්ශනය සමන්විත විය.

ප්‍රදර්ශනයට සහභාගී වූ පිරිස අතරින් 1428 ක් විදේශීය ගැනුම්කරුවෝ වූහ. ඇෆ්ගනිස්තානය, ආජන්ටිනාව, ඕස්ට්‍රේලියාව, අරුබා, බංගලිදේශය, බෙල්ජියම, බහරේන්, බෘනායි, කැනඩාව, ස්විට්සර්ලන්තය, චිලී, කැමරූන්, චීනය, ක්‍රිස්මස් දිවයින, චෙක් ජනරජය, ඩුබායි, ජර්මනිය, ඩෙන්මාකය, ඊජිප්තුව, ප්‍රංශය, හොංකොං, හොන්ඩුරාස්, ඊශ්‍රායලය, ඉන්දියාව, ඉරානය, ඉතාලිය, ජෝර්දානය, ජපානය, කෙන්යාව, කාම්බෝජය, උතුරු කොරියාව, දකුණු කොරියාව, කුවේට්, කසකස්තානය සහ ලෙබනනය ඇතුළු රටවල් 66 කින් විදේශීය ගැනුම්කරුවෝ සහභාගී වූහ. ඔවුන් ශ්‍රී ලංකීය අපනයන කරුවන් සමග ඉතා ඵලදායී සාකච්ඡා රැසකට සහභාගී වූහ.

ඊට අමතරව ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය සඳහා වන චීන කවුන්සිලය (29), ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතාව පිළිබඳ චීන සංගමය (14), North City Group සමාගමේ නියෝජිත පිරිස (13), චීන එක්සත් FST ෂී පියෑන් නියෝජිත පිරිස (06), ෂොං දොං හී Zi Bo Jiuyi International නියෝජිත පිරිස (02), ඉරානය (08), එක්සත් අරාබි එමීර් රාජ්‍යය (16), දකුණු අප්‍රිකාව (04) සහ ඉතාලි ගොඩනැගිලි සමාගම (01) යනාදී ජාත්‍යන්තර වෙළඳ නියෝජිත සහභාගීත්වය ද දක්නට ලැබිණි. එමෙන්ම විදේශිය ගැනුම්කරුවන් හා දේශිය අපනයන කරුවන් අතර B2B හමුවීම් 101 ක් පමණ පවත්වනු ලැබිය.

මෙහිදී ප්‍රදර්ශනයට සහභාගී වූ විදේශීය ගැනුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්ත ශාලා නැරඹීමට අවස්ථාව ලැබිණ. සාමාජිකයන් 12කින් සමන්විත වූ චීන දූත පිරිසට හිදැල්ලන තේ කර්මාන්ත ශාලාව ද, ඉතාලියේ ටෝයිස් සුපර්

ඉන්ටර්නැෂනල් නියෝජිත පිරිසට ඒෂියා බයික්ස්, සැම්සන් බයික්ස්, BSH වෙන්චර්ස් ද, ඉතාලියේ BCD Progettisri නියෝජිත පිරිසට සියරා, ICC සහ ඇක්සස් කන්ස්ට්‍රක්ෂන්ස් කර්මාන්ත ශාලාද, දකුණු අප්‍රිකානු දූත පිරිසට කැළණි කේබල්ස්, ලලාන් රබර්, මල්ටිලැක්, නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස්, ලංකා හාන්ස්, ක්වින්ස් වර්ක් වෙයාර් යනාදි කර්මාන්ත ශාලාද, චීන දූත පිරිසට තැප්‍රොබන් සී ෆුඩ්ස් සහ එළවලු සහ පළතුරු නිපදවන්නන්ගේ සංගමය මගින් සංවිධානය කරන ලද එළවලු හා පළතුරු සැකසීමේ කර්මාන්ත ශාලාව ද නැරඹීමේ අවස්ථා අපනයන සංවර්ධන මණ්ඩලය හා අනෙකුත් ආයතන එක්ව සංවිධානය කරන ලදී.

ප්‍රදර්ශනය හා සමගාමීව "ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සංවර්ධන විභවතා සහ ආසියා පැසිෆික් කලාපයේ ජලජ සම්පත් පිළිබඳ විවරණය", "චීන ශ්‍රී ලංකා තාක්ෂණික සහයෝගිතාවය", "ජාත්‍යන්තර වෙළඳපල සඳහා හරිත පොල් නිෂ්පාදන", "නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ජාත්‍යන්තර වෙළඳපල අවස්ථා", "නැගී එන දැනුම් සේවා කේන්ද්‍රස්ථානය" සහ "ශ්‍රී ලංකා තේ වල අගය" යන මාතෘකා යටතේ අපනයන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයන් පැවැත්වූ අතර 897 දෙනෙකුගේ උද්යෝගී සහභාගීත්වය දක්නට ලැබිණ.

ජාත්‍යන්තර මාධ්‍ය ආවරණය වන පරිදි කැනඩාව, ඩුබායි, බහරේන්, රුසියාව, යුක්‍රේනය, බෙලරුස්, එක්සත් රාජධානිය, ප්‍රංශය, සෞදි අරාබිය, ඉන්දියාව, පිලිපීනය, පකිස්තානය, එක්සත් අරාබි එමිර් රාජ්‍යය, ජපානය, චීනය, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාව යනාදී රටවල් 49 කින් මෙම ප්‍රදර්ශනයට සහභාගී වූ අතර ගරු බැසිල් රාජපක්ෂ සහ ගරු රිෂාඩ් බදියුදින් යන අමාත්‍යවරුන්, අමාත්‍යංශ ලේකම් අනුර සිරිවර්ධන මහතා මෙන්ම අමාත්‍යංශ නිලධාරීන් සමගද ඔවුහු සාකච්ඡා කලහ. එමෙන්ම ඔවුන් ප්‍රදර්ශන කුටි වල සිටි ප්‍රදර්ශකයින් සමගද සාකච්ඡා පවත් වන ලදි.

ප්‍රදර්ශනයෙන් ඇමරිකානු ඩොලර් බිලියනයකට ආසන්න වටිනාකමකින් යුත් ස්ථිර වෙළඳ ඇනවුම් 37ක්, හවුල් ව්‍යාපාර 35ක් සහ සාකච්ඡා මට්ටමේ වෙළඳ අවස්ථා 195ක් මෙන්ම බලාපොරොත්තු තැබිය හැකි වෙළඳ අවස්ථා 973ක් පමණ ශ්‍රී ලංකාවට පවත් වන ලදි.

- **අපනයන සේවා**

තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය කිරීමේ ක්ෂේත්‍රය.

  - අපනයන සංවර්ධන මණ්ඩලය, SLASSCOM සහ නුවර ප්‍රාදේශීය කාර්යාලය හා එක්ව මධ්‍යම පලාතේ තොරතුරු තාක්ෂණ සමාගම් 10ක් සඳහා Orim City තොරතුරු තාක්ෂණ උද්‍යානයේ (IT Park) හි අධ්‍යයන චාරිකාව.
  - 2013 වසර අපනයන ගණනය කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත් වීමට කටයුතු කිරීම.
  - අපනයනකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සඳහා සුදුසු සමාගම් තෝරා ගැනීම සඳහා නෙදර්ලන්ත CBI ආයතනයේ විශේෂඥයෙකු සමඟ මෘදුකාංග සමාගම් 11ක් සඳහා ඇගැයීමේ චාරිකා සංවිධානය කිරීම.
  - ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ ක්ෂේත්‍රයන් සඳහා සන්නම් උපායමාර්ගයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු විශේෂඥයකු තෝරා ගැනීමේ කටයුතු අවසන් කිරීම.

- **වෘත්තීමය සේවා**
  - ජිනීවා නුවර ITC ආයතනය හා එක්ව සෞඛ්‍යාරක්ෂිත සංචාරණය පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට ඇරඹීම.
  - "2013 ආයුර්වේද එක්ස්පෝ" ප්‍රදර්ශනයේදී සෞඛ්‍යමය සේවා අපනයනය ප්‍රවර්ධනය සඳහා "ශ්‍රී ලංකා ආයුර්වේද" පිළිබඳ පත්‍රිකාවක්/පොතක් සැකසීම.
  - ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අපනයනයට නැඹුරු කොන්ත්‍රාත්කරුවන් කණ්ඩායමක් සැකසීම

සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදෙන්නන්ගේ සංගමය හා එක්ව ක්‍රියා කිරීම.

- ඉලෙක්ට්‍රොනික් ක්ෂේත්‍රය.
- ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අපනයනකරුවන්ට ලෝකයේ විශිෂ්ඨතම ක්‍රියාවන් පිළිබඳ දැනුවත් බව වර්ධනය කිරීමට සහ ඉලෙක්ට්‍රොනික අපනයන ක්ෂේත්‍රයේ අපනයන හැකියාව වැඩි දියුණු කිරීම සඳහා IPC තාක්ෂණ හමුව (IPC Technology Meet) සංවිධානය කරන ලදී.

- **අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

- ලියාපදිංචි තේ නිෂ්පාදකයන්, සකසන්නෝ සහ අපනයනකරුවන් සඳහා වෙන්කිරීමේ ක්ෂේත්‍ර හැකියාව (Grading Area Capacity) සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ සහනයක් ලබා දීම සඳහා සමාගම් 04ක් තෝරා ගන්නා ලදී.
- තේ ක්ෂේත්‍රය සඳහා පද්ධති/නිෂ්පාදන සහතිකකරණය සඳහා සහන ලබාදීමේ යෝජනා ක්‍රමය යටතේ කර්මාන්තශාලා 30ක් තෝරා ගන්නා ලදී. කර්මාන්ත ශාලා 18ක් ආවරණය වන පරිදි සමාගම් 02ක් සඳහා වැසි වනාන්තර සහතික (Rain Forest) ලබා ගැනීමට සහය ලබාදෙන ලදී. මෙයට අමතරව නිෂ්පාදන 01ක් සහ කර්මාන්ත ශාලා 11ක් සඳහා ISO සහතික ලබා ගැනීමට සහය වන ලදී.
- මාතර දිස්ත්‍රික්කයේ අක්කර 05ක භූමියක අන්නාසි වගා කිරීම සඳහා ගොවීන් 10කට සහනයක් ලබාදෙන ලදී. වගාව සඳහා අන්නාසි මොටෙයියන් 30 ක් දෙන ලදී.
- ශ්‍රී ලංකාවෙන් නැවුම් පළතුරු සහ එළවළු මාලදිවයිනට මුහුදු මගින් ගෙන යාමේ හැකියාව පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලදී. මේ සඳහා සුදුසු නාවි සමාගම් හඳුනාගෙන ඇති අතර වැඩිදුර සාකච්ඡා පවත්වනු ලබයි.
- පොල් කටු අඟුරු සෑදීම සඳහා සහන ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සමාගම් 05ක් තෝරා ගෙන තිබේ.
- නෙදර්ලන්ත ප්‍රවීණ විශේෂඥයෙකුගේ උපදේශකත්වයෙන් ශ්‍රී ලංකාවේ විසිතුරු මල් හා පත්‍ර කර්මාන්තයෙහි ඵලදායිතාව/ගුණත්වය වැඩි කිරීම මගින් අපනයනය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය/දැනුම හුවමාරු කිරීමේ වැඩ සටහනක් සංවිධානය කරන ලදී. මීට අමතරව විශේෂඥ මහතා ශ්‍රී ලාංකීය විසිතුරු පැල/මල් අපනයනකරුවන් 15 දෙනෙකුගේ වගා ගෘහයන් නැරඹීමට ද ගියේය.
- එක්සත් රාජධානියේ ඇගළුම් විශේෂඥයකුගේ උපදේශකත්වයෙන් "නිෂ්පාදන කළමණාකාරිත්වය සහ තත්ත්වය රක්ෂණය" පිළිබඳ සමාගම් 09ක් සඳහා දින නවයක් පුරා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා එක්ව ඇගළුම් ක්ෂේත්‍රය සඳහා ජාතික තත්වයක් (National Standard) සකස් කිරීමට ආරම්භ කරන ලදී.
- අන්තර්ජාතික වෙළඳපලේ ශ්‍රී ලංකා රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සවිස්තරාත්මක වාර්තාවක් යුරෝපීය රබර් වාර්තාවක 2013 ජූලි/අගෝස්තු කලාපයේ පල කරන ලදී. මෙම සඟරාවේ කතෘතුමා කරුණු එක් රැස් කිරීම සඳහා 2013 මැයි මස ශ්‍රී ලංකාවට පැමිණියේය.
- 2013 මාර්තු මස සුළු හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ නිෂ්පාදකයින් 15ක් සඳහා "ආභරණ මෝස්තරකරණය" පිළිබඳ වැඩ මුළුවක් පවත්වන ලදී. එමෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ආභරණ නිෂ්පාදකයින් 23ක් සඳහා "නිම කිරීමේ විධි සහ අන්තර්ජාතික තත්වයන්/අවශ්‍යතා" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- අන්තර්ජාතික සඟරාවල FACETS (ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය) ප්‍රචලිත

කිරීමේ අරමුණින් සඟරා 03ක දැන්වීම් පල කිරීම. (Hi, Serendib, In Flight, Magazine, Incolor)

- ලී ආශ්‍රිත නිෂ්පාදන අපනයනයේ නැඹුරු නිෂ්පාදකයන් සඳහා අපනයන පිළිබඳ දැනුවත් කිරීම සඳහා එක් දින සම්මන්ත්‍රණයක් පැවැත්වීය. කර්මාන්තයේ යෙදෙන සමාගම් 76ක් සහ ආරාධිතයන් 30ක් මෙයට සහභාගි විය.
- සාධාරණ වෙළඳාම (Fair Trade) , ශ්‍රී ලංකාවේ අත්කම් භාණ්ඩ ක්ෂේත්‍රය සඳහා අලවිකරණ උපකරණයක් ලෙස යොදා ගැනීමට හඳුන්වා දීමේ වැඩ සටහන යටතේ විශෙෂඥයකුගේ ඇමරිකානු උපදේශකත්වයෙහි 2013 සැප්තැම්බර් මස පළමු වැඩසටහන ආරම්භ කරන ලදී.

සම්පූර්ණ වැඩසටහන සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා නිෂ්පාදන ක්‍රියාවලින් ඇගැයීමට කර්මාන්ත නැරඹීමේ චාරිකා 50ක් සිදු කිරීමට නියමිතය.

- වාත්තු කර්මාන්තය සඳහා යොදා ගැනෙන තාක්ෂණය වර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ සැප්තැම්බර් මාසයේදී යන්ත්‍රෝපකරණ සවි කරීම සඳහා පරීක්ෂණ චාරිකා සිදු කිරීමට නියමිතය.
- ආසියානු රෙදිපිළි නිෂ්පාදන සඳහා ගෝලීය වෙළඳපල තත්වය පිළිබඳ සකස් කරන ලද වාර්තාව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට ලබා දෙන ලදී.
- සකස් කළ ආහාර පාන අපනයනයේදී අවශ්‍යවන කෝෂර් (Kosher) සහතිකය පිළිබඳ දැනුවත් කිරීම සඳහා 70 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ 02ක් පවත්වන ලදී.
- අපනයනකරුවන්ට තම අලවිකරණ හැකියාවන් වර්ධනය කරගැනීම සඳහා මූල්‍ය සහන ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ සමාගම් 08ක් සඳහා සහන ලබා දී තිබේ.
- 17 දෙනෙකු සඳහා ඇසුරුම් තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදී.

**ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්**

අපනයන සංවර්ධනය උදෙසා ග්‍රාමීය සම්පත් හා හැකියාවන් දායක කර ගැනීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා ජාලය මගින් අදාල කාලය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්වල ප්‍රගතිය පහත දැක්වේ.

- සන්නම් නාම සහ සන්නම් විශිෂ්ටත්වය සංවර්ධනය කිරීම සඳහා සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ අදාල කාලය තුල සමාගම් 04කට සහන සැලසූ අතර 2013/2014 කාලය අවසන් වන විට සමාගම් 11කට සහන සැපයීමට අපේක්ෂිතය. මේ වනවිට ඉතාලියේ සහ මැද පෙරදිග කලාපයේ සන්නම් නාම දෙකක් ලියාපදිංචිය සිදු කෙරේ.
- කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත කරනු ලැබූ උපාධිධාරි අභ්‍යාසලාභීන් 146 දෙනෙක් සඳහා සේවා ලයිස්තු නිකුත් කරන ලදී. දිස්ත්‍රික්ක 25ක් සඳහා සංවර්ධන නිලධාරින් 43ක් ඇතුලත්ව උපාධිධාරි අභ්‍යාසලාභීන් 222 ක් පත් කරන ලදී. මෙම පුහුණුවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වන ලදී.
- දකුණු පලාතේ කුළු බඩු සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා නිෂ්පාදන/පද්ධති සහතිකකරණය සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ සහන සැලසීමට සුදුස්සන් 21 ක් තෝරා ගන්නා ලදී.
- ගාල්ල දිස්ත්‍රික්කයේ GMP මධ්‍යස්ථාන 14ක් සහ රත්නපුර දිස්ත්රික්කයේ GMP මධ්‍යස්ථාන 01ක් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.
- 2013 අගෝස්තු මස දකුණු පලාතේ සුදුසු කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයින් 12 දෙනෙකු සඳහා GMP සහතිකකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනකි පවතිවන ලදී.

- දකුණු පලාතේ විසිතුරු මල් සහ පත්‍ර වාණිජ වගාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ සහන සැලසීමට ව්‍යවසායකයින් 09 දෙනෙක් තෝරා ගන්නා ලදී.
- මධ්‍යම පලාතේ විසිතුරු පත්‍ර සහ ඕකිඩ් සැපයුම් සංවර්ධන වැඩ සටහන යටතේ දෙහිඕවිට ප්‍රදේශයේ වගාකරුවන් 35 දෙනෙකු සහ මාතලේ ප්‍රදේශයේ වගාකරුවන් 40 දෙනෙකු සංවරධනය කර අපනයනකරුවකුට සම්බන්ධ කරන ලදී.
- මධ්‍යම පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැල් ගෘහ තුල ඕකිඩ් වගා කිරීම සඳහා වගාකරුවන් දෙදෙනෙකුට මූල්‍ය සහන ලබාදෙන ලදී.
- සෙවන දැල් ගෘහ තුල ඉහළ වටිනාකමකින් යුතු එළවළු, අයිස් බර්ග් (සලාද කොළ විශේෂයක්), චෙරි තක්කාලි, බෙල් පෙපර්, ජපන් පිපිඤ්ඤා වගා කිරීම සඳහා ගොවීන් 26 දෙනෙකුට සහනයක් ලබා දී ඔවුන් අපනයනකරුවකු හා සම්බන්ධ කිරීම.
- වයඹ පලාතේ ගොවීන් 40 දෙනෙකු සඳහා ඉහළ වටිනාකමකින් යුතු එළවළු වගා කිරීමට සහනයක් සලසා ඔවුන් අපනයනකරුවකු හා සම්බන්ධ කිරීම.
- නැගෙනහිර පලාතේ වැසි ආවරණ වගා ගෘහ තුල ගර්කින්, හැලපිනෝ, ගම්මිරිස් වගා කිරීම සඳහා ගොවීන් 22කට සහන සලසා අපනයන සංවර්ධන මණ්ඩලය, ගොවීන් සහ අපනයනකරුවකු සමග ත්‍රි පාර්ශ්වික ගිවිසුමකට එළෙඹෙමින් ඔවුන් අපනයනය කිරීමේ මාර්ගයකට ප්‍රවේශ කරන ලදී.
- පදිවතලාවේ සහ අක්කරපත්තුවේ වැසි ආවරණ වගා ගෘහ 22ක් පිහිටුවන ලදී.
- අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් 40ක් සඳහා කෘෂි අපනයන නිෂ්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.
- ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ගොවීන් 35 දෙනෙකුට පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව නාමල් ඔය ප්‍රදේශයේ කුරුඳු තලන්නන් 18 දෙනෙකු සඳහා තාක්ෂණ හුවමාරු වැඩසටහන.
- ඌව පලාතේ කුළු බඩු සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිෂ්පාදන/පද්ධති සහතිකකරණය පිළිබඳ සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ GMP මධ්‍යස්ථාන දෙකක වැඩ කටයුතු සම්පූර්ණ කරන ලදී.
- ඌව පලාතේ සෙවන දැල් ගෘහ තුල බෙල් පෙපර් සහ තක්කාලි වගා කිරීම සඳහා ගොවීන් 17 දෙනෙකුට සහන සලසන ලදී.
- කහ වගාව සඳහා වගා ද්‍රව්‍ය සහ තාක්ෂණ සහනයන් ලබා දීම සඳහා ගොවීන් 25 දෙනෙකු තෝරා ගන්නා ලදී. 2013 අප්‍රේල් 05 වන දින ඔවුන්ට තාක්ෂණ පුහුණු වැඩ සටහනක් පවත්වන ලදී. ගොවීන් 14 දෙනෙකු සඳහා වගා ද්‍රව්‍ය බෙදා දී ඇති අතර දැනටමත් වගා කටයුතු සිදු වේ.
- අපනයන වෙළඳපලට සුදුසු පරිදි සෙරමික් සහ පිඟන් භාණ්ඩ සංවර්ධනය කිරීම සඳහා මොණරාගල දිස්ත්‍රික්කයේ තොවුලාර සමුපකාර සමිති කර්මාන්තකරුවන්ට මැටි සැකසුම් යන්ත්‍රෝපකරණ පිහිටුවීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ඔවුන් අපනයනකරුවකු හා සම්බන්ධ කිරීම. එමෙන්ම සමිතිය විසින් මේ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයට කෝන්ත්‍රාත්තුව භාර දී තිබේ.
- අලෙවිකරණ අවස්ථා සහ එහිදී ඇතිවන බාධක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී.
- වීරවිල කෘෂි අපනයන කලාපයේ උද්‍යාන වගා කිරීමේ ව්‍යාපෘතිය පියවර දෙකක් යටතේ සිදු කිරීමට නියමිත අතර පලමු අදියර යටතේ අක්කර 18ක භූමියක ආදර්ශ ගොවිපලක්

සාර්ථකව නිම කිරීමට හැකි විය. ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා කළමණාකරන මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

- දඹදෙණිය සහ තිස්සමහාරාම අපනයන සැකසුම් කලාපයන් දී භාණ්ඩ සහ වෙළඳපල විවිධාංගීකරණය ආරම්භ කිරීම සහ කලාපයන් හි වැඩ කටයුතු පසු විපරම හා අධීක්ෂණය කිරීම.

  අදාල කාලය තුල තිස්සමහාරාම අපනයන සැකසුම් කලාපයේ මූල්‍ය ප්‍රගතිය වනුයේ තේ පැකට් සංඛ්‍යාව - 133, 748 සහ වටිනාකම රු. මිලියන 5.55 කි. නිෂ්පාදන විවිධාංගීකරණය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා රසායනාගාර දැල් රෙදි (Surgical Gauze) සැපයීම සඳහා ලියාපදිංචි සහතිකයක් ලබාගන්නා ලදී.

- බිංගිරිය කෘෂි අපනයන කලාපයේ වගාකරුවන් 250 දෙනෙක් සහ තවත් 200 දෙනෙකුට ස්වාභාවික ආවරණ යටතේ විසිතුරු පත්‍ර ලබා ගැනීම සඳහා පැල වගා කිරීමේ තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් දෙකක් සංවිධනය කරන ලදී.

- බිංගිරිය කෘෂි අපනයන කලාපයේ ප්‍රගතිය,

  ඇන්තූරියම් සෘජු අපනයන - රුපියල් 564, 925

  සැන්ඩ්‍රියානා සෘජු අපනයන - රුපියල් 881, 944

  2013 මැයි 30 සිට ජුනි 02 දක්වා "බිංගිරිය මල් වසන්තය" වෙළඳ ප්‍රදර්ශනය සාර්ථකව නිම කරන ලදී.

- **අනෙකුත් වැඩසටහන්**

- **තොරතුරු තාක්ෂණ සේවා**

අපනයන සංවර්ධන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් වෙළඳ ප්‍රජාව සඳහා විද්‍යුත් වාණිජ සේවා සපයනු ලැබේ. ඊට අමතරව ප්‍රාදේශියව විසිරී සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ද විද්‍යුත් ව්‍යාපාර තාක්ෂණයන් යොදා ගැනීමේ පහසුව ඇති කිරීමට දකුණු, වයඹ සහ මධ්‍යම පලාත් ප්‍රාදේශිය කාර්යාල ජාලය ද ශක්තිමත් කරන ලදී. අදාල කාලය තුල පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා විද්‍යුත් මාධ්‍යයේ ප්‍රවර්ධනය කිරීම.**

අපනයනකරුවන් සඳහා අන්තර්ජාලය ඔස්සේ යාවත්කාලීන අපනයන ප්‍රගති දත්ත වාර්තා ලබා ගැනීමත් එමගින් තීර හා වක්‍ර ප්‍රස්ථාර ඉක්මණින් කර ගැනීමටත් හැකිවන පරිදි පහසුකම් ඇති කිරීම.

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන වෙළඳ ප්‍රදර්ශන සහභාගිත්වයන්, ප්‍රවර්ධන වැඩසටහන්, වෙළඳපල පිළිබඳ සකස් කරන ලද වාර්තා, වෙළඳපල විමසීමේ මාර්ගෝපදේශ, ප්‍රවණතා පිළිබඳ වාර්තා, ගැණුම්කරුවන්ගේ තොරතුරු අපනයන සංවර්ධන මණ්ඩලය මගින් දෙනු ලබන සහනයන් යනාදී සියළුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි තොරතුරු වෙබ් අඩවියේ යාවත්කාලීනව පළ කිරීම. 2013 වසර සඳහා ප්‍රවෘත්ති විපරම් සංඥාවන් පළ කිරීම සහ අන්තර්ජාතික වෙළඳ පලේ නව රෙගුලාසි, වෙළඳපල ප්‍රවණතා, අවස්ථාවන් සහ නව ව්‍යාපාරික පුරෝකතන පිළිබඳ අපනයන ප්‍රජාව දැනුවත් කිරීම සඳහා නිෂ්පාදන සහ වෙළඳපල ප්‍රවෘත්ති නිවේදන 65ක් පළ කිරීම. වෙබ් අඩවි අන්තර්ගතය සඳහා දෙමළ භාෂාව ඇතුළු භාෂාවන් 72ක් පමණ ඇතුළු කිරීම.

පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයන්ගේ සමුළුව හා සමගාමීව ඉදිරි නොවැම්බර් 13 සිට 17 දක්වා බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේදී පැවැත්වීමට නියමිත "Reflection Sri Lanka" - ආසියාවේ ගවේෂණය සඳහා වෙළඳ, සංචාරක හා ආයෝජන ප්‍රදර්ශනය උදෙසා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.

- **විද්‍යුත් වාණිජ බිහිදොර (විද්‍යුත් වෙළඳ මධ්‍යස්ථානය)**

අපනයන සංවර්ධන මණ්ඩලය නිල වෙබ් අඩවිය වන www.srilankabusiness.com තුලින් ක්‍රියාත්මක වන වාණිජ්‍ය බිහිදොර මගින් අදාල කාලය තුල ඇමරිකානු ඩොලර් මිලියන 2555ක වටිනාකමකින් යුතු ඉතාලිය, රුසියාව, ජපානය, ඕස්ට්‍රේලියාව, චෙක් ජනපදය සහ පිලිපීනය යන රටවලට සාර්ථක වෙළඳ ගණුදෙනු සිදු කරන ලදී.
මීට අමතරව අදාල කාලය තුල වෙළඳ ඇණවුම් 18ක් ලියාපදිංචිව සිට සමාගම් සඳහා ලැබිණ.

- **විද්‍යුත් වාණිජ සේවා ප්‍රවර්ධනය**

අදාල කාලය තුල බාහිර පාරිභෝගිකයන්ට සහ අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරින්ට අන්තර්ජාලය මගින් ගැණුම් කරුවන් සෙවීම් 2312 ක් කරන ලදී.
එමෙන්ම අපනයන සංඛ්‍යා දත්ත, පාරිභෝගිකයන් 160කටද තෝරාගත් නිෂ්පාදන වල මිල ගණන් 25 දෙනෙකුට ලබාදෙන ලදී.

- **වෙළඳ තොරතුරු සහ උපදේශක සේවා**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන ක්ෂේත්‍රය සඳහා පරිගණකගත වෙළඳ දත්ත පහසුකම් උපදේශක සේවා, ප්‍රකාශන සහ පුස්තකාල සේවා යනාදී විවිධ සේවාවන් රාශියක් සපයනු ලබයි. අදාල කාලය තුල ව්‍යවසායකයින් 564කට ආසන්න ප්‍රමාණයකට පුස්තකාල පහසුකම් ලබා දෙන ලදී.
මීට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා එහි ප්‍රාදේශිය ශාඛා කාර්යාල ජාලය මගින් අපනයනකරුවන් 475කට අධික ප්‍රමාණයකට අපනයනය හා ආශ්‍රිත ක්ෂේත්‍රයන් පිළිබඳ උපදේශක සේවා ලබා දෙන ලදී.

- **අපනයන ආශ්‍රිත ප්‍රකාශන**

මෙම කාලය තුල "Business Lanka" සඟරාවක් "Expo News" ප්‍රකාශන 16ක්, "අපනයන පුවත්" ප්‍රකාශන 08ක් ප්‍රකාශයට පත්කොට ග්‍රාහකයින් වෙත ලබා දී ඇත.
එමෙන්ම "Policy Briefly" ප්‍රකාශන 06ක් මණ්ඩලයේ නිලධාරින් අතර බෙදා දෙන ලදී.

**අපනයන ප්‍රගති දර්ශක 2003 – 2012**

පසුගිය දශකයේ අපනයන සංඛ්‍යා දත්තයන් විශ්ලේෂනය කර "අපනයන ප්‍රගති දර්ශක" නමින් සවිස්තරාත්මක ප්‍රකාශනයක් සකස් කරන ලදී. මෙය සංයුක්ත තැටියක් ලෙසව ප්‍රකාශයට පත්කළ අතර එය අදාල ආයතන වාණිජ මණ්ඩල හා විශ්ව විද්‍යාල සඳහා බෙදා හරින ලදී.

- **ව්‍යවසායකයින්ගේ ගැටළු විසඳීම**

ගරු කරුමාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් "අපනයන සංසදය" සංවිධානය කරන ලදී.
වෙළඳ කටයුතු සම්බන්ධයෙන් වන විශේෂිත ගැටළු සාකච්ඡා කිරීමට පොදු වේදිකාවක් බඳු මේ සඳහා අපනයනකරුවන්, ආයෝජකයන් සහ අනෙකුත් ව්‍යවසායකයන් මෙන්ම රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් හි නිලධාරින්ද සහභාගි වේ.

අදාල කාලය තුල අපනයන සංසදයන් එකක් පැවැත් වූ අතර ගැටළු 30ක් පමණ සාකච්ඡා කරන ලදී.

- **ඇසුරුම්කරණ සංවර්ධන වැඩසටහන්**

අපනයන සංවර්ධන මණ්ඩලය හා අනුබද්ධිත ඇසුරුම්කරණ මධ්‍යස්ථානය විසින් අපනයනයට නැඹුරු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා තත්වයෙන් උසස්, විශ්වාසනීය සහ අඩු පිරිවැයකින් යුතු ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් වැඩසටහන් 02ක් කොළඹදී සහ හම්බන්තොටදී එක් වැඩසටහනක් සිදු කරන ලදී. එහිදී නැවුම් සහ අගය එකතු කළ කෘෂි නිෂ්පාදන ඇසුරුම්, අත් යන්ත්‍ර සහ රෙදිපිළි නිෂ්පාදන සඳහා ඇසුරුම්, නව ඇසුරුම්කරණ විධි, ආහාර ද්‍රව්‍ය ඇසුරුම්, ඇසුරුම් ද්‍රව්‍ය, අගය එකතු කිරීමක් ලෙසින් හා අලෙවි උපායක් ලෙස ඇසුරුම්කරණය ඇසුරුම් ලේබල් යනාදී ප්‍රධාන

විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි දේශන පැවැත්විණ.

ඇසුරුම් නිෂ්පාදන කර්මාන්තයේ නියුතු විධායක නිලධාරීන් සඳහා "ඇසුරුම් තාක්ෂණය" මැයෙන් සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදනයන් හි තත්වය සහ වෙළඳපල තරඟකාරිත්වය සංවර්ධනය කිරීමට "අපනයන ඇසුරුම්කරණය" සඳහා උපදේශක සභාවක් පිහිටුවීම.

- **නිපුණතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන්**

අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කොළඹ, ගාල්ල, අම්පාර, ත්‍රිකුණාමලය, නාමල් ඔය, හම්බන්තොට සහ බිංගිරිය යන ප්‍රෙද්ශවල ව්‍යවසායකයින් 1188 දෙනෙක් සඳහා නිපුණතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අපනයන කෘෂි නිෂ්පාදනයන්, පසු අස්වනු තාක්ෂණය, ආහරණ මෝස්තර, අත්‍යවශ්‍ය සහතික වර්ග සහ ඇසුරුම් තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීමත් නිෂ්පාදන සඳහා විශේෂිත තාක්ෂණ කුසලතා වර්ධනය කිරීමත අරමුණු කොටගෙන මෙම වැඩ සටහන් ක්‍රයාත්මක කරන ලදී.

අදාල කාලය තුල ව්‍යවසායකයින් 150කට ආසන්න ප්‍රමාණයක් සඳහා ආයනය/අපනයන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් 04ක් සහ අන්තර්ජාතික වෙළඳාමේ ක්‍රියා පිළිවෙල පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## 2014 වසර සඳහා සැලසුම්

### අපනයන ප්‍රවර්ධන වැඩ සටහන්

කෘෂිකාර්මික, ධීවර, කාර්මික සහ සේවා ක්ෂේත්‍ර ප්‍රවර්ධනය සඳහා ඒකාබද්ධ සැපයුම් / නිෂ්පාදන / මෝස්තර / තත්ව සහ ඇසුරුම්කරණ සහ වෙළඳපල සංවර්ධන වැඩ සටහන්

- අපනයන ආදායම වැඩිකිරීම සඳහා සාමූහික සන්නාමකරණය (Corporate Branding) සඳහා සහන සැලසීම.
- "ජාතික අපනයන ප්‍රතිපත්තිය" කෙටුම්පත් කිරීම.
- අපනයන නැඹුරුවක් ඇති ශ්‍රී ලාංකීය නිෂ්පාදන සඳහා භූගෝලීය දර්ශකය (GI) ලබා ගැනීම.
- අගය එකතු කළ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන හා පද්ධති සහතිකරණය සහ සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදන ක්‍රම (GMP) සඳහා සහන සැලසීම
- ශ්‍රී ලංකා කුරුඳු සන්නම සංවර්ධන වැඩ සටහන, තෝරා ගත් අන්තර්ජාතික වෙළඳ පල වල වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම.
- Infofish - CFC, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කිරීම.
- කාබනික සහතිකකරණය සඳහා පිරිවැය අවම කිරීමට ජාතික කාබනික පාලන අධිකාරිය (NOCA) පිහිටුවන තුරු Noacc කටයුතු පවත්වාගෙන යාම.
- ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ඵලදායිතා වර්ධන වැඩ සටහන.
- ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ප්‍රතිරූපය ගොඩ නැගීමේ වැඩ සටහන.
- ශ්‍රී ලංකා ඇඟළුම් ක්ෂේත්‍රයේ හැකියාවන් පෙන්වීම සඳහා ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය සංවිධානය කිරීම.
- අන්තර්ජාතික වෙළඳ පලවල ශ්‍රී ලංකා රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම.
- "ශ්‍රී ලංකා බ්ලූ සෆායර්" (නිල් මැණික්) සන්නම ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරාත්මක / ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩ සටහන
- ලෝක වෙළඳ පල තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා සෙරමික් ක්ෂේත්‍රයේ ඵලදායිතාව වර්ධනය කිරීමේ වැඩ සටහන.
- සුළු හා මධ්‍ය පරිමාණ අත්යන්ත්‍ර ඇඟළුම් අපනයනකරුවන්ගේ නිෂ්පාදන හා වෙළඳ පල

ප්‍රවණතා පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ වැඩ සටහන

- තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණයේ නිරත වන අපනයනකරුවන්ගේ උපාය මාර්ගික අවශ්‍යතා සපුරාලීමට ශ්‍රී ලංකාවේ 2013/14 වසරවලදී සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණයේ නිරත වන අපනයනකරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා අදාල ක්ෂේත්‍රයන් එක් කර සම්මන්ත්‍රණ සංවිධානය කිරීම (ICT කර්මාන්ත, විදුලි සංදේශ සහ විශ්ව විද්‍යාල)
- ලෝක වෙළඳ පලේ පුද්ගල සබඳතා ගොඩ නගා ගැනීමෙන් "ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය" සන්නම් කිරීම සහ ප්‍රවර්ධනය.
- ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ අපනයනකරුවන් සඳහා ශ්‍රී ලාංකීය සැපයුම්කරුවන්ගේ තත්ත්ව වර්ධන වැඩ සටහන්.
- කෘෂිකාර්මික, කාර්මික සහ ධීවර අංශයන් හි තත්ව සංවර්ධන වැඩ සටහන්.
- කුළු බඩු ආශ්‍රිත නිෂ්පාදන අංශය සඳහා සංවර්ධන හා ප්‍රවර්ධන වැඩ සටහන්.
- මුද්‍රණ ක්ෂේත්‍රය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩ සටහන්.
- බෝට්ටු කර්මාන්තය සඳහා ඵලදායිතාවය සංවර්ධන වැඩ සටහන්.
- අපනයනයට සූදානම් සුළු හා මධ්‍ය පරිමාණ ත්‍යාග භාණ්ඩ නිෂ්පාදකයන් සංවර්ධන වැඩ සටහන.
- පාවහන් කර්මාන්තය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩ සටහන.
- සියළුම භාණ්ඩ අංශ සඳහා දැනුවත් කිරීමේ වැඩ මුළු, වැඩ සටහන් සහ වෙළඳ පල ප්‍රවර්ධන වැඩ සටහන් සංවිධානය

**ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන**

- කෘෂි අපනයන කලාප ව්‍යාපෘති තවදුරටත් කරගෙන යෑම.
- වයඹ පලාතේ කොහු කර්මාන්තය සඳහා තිරසාර ශක්ති කළමණාකරන වැඩ සටහන
- වයඹ පලාතේ කැපූ මල් හා විසිතුරු පැල සංවර්ධන ව්‍යාපෘති
- වයඹ පලාතේ අපනයනය සඳහා කාබනිකව මිරිස් සහ කහ වගා කිරීම සංවිධානය
- මධ්‍යම පලාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් එක් කිරීමේ වැඩ සටහන
- සැපයුම් සංවර්ධනයට වයඹ පලාතේ අපනයනය සඳහා වටිනාකමින් වැඩි එළවළු සහ කුළු බඩු ව්‍යාපෘතිය
- දකුණු පලාතේ කුරුඳු සැකසුම් කර්මාන්ත ශාලා සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ස්ථාන සඳහා තත්ත්ව සහතික ලබා ගැනීමට සහායවීම.
- මඩකලපුව දිස්ත්‍රික්කයේ අපනයනය සඳහා අන්නාසි වගා කිරීමේ නියමු ව්‍යාපෘතිය සහ අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි පැල තවාන් සැකසීම සංවිධානය

**වෙළඳ පල සංවර්ධන වැඩ සටහන්**

- නැගී එන වෙළඳපල වල අවස්ථා ගවේෂණය කිරීම. (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව, දකුණු කොරියාව, ඉස්මීර්, තුර්කිය)
- තෝරා ගත් ප්‍රමුඛ සහ නැගී එන වෙළඳ පලවල අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කිරීම.
- තෝරා ගත් වෙළඳ පලවල අභ්‍යන්තර සහ බාහිර වෙළඳ ධූත නියෝජනයන් සංවිධානය කිරීම.

- ශ්‍රී ලංකා අපනයන ක්ෂේත්‍රයේ ප්‍රතිරූපය ගොඩ නැගීම සඳහා සුදුසු වෙළඳ පල සන්නිවේදන උපායයක් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා නිෂ්පාදන සහ සේවා අනෙකුත් රටවල ප්‍රවර්ධනය සඳහා ධූත මෙහෙවරේ යෙදෙන වාණිජ දෙපාර්තමේන්තු නිලධාරීන් හා සමීපව කටයුතු කිරීම.
- වෙළඳපල පර්යේෂණ / සමීක්ෂණ සිදු කිරීම.
- ජනාධිපති අපනයන සම්මාන ප්‍රදානෝත්සවය සංවිධානය කිරීම.
- දේශීය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම.
- දේශීය වෙළඳ ප්‍රදර්ශනවල ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සහභාගීත්වය සංවිධානය කිරීම. උදා. Facets, Luster, Ayurveda, Profoods
- Boat Show 2013 සහ පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා එක්ස්පෝ 2014 අන්තර් ජාතික වෙළඳ ප්‍රදර්ශනය සංවිධානය කිරීම.

**වෙනත් වැඩ සටහන්**

- අපනයන ඇසුරුම්කරණය සංවර්ධනය
- වෙළඳ තොරතුරු හා වෙළඳ පල තොරතුරු බෙදා හැරීම විද්‍යුත් වාණිජ්‍ය සේවා සහ අපනයන ආශ්‍රිත ප්‍රකාශන
- අපනයනකරුවන්ගේ ගැටළු නිරාකරණය (අපනයනකරුවන්ගේ සංසදය)
- ආනයන අපනයන ක්‍රියාවලිය හා අපනයන ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්, කුසලතා සංවර්ධන වැඩ සටහන් සහ ව්‍යවසායකයන් සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

# අමාත්‍යාංශයේ පොදු තොරතුරු

# කර්‍ය මණ්ඩල තොරතුරු

| | තනතුර | විශේෂීකරණය | සේවය | සේවා මට්ටම | ශ්‍රේණිය/පන්තිය | වැටුප් කේතය | අනුමත ස්ථිර සංඛ්‍යාව | දැනට සිටින ස්ථිර සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ලේකම් | | | 1 | | SL -4 | 1 | 1 | 0 |
| | අතිරේක ලේකම් | පාලන හා මුදල් | ශ්‍රී.ලං.ප.සේ | 1 | විශේෂ ශ්‍රේණිය | SL -3 | 1 | 0 | 1 |
| | අතිරේක ලේකම් | කර්මාන්ත සංවර්ධන | ශ්‍රී.ලං.ප.සේ | 1 | විශේෂ ශ්‍රේණිය | SL -3 | 1 | 1 | 0 |
| | අතිරේක ලේකම් | ප්‍රතිපත්ති සංවර්ධන | ශ්‍රී.ලං.ප.සේ | 1 | විශේෂ ශ්‍රේණිය | SL -3 | 1 | 1 | 0 |
| | අතිරේක ලේකම් | වාණිජ | ශ්‍රී.ලං.ප.සේ | 1 | විශේෂ ශ්‍රේණිය | SL -3 | 1 | 1 | 0 |
| | අතිරේක ලේකම් | පේෂකර්මාන්ත හා අපනයන | ශ්‍රී.ලං.ප.සේ | 1 | විශේෂ ශ්‍රේණිය | SL -3 | 1 | 1 | 0 |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | පාලන | ශ්‍රී.ලං.ප.සේ | 1 | පංතිය I | SL -1 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | | ශ්‍රී.ලං.ග.සේ | 1 | පංතිය I | SL -1 | 1 | 1 | 0 |
| | ප්‍රධාන ගණකාධිකාරී | | ශ්‍රී.ලං.ග.සේ | 1 | පංතිය I | SL -1 | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | ආංශික 1,2,3 | දෙපා. | 1 | | SL -1 | 3 | 2 | 1 |
| | අධ්‍යක්ෂ | කර්මාන්ත සංවර්ධන | ශ්‍රී.ලං.ප.සේ | 1 | පංතිය I | SL -1 | 1 | 0 | 1 |
| | අධ්‍යක්ෂ | සැලසුම් | ශ්‍රී.ලං.ක්‍ර.සේ | 1 | පංතිය I | SL -1 | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | සංස්ථා | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය I | SL -1 | 1 | 0 | 1 |
| | අධ්‍යක්ෂ | කර්මාන්ත ලියාපදිංචි | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය I | SL -1 | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය I | SL -1 | 1 | 0 | 1 |
| | අධ්‍යක්ෂ | පේෂකර්ම හා අපනයන | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය I | SL -1 | 1 | 1 | 0 |
| | අධ්‍යක්ෂ | පර්යේෂණ හා සංවර්ධන | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය I | SL - 1 | 1 | 1 | 0 |

| | තනතුර | විශේෂීකරණය | සේවය | සේවා මට්ටම | ශ්‍රේණිය/පන්තිය | වැටුප් කේතය | අනුමත ස්ථිර සංඛ්‍යාව | දැනට සිටින ස්ථිර සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ | වාණිජ | ශ්‍රී.ලං.ප.සේ. | 1 | I පංතිය | SL -1 | 1 | 0 | 1 |
| | නීති නිලධාරි | | ශ්‍රී.ලං.ප.සේ | 1 | පංතිය II/III | SL-1 | 1 | 0 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ක්ෂේත්‍ර 123 | දෙපා. | 1 | II-I/ II-II පංතිය | SL -1 | 3 | 3 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | කර්මාන්ත සංවර්ධන ප්‍රධාන කාර්යාලය | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය II, III | SL -1 | 2 | 2 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ප්‍රාදේශීය කාර්යාල | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය II, III | SL -1 | 14 | 9 | 5 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | පේෂකර්ම | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය II, III | SL -1 | 2 | 2 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | සැලසුම් | ශ්‍රී.ලං.ක්‍ර.සේ | 1 | පංතිය II, III | SL -1 | 2 | 2 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන | ශ්‍රී.ලං.ප.සේ. දෙපා. | 1 | පංතිය II, III දෙපා. | SL -1 | 1 | 1 | 0 |
| | | | | | | SL -1 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | සංස්ථා | ශ්‍රී.ලං.ප.සේ | 1 | පංතිය II, III | SL -1 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | කර්මාන්ත ලියාපදිංචි | ශ්‍රී.ලං.ප.සේ | 1 | පංතිය II, III | SL -1 | 1 | 0 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | වාණිජ | ශ්‍රී.ලං.ප.සේ | 1 | පංතිය II, III | SL -1 | 1 | 1 | 0 |
| | | | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | 1 | පංතිය II, III | SL -1 | 1 | 1 | 0 |
| | සහකාර ලේකම් | පාලන | ශ්‍රී.ලං.ප.සේ. | 1 | පංතිය III | SL -1 | 3 | 3 | 0 |
| | අභ්‍යන්තර විගණක | | ශ්‍රී.ලං.ග.සේ | 1 | පංතිය II/ III | SL -1 | 1 | 0 | 1 |
| | ගණකාධිකාරි | | ශ්‍රී.ලං.ග.සේ | 1 | පංතිය II/ III | SL -1 | 3 | 3 | 0 |
| | පරිපාලන නිලධාරි | | රා.කළ.සේ. | 2 | අධිපත්තිය | MN 7 | 1 | 1 | 0 |
| | භාෂා පරිවර්තක | | භා.ප.සේ | 2 | | MN 6 | 2 | 1 | 1 |
| | තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | | තො.ස.තා.සේ | 2 | පංතිය I, II,III | MN 6 | 4 | 1 | 3 |
| | පෞද්ගලික ආරක්ෂක නිලධාරි | | දෙපා. | 2 | | RS 1 | 5 | 5 | 0 |

| | තනතුර | විශේෂීකරණය | සේවය | සේවා මට්ටම | ශ්‍රේණිය/පන්තිය | වැටුප් කේතය | අනුමත ස්ථිර සංඛ්‍යාව | දැනට සිටින ස්ථිර සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පරිගණක වැඩසටහන් සම්පාදක | | දෙපා. | 3 | | MN 2 | 1 | 1 | 0 |
| | ප්‍රවෘත්ති නිලධාරි | | ආශ්‍රිත | 3 | | MN 4 | 1 | 1 | 0 |
| | කර්මාන්ත පරීක්ෂක | | ආශ්‍රිත | 3 | | MN 4 | 16 | 7 | 9 |
| | සංවර්ධන නිලධාරි | | ආශ්‍රිත | 3 | | MN 4 | 820 | 561 | 259 |
| | කර්මාන්ත සංවර්ධන සහකාර | | ආශ්‍රිත | 3 | | MN 4 | 47 | 38 | 9 |
| | සංවර්ධන සහකාර | | ආශ්‍රිත | 3 | | MN 4 | 8 | 4 | 4 |
| | අයවැය සහකාර | | ආශ්‍රිත | 3 | | MN 4 | 1 | 0 | 1 |
| | ගිණුම් සහකාර | | ආශ්‍රිත | 3 | | MN 4 | 1 | 1 | 0 |
| | ප්‍රසම්පාදන සහකාර | | ආශ්‍රිත | 3 | | MN 4 | 1 | 0 | 1 |
| | කළමනාකරණ සහකාර | | රා.කළ.ස.සේ. | 3 | I,II,III | MN 2 | 105 | 70 | 35 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | | තො.ස.තා.සේ. | 3 | III | MT1 | 1 | 0 | 1 |
| | දත්ත සටහන් ක්‍රියාකරු | | දෙපා. | 3 | | MN 1 | 2 | 2 | 0 |
| | පිළිගැනීමේ නිලධාරි | | දෙපා. | 3 | | MN 1 | 1 | 0 | 1 |
| | නිශ්චල ඡයාරූප ශිල්පී | | දෙපා. | 3 | | MT 1 | 1 | 1 | 0 |
| | විඩියෝ කැමරාශිල්පී | | දෙපා. | 3 | | MT 1 | 1 | 1 | 0 |
| | කැමරා ක්‍රියාකරු සහායක | | දෙපා. | 4 | | PL 1 | 1 | 1 | 0 |
| | රියදුරු | | රියදුරු සේවය | 4 | I, II A, II B | PL 3 | 41 | 32 | 9 |
| | කාර්යාල කාර්ය සහායක | | කා.ක.ස | 4 | I,II,III | PL1 | 57 | 56 | 1 |
| | **එකතුව** | | | | | | **1174** | **827** | **347** |

# දේශීය පුහුණු - 2013

| | පාඨමාලාවේ නම | ආයතනය | නිළධාරින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සහතිකපත්‍ර පාඨමාලාව ඉංග්‍රිසි- අන්තර්මධ්‍ය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 06 |
| 02 | ඉංග්‍රිසි (උසස්) ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 01 |
| 03 | තිරසාර කර්මාන්ත සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | කොළඹ විශ්වවිද්‍යාලය | 05 |
| 04 | ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ රාජ්‍ය අංශය දැනුවත් කිරිම පිළිබඳ වැඩසටහන | ශ්‍රී ලංකා රාජ්‍ය මුල්‍ය ගණකාධිකාරි සංවිධානය | 01 |
| 05 | යහපාලනය හා නායකත්වය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 06 |
| 06 | පශ්චාත් උපාධිය | කැළණිය විශ්වවිද්‍යාලය | 01 |
| 07 | එලදායි අභ්‍යන්තර විගනනය | නිපුනතා සංවර්ධන පදනම් ආයතනය | 01 |
| 08 | මධ්‍ය වාර්ශික ඇගයුම් පිළිබඳප්‍රායෝගික බාවිතය | නිපුනතා සංවර්ධන පදනම් ආයතනය | 01 |
| 09 | පිළිගැනිමේ නිලධාරින්ගේ හා දුරකථන ක්‍රියා කරුවන්ගේ හැකියා සංවර්ධනය කිරීමේ වැඩසටහන | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 |
| 10 | AAT ශ්‍රී ලංකා සමුළුව | ශ්‍රී ලංකා ගණකාධිකාරි තාක්ෂණික ආයතනය | 01 |

# විදේශීය පුහුණු - 2013

| | Country | Programme | No of Officers |
|---|---|---|---|
| 01 | Korea | Knowledge Sharing Programme - Interim Report Workshop | 01 |
| 02 | Singapore | Advanced Regional Workshop on Government Procurement for WTO Members and Observers in Asia and the pacific | 01 |
| 03 | India | Pan-Commonwealth Capacity Building Workshop for SACOs Engendering Access to Financial Services | 01 |
| 04 | Korea | SAARC Special Training Programme – Trade Promotion | 01 |
| 05 | China | Seminar on Import & Export Commodity Quality Inspection for Developing Countries | 01 |
| 06 | India | International Training in Human Resource Planning and Development | 01 |
| 07 | Seoul Korea | Knowledge Sharing Programme-2013 Capacity Building Workshop | 01 |
| 08 | India | Human Resources Development and Entrepreneurship Education Training | 01 |
| 09 | Korea | Training on Economic Development Strategy (Sri Lanka) | 02 |
| 10 | China | Seminar on Industrial Security | 02 |
| 11 | India | International Training Programme on Leadership Development | 01 |
| 12 | Japan | Training Course on IP Management and the Formulation and Implementation of Results-Based IP Office Plans | 01 |
| 13 | Maldives | WIPO Regional Workshop on Building Respect for Intellectual Property | 01 |

| | | | |
|---|---|---|---|
| **14** | **Qatar** | Training Course for Representatives of National Authorities of State Parties in Asia involved in fulfilling Article VI declaration requirements of the Chemical Weapons Convention | 01 |
| **15** | **Korea** | Sri Lankan Delegations – SME Policy Development Exposure visit to South Korea | 02 |
| **16** | **Austria** | Global Executive Programme - The Future of Manufacturing | 01 |
| **17** | **India** | Official Visit | 01 |
| **18** | **Pakistan** | Commerce Secretary level meeting between Pakistan and Sri Lanka | 01 |
| **19** | **Thailand** | First Training Session for the tars force of Chemical Accident Prevention and Preparedness programme for SL | 01 |
| **20** | **India** | Investment Trade and CEO forum | 01 |
| **21** | **China** | 1st China South Asia Exposition and 21st Kunming Import and Export Fair | 01 |
| **22** | **Nepal** | SAARC Dissemination Workshop on Energy Conservation potential | 01 |
| **23** | **China** | Second advanced assistant and Protection Course on Assistance and Protection | 01 |
| **24** | **Australia** | Australian Leader ship [Awards (ALA) Fellowship Training Program for Leadership Development of Senior Public officers | 01 |
| **25** | **China** | Establishment of Two Joint Working Groups On Trade and Economic Cooperation Between Sri Lanka & China | 01 |
| **26** | **China** | Mega Promotional Campaign | 01 |
| **27** | **Thailand** | Asia-Pacific Regional Workshop on the Development & Implementation of National Copy Rights and Strategies | 01 |
| **28** | **Pakistan** | Third International Assistance and Protection Course | 01 |
| **29** | **Switzerland** | Swiss Laboratory Curse V, Spiez | 01 |
| **30** | **Korea** | Workshop on Innovative Case Studies on Sustainable Development | 01 |
| **31** | **Netherlands** | Fifteenth Annual Meeting of National Authority | 01 |

# මූල්‍ය ප්‍රගතිය

## ශීර්ෂ 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
## පුනරාවර්තන වියදම - 2013 දෙසැම්බර් 31 දක්වා

| වැඩසටහන සහ ව්‍යාපෘතිය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| | | | |
| **01 මෙහෙයුම් වැඩසටහන්** | | | |
| **01.** **අමාත්‍ය කාර්යාලය** | පුද්ගල පඩිනඩි | 10,000,000 | 9,796,837 |
| | ගමන් වියදම් | 8,620,000 | 8,012,159 |
| | සැපයීම් | 8,950,000 | 8,891,216 |
| | නඩත්තු වියදම් | 6,850,000 | 6,574,804 |
| | ගිවිසුම්ගත සේවා | 6,420,000 | 5,796,704 |
| | අනෙකුත් පුනරාවර්තන වියදම් | 5,000 | 0 |
| | **උප එකතුව** | **40,845,000** | **39,071,720** |
| | | | |
| **02.** **පරිපාලනය හා ආයතනික සේවා** | පුද්ගල පඩිනඩි | 51,100,000 | 50,884,157 |
| | ගමන් වියදම් | 3,700,000 | 3,680,301 |
| | සැපයීම් | 8,942,000 | 8,893,360 |
| | නඩත්තු වියදම් | 9,432,000 | 9,389,814 |
| | ගිවිසුම්ගත සේවා | 25,200,000 | 25,042,575 |
| | මාරු කිරීම් | 7,456,000 | 7,051,333 |
| | **උප එකතුව** | **105,830,000** | **104,941,540** |
| | | | |
| | **එකතුව - මෙහෙයුම් වැඩසටහන** | **146,675,000** | **144,013,260** |
| | | | |
| **02.** **සංවර්ධන වැඩසටහන** | | | |
| **03.** **කාර්මික සංවර්ධනය** | පුද්ගල පඩිනඩි | 126,790,000 | 125,810,823 |
| | ගමන් වියදම් | 3,700,000 | 2,883,000 |
| | සැපයීම් | 4,600,000 | 4,464,268 |
| | නඩත්තු වියදම් | 4,070,000 | 3,917,290 |
| | ගිවිසුම්ගත සේවා | 7,630,000 | 7,085,220 |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 1,430,000 | 1,420,934 |
| | **උප එකතුව** | **148,220,000** | **145,581,535** |
| | | | |
| | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 10,000,000 | 0 |
| | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 26,000,000 | 21,879,000 |
| | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 266,000,000 | 254,950,000 |
| | **උප එකතුව** | **302,000,000** | **276,829,000** |
| | | | |
| | **එකතුව - සංවර්ධන වැඩසටහන** | **450,220,000** | **422,410,535** |
| | **එකතුව- පුනරාවර්තන වියදම්** | **596,895,000** | **566,423,795** |

# ප්‍රාග්ධන වියදම - 2013දෙසැම්බර් 31 දක්වා

| වැඩසටහන සහ ව්‍යාපෘතිය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| | | | |
| **01 මෙහෙයුම් වැඩසටහන්** | | | |
| **01. අමාත්‍ය කාර්යාලය** | මූලධන වත්කම් වල පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | 6,260,000 | 5,608,999 |
| | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 12,500,000 | 11,546,242 |
| | **උප එකතුව** | **18,760,000** | **17,155,241** |
| | | | |
| **02. සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා** | මූලධන වත්කම් වල පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | 5,200,000 | 5,129,049 |
| | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 6,770,000 | 6,267,542 |
| | පුහුණු සහ හැකියා වර්ධනය | 1,000,000 | 79,379 |
| | | | |
| | **උප එකතුව** | **12,970,000** | **11,475,970** |
| | | | |
| | **එකතුව - මෙහෙයුම් වැඩසටහන** | **31,730,000** | **28,631,211** |
| **02. සංවර්ධන වැඩසටහන** | | | |
| **03. කාර්මික සංවර්ධන වැඩසටහන්** | මූලධන වත්කම් වල පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | 5,075,000 | 4,332,906 |
| | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 3,400,000 | 2,882,493 |
| | පුහුණු සහ හැකියා වර්ධනය | 1,000,000 | 169,688 |
| | | | |
| | **උප එකතුව** | **9,475,000** | **7,385,087** |
| | | | |
| | කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන | 300,000,000 | 162,223,982 |
| | ආංශික සංවර්ධන වැඩසටහන | 225,000,000 | 58,745,195 |
| | *පාවහන් නිිෂ්පාදන පුහුණු පාසල | 50,000,000 | 14,177,969 |
| | * සම් හා සම් භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත ව්‍යාපෘතිය | 90,000,000 | 2,821,876 |
| | * ඖෂධ නිෂ්පාදන කර්මාන්තය සඳහා වූ විශ්ලේෂණාත්මක විද්‍යාගාරය | 9,700,000 | 20,000,000 |
| | * විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය සඳහා තාක්ෂණික පෙරවැඩුම් මධ්‍යස්ථානය | 6,000,000 | 0 |
| | * කර්මාන්ත අපද්‍රව්‍ය කළමනාකරණය හා අපද්‍රව්‍ය හුවමාරු වැඩසටහන | 5,000,000 | 0 |

| | | | |
|---|---|---|---|
| | * කොන්ක්‍රීට් සහ සිමෙන්ති පාදක නිෂ්පාදන වර්ධනය කිරීම | 5,000,000 | 0 |
| | * අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති | 28,300,000 | 11,002,203 |
| | * දැයට කිරුළ ප්‍රදර්ශනය | 10,000,000 | 7,714,575 |
| | * කොහු කර්මාන්තය සඳහා පරීක්ෂණ විද්‍යාගාරයක් ඉදිකිරීම | 5,000,000 | 0 |
| | * කාර්මික නිෂ්පාදන ආයතන සඳහා බලශක්ති සූක්ෂම තාක්ෂණය හඳුන්වා දීම | 10,000,000 | 1,028,571 |
| | * පෝසිලේන් කර්මාන්තය සඳහා බෝල මැටි, කැඔලින් හා අනෙකුත් ඛනිජ නිධි හඳුනා ගැනීම | 6,000,000 | 2,000,000 |
| | අත්‍යන්ත්‍ර සහ ඇඟළුම් කර්මාන්තය | 90,000,000 | 73,954,245 |
| | උණ බමබු සැකසීමේ ව්‍යාපාතිය | 30,000,000 | 0 |
| | පාරිසරික ගැටළු විසඳීමේ ණය යෝජනා ක්‍රමය 11 සහ සුළු හා කුඩා කර්මාන්ත නංවාලීමේ ණය යෝජනා ක්‍රමය 111 ව්‍යාපෘතීන් | 400,000,000 | 186,554,529 |
| | **උප එකතුව - කාර්මික සංවර්ධන වැඩසටහන්** | **1,045,000,000** | **481,477,951** |
| | **එකතුව - සංවර්ධන වැඩසටහන** | **1,054,475,000** | **488,863,038** |
| | **එකතුව - මෙහෙයුම් වැඩසටහන් සහ සංවර්ධන වැඩසටහන්** | **1,086,205,000** | **517,494,249** |

| වැඩසටහන සහ ව්‍යාපෘතිය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| **5. රාජ්‍ය ආයතන** | | | |
| **01. අමාත්‍ය කාර්යාලය** | ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 29,000,000 | 20,050,000 |
| | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 31,100,000 | 14,715,000 |
| | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 540,500,000 | 229,000,000 |
| | | | |
| | **උප එකතුව** | **600,600,000** | **263,765,000** |
| | | | |
| | **එකතුව - ප්‍රාග්ධන වියදම්** | | |
| | **(මෙහෙයුම් වැඩසටහන්, සංවර්ධන වැඩසටහන් සහ රාජ්‍ය ආයතන)** | **1,686,805,000** | **781,259,249** |
| | | | |
| | **මුළු එකතුව (ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම්)** | **2,283,700,000** | **1,347,683,043** |